# පොල් සංවර්ධන අධිකාරිය

## වාර්ෂික වාර්තාව

## 2012

# පොල් සංවර්ධන අධිකාරිය

## අපගේ දර්ශනය



"පොල් කර්මාන්තය දල දේශීය
නිෂ්පාදනය සඳහා
වැවිලි ක්ෂේත්‍රයෙන් ඉහළතම
දයකත්වය ලබා දෙන්නා වීම සහ
නිෂ්පාදන අලෙවි විවිධාංගීකරණයේදී
ගෝලීය නායකයා වීම."

## අපගේ මෙහෙවර

ගෘහස්ත පරිභෝජනය සහ කර්මාන්තය සඳහා
පොල් සහ පොල් නිෂ්පාදන සැපයුම තහවුරු
කිරිම මඟින්,
පොල් කර්මාන්තය දීර්ඝ කාලින වාණිජ්‍යමය
ඵලදායිතාවය, තිරසාරත්වය හා ජාතික ආර්ථිකය
සඳහා ඉහළ දයකත්වයක් කරා
ගෙන ඒම සඳහා පහසුකම් සැපයීම.

# හැඳින්වීම

සමස්ත පොල් කර්මාන්තයේ සංවර්ධනය සඳහා 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද ප්‍රධානතම ව්‍යවස්ථාපිත ආයතනය පොල් සංවර්ධන අධිකාරිය වේ.පොල් සංවර්ධන පනතේ විධිවිධාන පරිදි අධිකාරිය සතු කාර්යයන් පුළුල් අන්දමින් පහතින් දක්වා ඇත.

- පොල් කර්මාන්තයේ සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති සකස් කිරීමේදී හා ඒවා ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමුඛතා තීරණය කිරීමේදී අමාත්‍යවරයාට සහාය දැක්වීම.
- එසේ නිර්ණය කරනු ලබන සංවර්ධන ප්‍රමුඛතාවලට අනුකූල වන ලෙස ව්‍යාපෘති සහ යෝජනා ක්‍රම සැකසීමේදී සහාය දැක්වීම හා එම ව්‍යාපෘති හා යෝජනා සකස් කිරීම.
- එසේ සකස් කරනු ලබන ව්‍යාපෘති සහ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී සහාය දැක්වීමට එම ව්‍යාපෘති සහ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- පොල් සංවර්ධන පනත යටතේ අමාත්‍යවරයා විසින් පිහිටුවන ලබන මණ්ඩලවල කටයුතු ඒකාබද්ධ කිරීම.

ඉහත සඳහන් කාර්යයන්වලට අමතරව කර්මාන්ත පිරිසැකසුම් පොල් සහ පොල් නිෂ්පාදිතයන් දේශීය අපනයන අලෙවිකරණය සම්බන්ධයෙන් සියලු කටයුතු සංවර්ධනය කිරීම සහ අධීක්ෂණය පිළිබඳ වගකීම පැවරීමෙන් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය මඟින් පොල් සංවර්ධන පනතේ 20 වෙනි වගන්තියේ නිශ්චිත වශයෙන් දැක්වෙන පහත සඳහන් කාර්යයන්ද අධිකාරිය වෙත පවරා ඇත.

- පොල් ආශ්‍රිත නිෂ්පාදන හා නිෂ්පාදන ක්‍රම විධිමත් කිරීමේ සහ ප්‍රවර්ධනයේදී සහාය වීම.
- පොල් නිෂ්පාදිතයන් පිරි සැකසීමේදී නව ශිල්පීය ක්‍රම ප්‍රවර්ධනය කිරීම.
- ප්‍රවර්ධනය හා නවීකරණය, මෙහෙයවීම සහ පොල් නිෂ්පාදිතයන් නිෂ්පාදනය කරන ආයතනවල කාර්යක්ෂමතාවය වැඩිකිරීමට සහාය වීම.
- ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන පොල් නිෂ්පාදනයන්හි ගුණාත්මක බව පිළිබඳ ප්‍රමිතීන් පවත්වාගෙන යාම සහ නියම කිරීම.
- පොල් නිෂ්පාදිතයන් මිලදී ගැනීම, විකිණීම හා එම නිෂ්පාදිතයන් මිලදී ගැනීම හා විකිණීම විධිමත් කිරීම සහ සාමාන්‍යයෙන් පොල් නිෂ්පාදිතයන් සඳහා ද විශේෂයෙන් කුඩා පොල් වතු හිමියන්ගේ පොල් නිෂ්පාදිතයන් සඳහා ද අවම හා උපරිම වශයෙන් මිල ක්‍රමයක් සකස් කිරීමේදී හෝ ක්‍රියාත්මක කිරීමේදී සහාය දැක්වීම.
- පොල් නිෂ්පාදන ආනයනය, අපනයනය කිරීම හා ආනයන අපනයන මිල විධිමත් කිරීම.

- ප්‍රදර්ශන හා පොළවල් සංවිධානය කිරීමෙන්ද ඒවාට සහාය දීමෙන් හා සහභාගීවීමෙන් ද ඒ සඳහා අවශ්‍ය වෙන යම් ක්‍රම අනුගමනය කිරීමෙන්ද, අලෙවි කුටි සහ නියෝජිත ආයතන පිහිටුවා ඒවා පවත්වාගෙන යාමෙන්ද, අධීක්ෂණය කිරීමෙන් සහ සහාය දැක්වීමෙන්ද, ප්‍රචාරණය මඟින්ද, ප්‍රවර්ධන වැඩකටයුතු ආරම්භ කිරීමෙන්ද, ඒ සඳහා මුදල් සැපයීමෙන් සහ සහාය දැක්වීමෙන්ද, ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත නිෂ්පාදිතයන් සඳහා ඉල්ලුම ඇති කිරීම, නිෂ්පාදිතයන් ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.

- ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත පොල් නිෂ්පාදිතයන් අලෙවිකරණය සහ ප්‍රවාහනය සම්බන්ධයෙන් සියලුම අංශ පිළිබඳව අලෙවි පර්යේෂණ සිදු කිරීම.

- පොල් නිෂ්පාදිතයන් වෙළඳාම හෝ නිෂ්පාදනය කරන ආයතන හා පොල් වැවිලි පිළිබඳව කළමනාකරණය සහ අයිතිය සම්බන්ධයෙන් වූ සමූපකාර හා සාමූහිකකම වැඩිදියුණු කිරීම.

- කප්රුක පුරවර වැඩසටහන යටතේ පොල් හා පොල් ආශ්‍රිත අමුද්‍රව්‍ය එක්රැස් කර කර්මාන්ත වෙත යොමු කිරීම හා දැනට කර්මාන්ත ව්‍යාපතියක් නොමැති ප්‍රදේශවලට කර්මාන්ත හඳුන්වාදීම හා කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.

1980 දශකයේ අවසාන භාගයේදී පොල් වෙළඳාම පිළිබඳ සීමාවන් ලිහිල් කිරීමෙන් අනතුරුව පොල් අපනයන අංශය පිළිබඳව අවධානය කිරීමකින් යුතුව පිරිසැකසුම් හා අලෙවිකරණ අංශ සංවර්ධනය කර ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම යන ප්‍රධාන කටයුතුවලට අධිකාරියේ අවධානය යොමු වී ඇත. නිෂ්පාදිතයන්වල ගුණාත්මක බව පිළිබඳ ප්‍රමිතීන් පවත්වා ගැනීම සම්බන්ධයෙන් අදාළ වන කාර්යයන්ට පමණක් පාලන කටයතු සීමා වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය අධිකාරියේ පාලක මණ්ඩලය වන අතර පොල් සංවර්ධන පනතේ විධි විධාන සහ එම පනතේ සංශෝධන අනුව සාමාජිකයින් 11 දෙනෙකුගෙන් එම අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. මෙහි සියලුම සාමාජිකයන් පත්කරනු ලබන්නේ අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු අධිකාරියේ සභාපති ලෙස පත් කරනු ලැබේ. මෙම සාමාජිකයන්ගේ නිල කාලය වසර 03ක් වන අතර නැවත වරක් පත් කිරීම සඳහා ද ඔවුහු සුදුසුකම් ලබති.

අමාත්‍යාංශය විසින් පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රතිපත්ති හඳුනාගෙන සකස් කිරීමේදී ඒ සඳහා සහාය දැක්වීමේ කාර්යයන් ඉටු කිරීමට අමතරව පොල් කර්මාන්තයේ පිරිසැකසුම් සහ අලෙවිකරණ අංශයන් සංවර්ධනය කිරීමේදී, අධීක්ෂණය කිරීමේදී මෙහෙයුම් කාර්යභාරය ක්‍රියාත්මක කිරීම උදෙසා කාර්යමය වශයෙන් පොල් සංවර්ධන අධිකාරියේ සැකසුම් සංවර්ධන අංශය, තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය, අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය, මුදල් අංශය සහ පාලන යනුවෙන් ක්‍රියාකාරී අංශ 5 කින් සමන්විත වන අතර එක් එක් අංශය භාරව අධ්‍යක්ෂවරයෙක් කටයුතු කරයි. මෙම කාර්යයන් ඉටුකරගැනීමේදී ඉංජිනේරු අංශය සහ අභ්‍යන්තර විගණන අංශය ඉහත අංශවලට සහාය වේ.

අධ්‍යක්ෂ ජනරාල් ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කරන අතර අධිකාරියේ වැඩකටයුතු මෙහෙයවීම,අධීක්ෂණය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කරනු ලබන ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි.

2012 වර්ෂය අවසානයේදී  සේවකයින් 121 දෙනෙකුගෙන් සමන්විත සම්පූර්ණ කාර්යය මණ්ඩලයක් අධිකාරියේ සේවයේ යෙදී සිටි අතර එම සේවක සංඛ්‍යාවෙන් 13 දෙනෙකු කළමනාකරණ මට්ටමේ අය වූහ.

# සභාපතිතුමාගේ සමාලෝචනය - 2012

ලෝක පොල් වගාවේ සිව්වන හිමිකරුවා වන ශ්‍රී ලංකාවේ ඇති පොල් වගාබිම් ප්‍රමාණය හෙක්ටයාර් 394,836 ක් (ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව - 2002) පමණ වන අතර එය රටේ මුළු වගාකළ බිම් ප්‍රමාණයෙන් 20% ක් පමණ වේ. මුළු පොල් වගා කළ බිම් ප්‍රමාණයෙන් 82% ක්, පමණ හෙක්ටයාර 8 ට අඩු සුළු පරිමාණ වගාකරුවන්ගේ පොල් ඉඩම් නියෝජනය කරයි. පොල්, මිනිසාගේ සමාජ, ආර්ථික රටාව කෙරෙහි විශාල බැඳියාවක් ඇති අතර පොල් ගසේ නිෂ්පාදන විවිධ කාර්යයන් සඳහා යොදා ගනී.

ශ්‍රී ලංකාවේ වාර්ෂික පොල් ඵලදාව ගෙඩි මිලියන 2900කට ආසන්න අගයක පවතින අතර ඉන් 65%කට ආසන්න ප්‍රමාණයක් වැය වූයේ (2012 වසර සඳහා) දේශීය ගෙඩි පොල් පරිභෝජනය සඳහාය. ඉතිරි 35% ක් පමණ වන ගෙඩි පොල් ප්‍රමාණය පොල් ආශ්‍රිත අනෙකුත් සියලු කර්මාන්ත සඳහා (පොල් තෙල්, දිසිඳි තෙල්, කොප්පරා, පොල් කිරි, පොල් කිරම, පොල් කිරිපිටි හා ගෙඩි පොල් අපනයනය) බෙදී යයි. එමෙන්ම පොල් කර්මාන්ත ක්ෂේත්‍රයෙන් ශ්‍රී ලංකාව ලබන අපනයන ආදායම ඉහළ අගයක් ගන්නා අතර 2012 වසරේදී එය රු. බිලියන 47කට ආසන්න විය. එමෙන්ම පොල් කර්මාන්ත ක්ෂේත්‍රයෙන් දළ දේශීය නිෂ්පාදිතයට එකතුවන වටිනාකම 1.4%ට ආසන්න වන අතර පොල් හා ඒ ආශ්‍රිත කර්මාන්ත වලින් සෘජු හා වක්‍ර රැකියාලාභීන් විශාල ප්‍රමාණයක් සිය ජීවනෝපාය සලසා ගනී.

එමෙන්ම 2013 වසරේ පොල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයන ආදායම රු.බිලියන 50ක් පමණවේ යැයි බලාපොරොත්තු වන අතර පොල් පරිභෝජනයෙන් ජනතාවගේ ආහාරයට අවශ්‍ය කැලරි ප්‍රමාණයෙන් 15%ක් ද ප්‍රෝටීන් ප්‍රමාණයෙන් 5% ක් හා මේද ප්‍රමාණයෙන් 70%ක් පමණ ද ලබා ගනී.

පොල් වගාවේ හා පොල් කර්මාන්තයේ වර්ධනය උදෙසා අතිගරු ජනාධිපතිතුමා විසින් 2010 වසරේ පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන යනුවෙන් වෙනම ම කැබිනට් අමාත්‍යාංශයක් ඇති කළ අතර ඒ තුළින් පොල් ක්ෂේත්‍රයේ වර්ධනයක් අපේක්ෂා කෙරිණ.

නව කැබිනට් අමාත්‍යාංශය පිහිටුවීමත් සමඟ පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍ය ගරු ජගත් පුෂ්පකුමාර මැතිතුමාගේ සංකල්පයකට අනුව ආරම්භ වූ "කප්රුක පුරවර" වැඩසටහන පොල් සංවර්ධන ක්ෂේත්‍රය නව මාවතකට යොමු කිරීමට සමත් විය. "කප්රුක නිපැයුම් පියස", පුහුණු වැඩසටහන්, නූතන තාක්ෂණික දැනුම ලබා දීම, "කප්රුක දිරිය" ණය යෝජනා ක්‍රමය, කප්රුක ගම්මාන පිහිටුවීම, යහපත් නිෂ්පාදන ක්‍රම (GMP) තුළින් උසස් පොල් නිෂ්පාදන ලබා ගැනීම, දැනුවත් කිරීමේ වැඩසටහන් ආදී කටයුතු රාශියක් කප්රුක පුරවර වැඩසටහන හරහා මේ වන විට ක්‍රියාත්මකවේ.

එමෙන්ම පොල් අපනයනකරුවන් ලියාපදිංචි කිරීම, දිවයිනේ විවිධ ප්‍රදේශවල පවත්වනු ලබන කෘෂිකර්ම, අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගී වීම, ගෙඩි පොල් හා කොප්පරා වෙන්දේසි පැවැත්වීම, පොල් නිෂ්පාදනවල උසස් ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රමිති සහතික නිකුත් කිරීම ආදී විශාල කාර්යයභාරයක් පොල් කර්මාන්තක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා මේ වන විට පොල් සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාවට නංවා ඇත.

තවද ජාත්‍යන්තර ප්‍රදර්ශන සඳහා සහභාගී වෙමින් ශ්‍රී ලාංකික පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා පවතින විදේශ වෙළඳපොළ තවදුරටත් පුළුල් කර ගැනීම උදෙසා සෑම වසරකම අප ක්‍රියාකරන අතර ඒ තුළින් ජාතික ආර්ථිකයට පොල් කර්මාන්ත ක්ෂේත්‍රයෙන් ලබා දෙන දායකත්වය වසරින් වසර ඉහළ නැංවීම අපගේ අරමුණයි.

වැවිලි කර්මාන්ත අතර පොල් කර්මාන්ත ක්ෂේත්‍රයෙන් ඉහළම දායකත්වයක් ලබා දීමේ පොල් සංවර්ධන අධිකාරියේ දර්ශනයට අනුව යමින් පොල් කර්මාන්ත කරුවන් හට අවශ්‍ය සියලු පහසුකම් හා උපදෙස් ලබා දෙමින් ඉදිරි වසරවල පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ විශාල දියුණුවක් ඇති කිරීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය කැපවී ක්‍රියා කරයි. ඒ සඳහා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍ය ගරු ජගත් පුෂ්පකුමාර මැතිතුමාගෙන් හා අමාත්‍යාංශ ලේකම් ගරු නිහාල් සෝමවීර මැතිතුමාගෙන් ලැබෙන උපදෙස් හා මඟ පෙන්වීම පැසසිය යුත්තකි.



නීතීඥ සුගත් හඳුන්ගේ
සභාපති
පොල් සංවර්ධන අධිකාරිය

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ සමාලෝචනය - 2012

අතීතයේ පටන් ශ්‍රී ලාංකීය ජනතාව "කප්රුක" ලෙස හඳුන්වා දුන් පොල් ගස, අද වන විට නූතන ලෝකයාද එය සැබෑම කප්රුකක් බවට හඳුනාගෙන ඇත. පොල් ගසේ කිසිදු කොටසක් අපතේ නොයවා ප්‍රයෝජනයට ගැනීම නිසා තරඟකාරී ජාත්‍යන්තර වෙළඳපොල ජයගැනීම සඳහාද වර්තමානයේ පොල් ආශ්‍රිත කර්මාන්තකරුවා බෙහෙවින් දායකවී ඇත.

පිබිදෙන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන්නාවූ "මහින්ද චින්තන" වැඩසටහනට සමගාමීව පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ මඟ පෙන්වීම මත පොල් සංවර්ධන අධිකාරියේ මෙහෙයවීමෙන් "කප්රුක නිපැයුම් පියස" ස්ථාපිත කිරීම සුවිශේෂී සන්ධිස්ථානයකි. ඒ තුළින් අතහැර දමා තිබූ ගොඩනැඟිලි ප්‍රයෝජනයට ගනිමින් ග්‍රාමීය මට්ටමේ රැකියා අවස්ථා උත්පාදනය, පුහුණු ආයතන ස්ථාපිත කිරීම හා ගම තුළ නව ආදායම් මාර්ග උත්පාදනය කිරීමට දායකත්වය ලබාදීමට පොල් සංවර්ධන අධිකාරියට අවස්ථාව උදාවිය.

එමෙන්ම ඉවතලන ලද පොල් කටු, පොල් ඉරටු හා පොල් ලෙලි වලට ආර්ථික වටිනාකමක් දෙමින් එම ද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීමත් සමගම ගම් මට්ටමේ ජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීමට අවස්ථාව උදාවූ අතර ඉවතලන පොල් කටු එක්රැස් කිරීමේ වැඩසටහන හරහා පරිසර දූෂණය අවම කිරීම, ඩෙංගු වැනි මාරාන්තික රෝග පාලනය කිරීම ආදී ජාතික වැඩසටහන් සඳහාද අධිකාරියේ දායකත්වය ලබාදීමට හැකිවිය.

පොල් හා පොල් ආශ්‍රිත පවත්නා කර්මාන්ත සංවර්ධනය කිරීම, කර්මාන්තය වෙත අලුතින් පිවිසෙන ව්‍යවසායකයින්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම යනාදිය සඳහා ආරම්භ කළ "කප්රුක නිපැයුම් දිරිය" ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අප හා අත්වැල් බැඳගත් මහජන බැංකුව වෙත මාගේ ස්තූතිය පුදකරන අතර මේ වන විට එය සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. එමෙන්ම වෙළඳපොල අවශ්‍යතාවයන්ට අනුකූල ගුණාත්මක නිෂ්පාදන සිදු කිරීමට කර්මාන්තකරුවන් යොමු කිරීමේ අරමුණින් යහපත් නිෂ්පාදන ක්‍රමවේද (GMP) සහතිකකරණය පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් වෙත හඳුන්වාදීමට සමාලෝචිත වර්ෂයේදී පියවර ගන්නා ලදී. ඒ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ලද දායකත්වයද සිහිපත් කරන අතර කර්මාන්තකරුවන්ද මේ සම්බන්ධයෙන් උනන්දුවීම සතුටට කරුණකි.

වර්තමාන විදේශීය වෙළඳපොල තුළ විශාල ලෙස ඉල්ලුමක් පවතින සක්‍රීය කාබන් හෙවත් පොල් කටු අඟුරු පරිසර හිතකාමී ලෙස නිපදවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී නව ක්‍රමවේද අත්හදා බැලූ අතර 2013 වර්ෂයේදී මේ සඳහා වැඩි දායකත්වයක් ලබාදෙමින් නව තාක්ෂණය කර්මාන්තකරුවන් වෙත හඳුන්වාදීමට අපේක්ෂා කෙරේ.

2012 වර්ෂය තුළ අධිකාරිය ලත් සුවිශේෂී ජයග්‍රහණයන් අතර පොල්තෙල් පරීක්ෂණ ක්‍රමවේදයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් පිරිනමන ISO 17025 තත්ව සහතිකය මෙම අධිකාරියේ තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශය විසින් හිමිකර ගැනීම අගයමි.

2011 වසරට සාපේක්ෂව 2012 වසරේ වැඩි ප්‍රගතියක් අත්කරගැනීමට හැකිවූවද; පැවති සේවක හිඟය, පුහුණු ශ්‍රමික ගැටළු, සේවක අතෘප්තිය වැනි මානව සම්පත් කළමනාකරණයේ අභියෝග හමුවේ මෙවන් ප්‍රගතියක් කරා ආයතනය මෙහෙයවීමට හැකිවීම සුවිශේෂී කරුණකි. රාජ්‍ය සේවයේ විවිධ තනතුරුවල අත්දැකීම් ලබාතිබුණද, අර්ධ රාජ්‍යසේවයේ රාජකාරි කළ පළමු වසර තුළ මෙවන් ප්‍රගතියක් අත්කර ගැනීමට දායකත්වය ලබාදීමට හැකිවීම මා ලද භාග්‍යයක් කොට සළකමි. මේ සඳහා මා හා අත්වැල් බැඳගත් සහෝදර කාර්යය මණ්ඩලයද ඇගයීමට කැමැත්තෙමි.

නිරතුරුවම අප පසුපස සිටිමින් අප මෙහෙයවනු ලබන පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ගරු අමාත්‍යතුමන් හා අමාත්‍යාංශ ලේකම්තුමන් ස්තූති පූර්වකව සිහිපත් කරන අතර "කප්රුක පුරවර" සංකල්පය සාක්ෂාත් කරගැනීම සඳහා අධිකාරිය වෙත විශාල දායකත්වයක් ලබාදුන් උපදේශක අරුණ ගුණවර්ධන මහතාවද සිහිපත් කරනුයේ කෘතඥතා පූර්වකවය.

එළඹෙන 2013 වසර තුළ මෙම වසරටත් වඩා වැඩි දායකත්වයක් ලබාදෙමින් අධිකාරිය විසින් දියත් කිරීමට සැලසුම් කර ඇති කප්රුක පුරවර වැඩසටහන් යටතේ ගෘහස්ථ කර්මාන්තකරුවාගේ ආර්ථිකය ඉහළ නැංවීම මෙන්ම පොල් කර්මාන්තයේ නව යුගයක් කරා අධිකාරිය මෙහෙයවීමට දායකත්වය ලබාදීම මාගේ අපේක්ෂාවයි.

එන්. එන්. සී. කේ. බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්
පොල් සංවර්ධන අධිකාරිය


# 2012 වර්ෂයේ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය

| | | |
|---|---|---|
| 1. සුගත් හඳුන්ගේ මහතා | - | සභාපති |
| 2. ජී. නන්දසේන මහතා | - | මණ්ඩලීය සභික |
| 3. ඩබ්. පී. කේ. ඩබ්. වැලිවත්ත මහතා | - | මණ්ඩලීය සභික |
| 4. එච්. ජී. සිරිසේන මහතා | - | මණ්ඩලීය සභික |
| 5. උපාලි හෙට්ටිගේ මහතා | - | මණ්ඩලීය සභික |
| 6. වයි. එම්. ජගත් මංජුල යාපා මහතා | - | මණ්ඩලීය සභික |
| 7. සංජීව ධර්මේන්ද්‍ර කුරේ මහතා | - | මණ්ඩලීය සභික |
| 8. ආර්. එස්. වීරමන් මහතා | - | මණ්ඩලීය සභික |
| 9. මහාචාර්ය එච්. පී. එම්. ගුණසේන මහතා | - | නිරීක්ෂක සාමාජික |
| 10. එස්. එම්. රාජපක්ෂ මහත්මිය | - | මණ්ඩලීය සභික<br>(භාණ්ඩාගාර නියෝජිත) |
| 11. ජානක ධර්මකීර්ති මහතා | - | මණ්ඩලීය සභික<br>(අමාත්‍යාංශ නියෝජිත) (2012 මැයි දක්වා) |
| 12. ඩී. එම්. එල්. බණ්ඩාරනායක මහතා | - | මණ්ඩලීය සභික<br>(අමාත්‍යාංශ නියෝජිත) (2012 ජුනි සිට) |

# සභාපති ඇතුළු අංශ ප්‍රධානීන්

| | | |
|---|---|---|
| 1. | සුගත් හඳුන්ගේ මහතා | - සභාපති |
| 2. | එන්. එන්. සී. කේ. බණ්ඩාර මහත්මිය | - අධ්‍යක්ෂ ජනරාල් |
| 3. | ඒ. ටී. රණසිංහ මහතා | - ඉංජිනේරු |
| 4. | එස්. එස්. පුරසිංහ මහත්මිය | - අධ්‍යක්ෂිකා (තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ) |
| 5. | ආර්. ජේ. ඒ. ෆොන්සේකා මහතා | - අධ්‍යක්ෂ (අලෙවි සංවර්ධන හා පර්යේෂණ) |
| 6. | එස්. එස්. රාජකරුණා මහත්මිය | - අධ්‍යක්ෂිකා (පරිපාලන) / අධ්‍යක්ෂ මණ්ඩලීය ලේකම් |
| 7. | එම්. පී. සන්ධ්‍යා කාන්ති මහත්මිය | - අධ්‍යක්ෂිකා (මුදල්) |
| 8. | ඩබ්. එල්. ඩබ්. කේ. ලියනගේ මහතා | - වැ. බ. අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන) |
| 9. | එන්. එම්. ආරියදාස මහතා | - අභ්‍යන්තර විගණක |

# 2012.12.31 දිනට සංවිධාන ව්‍යුහය




**කෙටි යෙදුම්**

1. ජ්‍යෙෂ්ඨ කළ. - ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම
2. ස./නි. අධ්‍යක්ෂ - සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ
3. කළ.මට්. - කළමනාකරණ මට්ටම
4. අභ. වි. නිලධාරි - අභ්‍යන්තර විගණන නිලධාරි
5. පරි. නිලධාරි - පරිපාලන නිලධාරි
6. තො. නිලධාරි - තොරතුරු නිලධාරි
7. පර්. නිලධාරි - පර්යේෂණ නිලධාරි
8. කණි.කළ - කණිෂ්ඨ කළමනාකරණ මට්ටම
9. අලෙවි.සං. හා පර්. - අලෙවි සංවර්ධන හා පර්යේෂණ
10. තත්.පා.හා.තත්.ආර. - තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ

# 2012 වසරේ වැදගත් සිදුවීම්

- කෙඳි ආශ්‍රිත කර්මාන්තය සැලකීමේදී පසුගිය වසරවලට වඩා අඹරන ලද කොහු කෙඳි නිෂ්පාදනය හා අපනයනය 68% ක ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. තවද, කොහු ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදන සඳහා ධනාත්මක ප්‍රගතියක් පසුගිය වසරට සාපේක්ෂව අත්කර ගැනීමට හැකිවිය. ඒ අතර කොහු ලණු, කඹ හා තවාසි බුරුසු නිෂ්පාදන ප්‍රමුඛතාවයක් ගන්නා ලදී.

- කප්රුක නිපැයුම් පියස වැඩ සටහන යටතේ නිපැයුම් මධ්‍යස්ථාන 05 ක් දිවයින පුරා ඉදිකිරීම නිසා ප්‍රාදේශීය වශයෙන් භාවිතයට ගැනීමෙන් ඉවත් වී තිබූ පොල්ලෙලි කර්මාන්තය වෙත එක්වීම නිසා තවාෂි බුරුසු නිෂ්පාදන වෙළඳපොල සඳහා වැඩියෙන් ඉදිරිපත් කිරීමට හැකි වූ අතර, එය 11% ක අපනයන ප්‍රවර්ධනයක් ඇතිවීමට හේතුවීම.

- ගෘහස්ත පරිභෝජනයේදී සිදුවන නාස්තිය අවම කිරීම සඳහා ප්‍රාදේශීය වශයෙන් අමුද්‍රව්‍ය එක්රැස් කිරීම සිදුකර පොල් නිෂ්පාදන සඳහා කටයුතු කරනු ලබන සියලු පාර්ශවයන් දැනුවත් කිරීම සඳහා වූ රූපවාහිනී වැඩ සටහන් මාලාවක් විකාශනය කිරීම සඳහා වූ වාර්තාමය වැඩ සටහන් සඳහා ප්‍රථම වතාවට ජාතික රූපවාහිනිය සමඟ ගිවිසුම් අත්සන් කර කප්රුක නවෝදය වැඩ සටහන යටතේ විකාශනය කෙරිණි.

- පරිසර හිතකාමී පොල්කටු දහන උදුන් හා කටු එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන සඳහා ආරම්භක වැඩ සටහන් ලෙස දිවයින පුරා කටු මධ්‍යස්ථාන ආරම්භ කල අතර, ඊට සමගාමීව අපනයන ආදායම 20% කින් ඉහල නැංවීමට මෙම වසර තුල හැකිවිය.

- පොල් ආශ්‍රිත කර්මාන්ත, ප්‍රමිතිකරණය, නවීකරණය සඳහා මෙතෙක් පැවති මූල්‍ය ක්‍රමවේදයන්ට අමතරව කප්රුක නිපැයුම් දිරිය ණය යෝජනා ක්‍රමය ප්‍රථමවතාවට දේශීය පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන්ට හඳුන්වා දීමට හැකිවිය.

- පොල් කර්මාන්තයේ ගුණාත්මක ප්‍රමිති සහතිකකරණ වැඩසටහන සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය සමඟ ඇති කර ගත් අවබෝධතා ගිවිසුම අනුව GMP තත්ත්ව සහතිකකරණ වැඩ සටහන සමස්ත පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා ආරම්භ කෙරිණි.

- කප්රුක පුරවර, දිවිනැගුම, දැයට කිරුළ වැඩසටහන් හරහා මුළු තාක්ෂණික වැඩ සටහන් 83 ක් සිදුකර ප්‍රතිලාභීන් 1656 දෙනෙකු කර්මාන්තය සඳහා යොමු කරන ලදී.

- **ISO තත්ව සහතිකය ලබා ගැනීමේ කාර්යයන්**

  පොල් සංවර්ධන අධිකාරියේ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය මගින් නිකුත් කරනු ලබන පරික්ෂණ සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් ලැබෙන පරිදි හා පරීක්ෂණ කටයුතු නිවැරදිව, විධිමත්ව හා ක්‍රමානුකූලව සිදුකිරීම සඳහා, ISO 17025 තත්ත්ව සහතිකය රසායනාගාරය වෙත අත්කර ගැනීමේ කටයුතු පවත්වා ගෙන යනු ලැබේ. ඒ අනුව පොල් තෙල් පරික්ෂණ ක්‍රමවේදයන් සඳහා තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ

රසායනික විශ්ලේෂණ අංශය විසින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් පිරිනමනු ලබන ISO 17025 තත්ත්ව සහතිකය, 2012/06/12 වන දින හිමිකර ගන්නා ලදි.

- ❖ දේශීය හා ජාත්‍යන්තරව පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධන කටයුතු, පොල් ආශ්‍රිත කර්මාන්තවල නිෂ්පාදන සඳහා වෙළඳපල සොයාගැනීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය ඇතුලු තවත් දේශීය වෙළඳ ප්‍රදර්ශන 9කට සහභාගී වී ඇති අතර ඇමරිකා එක්සත් ජනපදයේ පැවති Seattle Gift Show 2012 වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වීම සඳහා අපනයන කරුවන් දෙදෙනෙකුට අවස්ථාව ලබාදීම.

- ❖ පරිසර හිතකාමී පොල් නිෂ්පාදනයන් භාවිතයට සහ පරිභෝජනයට ජනතාව යොමුකිරීම.

- ❖ පොල් භාවිතයේදී සිදුවන නාස්තිය අවම කිරීම සඳහා පාරිභෝගිකයින් දැනුවත් කිරීම. මෙමගින් පොල් නිෂ්පාදන භාවිතයට මහජනතාව හුරුකිරීමෙන් පොල් කර්මාන්ත නිෂ්පාදනය ඉහල යාම තුලින් අපනයන ආදායම වැඩිකර ගත හැකිය.

# පටුන


| | පරිච්ජේද අංක |
|---|---|
| සැකසුම් සංවර්ධන අංශය | 01 |
| තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය | 02 |
| අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය | 03 |
| පරිපාලන අංශය | 04 |
| මුදල් අංශය | 05 |
| විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | 06 |
| විගණකාධිපති වාර්තාව | 07 |

# 1. සැකසුම් සංවර්ධන අංශය

පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා විභවතාව පවතින අමුද්‍රව්‍ය හා කර්මාන්ත හඳුනා ගැනීම, පොල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය, නවීකරණය සඳහා තාක්ෂණික සේවාවන් සැපයීම හා සැකසුම් ඒකක සංවර්ධනයට මඟ පෙන්වීම, සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, යෝග්‍ය තාක්ෂණය හඳුන්වාදීම තුළින් නිෂ්පාදන පිරිවැය අවම කරලීම, නිෂ්පාදනවල ගුණාත්මක බව පවත්වා ගැනීමට හා ඉහළ නැංවීමට, කර්මාන්ත සංවර්ධනය හෝ නවීකරණය සඳහා හා නව කර්මාන්ත ඇරඹීමට අවශ්‍ය තාක්ෂණය හා මූල්‍ය සහය (රාජ්‍ය බැංකු ණය සහන මඟින්) ලබා දීම, අගය වැඩි /නව නිෂ්පාදන සිදු කිරීම සම්බන්ධයෙන් කර්මාන්තකරුවන් යොමු කිරීම, කර්මාන්ත ව්‍යාප්තිය හා රැකියා උත්පාදනය, වෙළඳපොළ අවශ්‍යතාවයන්ට සරිලන නිෂ්පාදන සිදු කිරීම හා පොල් ආශ්‍රිත ගෘහ කර්මාන්ත නංවාලීම / ස්වයං රැකියා උත්පාදනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම යනාදීන් සඳහා අවශ්‍ය සහාය දිරිගැන්වීම, දැනුවත් කිරීම සැකසුම් සංවර්ධනය අංශය විසින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් වේ.

2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක කරන ලද කාර්යයන් පහත දක්වා ඇත.

1.1 සැකසුම් ඒකක ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය

1.2 ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක සහ භෞතික ගුණාත්මක තත්ත්ව සහතික නිකුත් කිරීම සහ නිෂ්පාදන ආයතන තත්ත්ව පාලන කටයුතු සඳහා දිරිගැන්වීම

1.3 කප්රුක නවෝදාව ක්‍රමෝපායන් තුළින් පොල් හා පොල් ආශ්‍රිත දේශීය කර්මාන්තවල ඵලදායිතාව නංවාලීම

- (අ) කප්රුක නිපැයුම් පියස මධ්‍යස්ථාන ආරම්භ කිරීම
- (ආ) ගුණාත්මක නිෂ්පාදන සිදු කිරීමේ අරමුණින් පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා යහපත් නිෂ්පාදන භාවිතයන් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කරලීම
- (ඇ) පොල් ආශ්‍රිත කර්මාන්ත ඇරඹීම / පවත්නා කර්මාන්ත සංවර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම
- (ඈ) පොල් කටු හා පොල් ලෙලි එක් රැස් කර කර්මාන්තයට යොමු කිරීම
- (ඉ) කප්රුක නිපැයුම් දිරිය සහන ණය යෝජනා ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම
- (ඊ) කාන්තා ව්‍යවසායකත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- (උ) කප්රුක අරමුදල සඳහා මූල්‍ය දායකත්වය ලබා දීම

1.4 මෝල් සංවර්ධන අරමුදලේ මුදල්, සංවර්ධන කාර්යයන් සඳහා ලබාදීම

1.5 කොහු හා කොහු ආශ්‍රිත කර්මාන්ත නවීකරණය හා ප්‍රමිතිකරණය කිරීම

1.6 ගෘහස්ථ පරිභෝජනයේදී සිදුවන නාස්තිය අවම කරලීම හා නව නිෂ්පාදන හඳුන්වා දීම හා පොල් නිෂ්පාදන පිළිබඳව සියලු පාර්ශවයන් දැනුවත් කිරීම

1.7 නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් කර්මාන්ත සංවර්ධනය

1.8 තාක්ෂණය හුවමාරුව හා සේවා දායකත්වය විමධ්‍යගතකරණය

1.9 කොහු පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් ලබා දෙන සේවා දායකත්වය

1.10 දිවිනැඟුම සංකල්පය හරහා ග්‍රාමීය පොල් කර්මාන්ත සංවර්ධනයට සහායවීම

1.11 දැයට කිරුළ ජාතික වැඩසටහන වෙනුවෙන් පොල් ආශ්‍රිත කර්මාන්ත දැක්ම සඳහාඅංශයේ දායකත්වය

## 1.1 සැකසුම් ඒකක ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය


වර්ෂ 2012 දී, දිසිදි පොල්, මේදය තරමක් ඉවත් කළ දිසිදි පොල් (PDDC), පොල් කිරි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, පොල් තෙල්, කොප්පරා, යුෂ ආශ්‍රිත නිෂ්පාදන, කොහු හා කොහු කෙඳි ආශ්‍රිත නිමි නිෂ්පාදන, පොල් කටු අඟුරු, සක්‍රිය කාබන් නිෂ්පාදන හා පොල් කටු ආශ්‍රිත විසිතුරු අත්කම් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තායතන 307 ක් අධිකාරියේ ලියාපදිංචි කර ඇත.

| නිෂ්පාදනය | **2011 වර්ෂයේ ලියාපදිංචි නිෂ්පාදන ආයතන ගණන** | **2012 වර්ෂයේ ලියාපදිංචි නිෂ්පාදන ආයතන ගණන** | | |
|---|---|---|---|---|
| | | නව ලියාපදිංචි | පැරණි ලියාපදිංචි | මුළු ලියාපදිංචි |
| දිසිදි පොල් නිෂ්පාදන | 49 | - | 51 | 51 |
| මේදය තරමක් ඉවත් කළ දිසිදි පොල් | 7 | - | 4 | 4 |
| පොල් කිරි නිෂ්පාදන | 7 | - | 5 | 5 |
| පොල් තෙල් නිෂ්පාදන | 44 | 10 | 34 | 44 |
| කොප්පරා නිෂ්පාදන | 28 | - | 20 | 20 |
| කොහු කෙඳි නිෂ්පාදන | 121 | 21 | 109 | 130 |
| කොහු කෙඳි ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදන | 36 | 10 | 25 | 35 |
| පොල් කටු අඟුරු නිෂ්පාදන | 2 | | 2 | 2 |
| සක්‍රිය කාබන් නිෂ්පාදන | 7 | | 7 | 7 |
| පොල් කටු ආශ්‍රිත විසිතුරු අත්කම් භාණ්ඩ නිෂ්පාදන | 13 | - | 7 | 7 |
| පොල් යුෂ ආශ්‍රිත නිෂ්පාදන | - | 2 | - | 2 |
| **එකතුව** | **314** | **43** | 264 | **307** |

**වගු අංක 1 - 2011 හා 2012 වර්ෂයන්හි ලියාපදිංචි නිෂ්පාදන ආයතන**

මෙම වර්ෂයේ දිසිදි පොල් මෙ.ටො. 41,647 ක් නිපදවන ලද අතර ඊට මෝල් 51 ක් දායක වී තිබුණි. ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක හා භෞතික ගුණාත්මක බව විශ්ලේෂණය සඳහා සැකසුම් සංවර්ධන අංශය විසින් එම නිෂ්පාදන වලින් ආදර්ශ ලබා ගෙන යොමු කිරීම හා එම කර්මාන්තශාලා අධීක්ෂණය කරන ලදී.

**දිසිදි පොල් නිෂ්පාදනය (මෙ.ටො.) - 2011 හා 2012**




2012 වර්ෂය තුළදී දිසිදි පොල්, පොල් කිරි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, කොප්පරා, පොල් තෙල්, කොහු කෙඳි හා කොහු ආශ්‍රිත නිමි නිෂ්පාදන ඇතුළු පොල් ආශ්‍රිත නිෂ්පාදන ආයතන වල සිදු කරන ලද ක්ෂේත්‍ර චාරිකා, පරීක්ෂණ හා ආදර්ශ ගැනීම් වාර ගණන 10419ක් විය. දිසිදි නිෂ්පාදිතවල ක්ෂුද්‍ර ජීව හා භෞතික ගුණාත්මක තත්ත්ව සහතික කිරීම සඳහා නැවිගත කරන්නන්ගේ ගබඩා හා ගුදම් පරීක්ෂා කර බැලීමට ක්ෂේත්‍ර චාරිකා 42 ක් සිදු කර ඇත. එහිදී දිසිදි පොල් මලු 521කින් නැවත නියැදි ලබාගෙන විශ්ලේෂණය සඳහා රසායනාගාරය වෙත යොමු කරන ලදී.

## 1.2 ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක සහ භෞතික ගුණාත්මක තත්ත්ව සහතික නිකුත් කිරීම

- **දිසිදි පොල් සඳහා තත්ත්ව සහතික නිකුත් කිරීම**

  සියලු දිසිදි කර්මාන්තශාලා වල දෛනික නිෂ්පාදන වලින් අධිකාරියේ පරීක්ෂකවරුන් ලබාගන්නා නියැදි රසායනාගාරයේදී පරීක්ෂා කිරීමෙන් පසු නිකුත් කරන ප්‍රතිඵල මත මෙම තත්ත්ව සහතික නිකුත් කරනු ලැබේ.

  මෙම වර්ෂය තුළදී නිපදවන ලද දිසිදි පොල් මෙ.ටො. 41,647 න් දෛනික නියැදි/ආදර්ශ 9393ක් ක්ෂුද්‍ර ජීවී, භෞතික හා විශේෂ ආදර්ශ ලබාගෙන ඇත. දිසිදි පොල් කි.ග්‍රෑ.17,388,810 වෙනුවෙන් තත්ත්ව සහතික 1,738 ක් නිකුත් කර ඇත.

| මාසය | තත්ත්ව සහතික නිකුත් කිරීම | | | | මුළු ගණන |
|---|---|---|---|---|---|
| | සැල්මොනෙල්ලා | භෞතික තත්ත්ව | $SO_2$ | ඇෆ්ලටොක්සින් | |
| ජනවාරි | 104 | 104 | - | - | 208 |
| පෙබරවාරි | 96 | 96 | - | - | 192 |
| මාර්තු | 83 | 83 | 5 | 5 | 176 |
| අප්‍රේල් | 65 | 65 | 8 | 7 | 145 |
| මැයි | 66 | 66 | 8 | 8 | 148 |
| ජුනි | 61 | 61 | 14 | 14 | 150 |
| ජූලි | 70 | 70 | 11 | 13 | 164 |
| අගෝස්තු | 62 | 62 | 6 | 5 | 135 |
| සැප්තැම්බර් | 65 | 65 | 10 | 7 | 147 |
| ඔක්තෝම්බර් | 45 | 45 | 9 | 8 | 107 |
| නොවැම්බර් | 36 | 36 | 9 | 7 | 88 |
| දෙසැම්බර් | 35 | 35 | 5 | 3 | 78 |
| **මුළු ගණන** | **788** | **788** | **85** | **77** | **1738** |

වගු අංක **2 – 2012** වර්ෂයේදි නිකුත් කල සහතික ගණන

- **විශ්ලේෂණ සහතික/වාර්තා නිකුත් කිරීම**

ගැණුම්කරුවන්ගේ ඉල්ලීම පරිදි මේදය තරමක් ඉවත් කළ දිසිදි පොල් (PDDC), කොප්පරා, පොල් තෙල්, නැවුම් පොල්තෙල් (Virgin Coconut Oil), පුන්නක්කු, කොහු කෙඳි හා කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන, දිසිදි පොල්වල විශේෂිත ආදර්ශ, බැර ලෝහ, දිසිදි පොල්වල සම්පූර්ණ සනාවාස පරික්ෂාවන් ආදිය සඳහා වන රසායනාගාර විශ්ලේෂණ ප්‍රතිඵල පාදක කොටගෙන සහතික/වාර්තා නිකුත් කරන ලදී. මෙම වර්ෂයේ විශ්ලේෂණ සහතික/වාර්තා 840 ක් නිකුත් කර ඇත. එහි සවිස්තරාත්මක සටහනක් පහත දැක්වේ.

| පරික්ෂා සිදු කළ අයිතම | අයදුම්පත්/ලබා ගත් නියැදි සංඛ්‍යාව | නිකුත් කරන ලද විශ්ලේෂණ සහතික/වාර්තා සංඛ්‍යාව |
|---|---|---|
| දිසිදි පොල්වල විශේෂිත ආදර්ශ | 90 | 90 |
| මේදය තරමක් ඉවත් කළ දිසිදි පොල් | 95 | 95 |
| කොප්පරා | 14 | 14 |
| පොල්තෙල් | 62 | 62 |
| නැවුම්පොල් තෙල් | 24 | 24 |
| කොහු කෙඳි හා කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන | 123 | 123 |
| පුන්නක්කු | 33 | 33 |
| දිසිදි පොල්වල සම්පූර්ණ සනාවාස පරික්ෂාවන් | 311 | 311 |
| ජලයේ අඩංගු බැර ලෝහ | 88 | 88 |
| **එකතුව** | **840** | **840** |

වගු අංක **3- 2012** වර්ෂයේ දි නිකුත් කළ විශ්ලේෂණ සහතික ගණන

## 1.3 කප්රුක නවෝදාව ක්‍රමෝපායන් තුළින් පොල් හා පොල් ආශ්‍රිතකර්මාන්ත නංවාලීම

ශ්‍රී ලංකාවේ පොල් වගාව ව්‍යාප්තිය හා උපරිම අස්වැන්නක් ඉලක්ක කරමින් විවිධ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කරන ලදී. එම උපරිම අස්වැන්න යොදා ගනිමින් පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්ත ඇති කිරිම, පවත්නා කර්මාන්ත සංවර්ධනය, අගය වැඩි නිෂ්පාදන සිදු කිරීමට ව්‍යවසායකයින් දැනුවත් කිරීම හා එම කර්මාන්ත ඇරඹීමට සහය වීම, ගුණාත්මක නිෂ්පාදන සිදුකිරිමේ වැදගත්කම හා එම නිෂ්පාදන සිදුකිරිමට අවශ්‍ය සහාය ලබාදීම, ගැමි ආර්ථිකය නංවාලිම සඳහා ගෘහ කර්මාන්ත ඇති කිරිමට සහාය විම හා ස්වයං රැකියාවක් වශයෙන් පොල් ආශ්‍රිත අත්කම් හා විසිතුරු භාණ්ඩ නිෂ්පාදන සිදුකිරිම පිළිබඳ දැනුවත් කිරීම යන කාර්යයන් ක්‍රියාත්මක කිරිමේ අරමුණින් 2012 වර්ෂයේදි පහත වැඩසටහන් සිදු කරන ලදී.

- **කප්රුක නිපැයුම් පියස මධ්‍යස්ථාන ආරම්භ කිරිම**

අමාත්‍යාංශයේ මඟපෙන්වීම හා උපදෙස් පරිදි කප්රුක පුරවර වැඩසටහන යටතේ නිපැයුම් පියස මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරන ලදී. මේ සඳහා පොල් ආශ්‍රිත කර්මාන්ත ආරම්භ කිරිමට යෝග්‍ය ප්‍රදේශ හඳුනාගැනිමටත් එම ප්‍රදේශයන්හි දැනට වසා දමා ඇති රජයේ ගොඩනැඟිලි යොදාගනිමින් මධ්‍යස්ථාන පිහිටුවිමටත් සැලසුම් සකස් කරන ලදි. මේ සම්බන්ධයෙන් පොල් කර්මාන්ත ක්ෂේත්‍ර අදාළ පාර්ශවකරුවන් දැනුවත් කිරිමේ වැඩසටහනක් පැවති අතර එහිදී කර්මාන්තකරුවන් විසින් අපනයන නිෂ්පාදන සිදු කිරිමේදී පුහුණු ශ්‍රමිකයින් යොදවා ගැනිමේ දී ඇති වන අපහසුතාවයන්, අමුද්‍රව්‍ය අවශ්‍යතාවයන් සපුරා ගැනීම හා ප්‍රවාහනයේදී ඇතිවන අපහසුතාවයන් පිළිබඳ දන්වන ලදි. මෙම නව වැඩසටහන මගින් ඊට පිළියම් යෙදෙන බැවින් ඊට එක්වන ලෙසට කර්මාන්තකරුවන්ට ආරාධනා කරන ලදී.

මේ සම්බන්ධයෙන් පන්නල, මීගමුව, ඉබ්බාගමුව, මුලටියන, ගොඩකවෙළ, දිවුලපිටිය, මඩුල්ල හා සියඹලාණ්ඩුව යන ප්‍රදේශයන්හි යෝග්‍යතාවයන් නිරික්ෂණය කළ ස්ථාන අතුරින් වසා දමා ඇති රජයේ ගොඩනැඟිලිවල නිපැයුම් පියස ඉදිකිරිමට පහත ස්ථාන සුදුසු බවට හඳුනාගන්නා ලදී.

1. කොටුවැල්ල ප්‍රාථමික විද්‍යාලය - පන්නල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය
2. ඉහළ නෙල්ලිය ප්‍රාථමික විද්‍යාලය - ඉබ්බාගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය
3. ගල් ඇටුඹ කනිෂ්ඨ විද්‍යාලය - මුලටියන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය
4. මාවතලන්ද විද්‍යාලය - ගොඩකවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය
5. කුලීගෙදර ප්‍රාථමික විද්‍යාලය - දිවුලපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය
6. නාගහමඩ පොදු ගොඩනැගිලි මධ්‍යස්ථානය - මඩුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය

මෙම වැඩසටහන දියත් කිරීමේදි පොල් සංවර්ධන අධිකාරිය පහත කාර්යයන් ඉටු කල යුතු බව හඳුනාගන්නා ලදී.

1. මධ්‍යස්ථානය සඳහා ගොඩනැඟිල්ල ලබාදීම
2. යන්ත්‍ර සූත්‍ර සැපයීම

3. විදුලිය, ජලය වැනි අනෙකුත් යටිතල පහසුකම් ලබාදීම
4. තාක්ෂණික දැනුම ලබාදීමහෝ ඊට අවශ්‍ය මූලික පහසුකම් ලබාදීම
5. පසුවිපරම් සිදු කිරීම
6. ව්‍යාපෘතිය පවත්වාගෙන යාමේදී තවදුරටත් අවශ්‍ය මූලික යටිතල පහසුකම්වල සංවර්ධන කටයුතු කෙරෙහි අවධානය යොමු කිරීම

නිපැයුම් පියස මධ්‍යස්ථාන ස්ථාපනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා අධිකාරිය විසින් සිදුකිරීමට කටයුතු කරන ලදි.

ඒ අනුව,

- ගොඩකවෙල මාවතලන්ද විද්‍යාලයේ යටිතල පහසුකම් හා සංවර්ධන කටයුතු සිදු කර අවසන් කරන ලදී. ඒ සඳහා රු. මිලියන 1.376 ක් වැය කරන ලදී.

- දිවුලපිටිය කුලීගෙදර ප්‍රාථමික විද්‍යාලය ස්ථාපනය කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් හා සංවර්ධන කටයුතු සඳහා රු. මිලියන 1.839 ක් වැය කරන ලදී.
(ඉහත මධ්‍යස්ථාන දෙක සඳහා විදුලිය ලබා ගැනිමෙන් පසු කප්රුක සමිති සාමාජිකයින් හා ව්‍යවසායකයෙකු සම්බන්ධ කර ගැනීමෙන් පසු නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට නියමිතය)

- පන්නල කොටුවැල්ල ප්‍රාථමික විද්‍යාලයේ යටිතල පහසුකම් හා සංවර්ධන කටයුතු සඳහාදළ ඇස්තමේන්තුගත වියදමින් (50%) රු. මිලියන 2.215 ක් වැය කර ඇත. සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී.

- ඉබ්බාගමුව නෙල්ලිය නිපැයුම් පියස මධ්‍යස්ථානය රු. මි. 2.144 ක වියදමින් සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී.දැනට මෙම මධ්‍යස්ථානයේ තවාෂි බුරුසු නිෂ්පාදනය සිදු කරමින් පවතී.

- මඩුල්ල නාගහමඩ නිපැයුම් පියස මධ්‍යස්ථානයේ 2012 නොවැම්බර් 25 වන දින සිට තවාෂි බුරුසු නිෂ්පාදන කටයුතු, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලදී. මේ සඳහා අවශ්‍ය තාක්ෂණය හා යන්ත්‍ර සූත්‍ර සවිකිරීමේ කටයුතු සිදු කරනලදී.




*මඩුල්ල නිපයුම් පියස මධ්‍යස්ථානයේ තවාෂි බුරුසු නිෂ්පාදන සිදු කිරීම*

මීට අමතරව වහරග්ගොඩ කොහු ආශ්‍රිත නිමැවුම් ඒකකය ද කප්රුක නිපැයුම් පියස සංකල්පයට අනුකූලව නව ව්‍යවසායකත්වය යටතේ නිෂ්පාදන සිදු කරන අතර පට්ටියවෙළගොඩ ප්‍රදේශයේද නිපැයුම් පියස මධ්‍යස්ථානයක් ආරම්භ කර නිෂ්පාදන කටයුතු සිදු කරමින් පවතී.

2013 වර්ෂයේදි ඉදිරි කාර්යයන් සිදු කිරීමට නියමිතය.

- **ගුණාත්මක නිෂ්පාදන සිදු කිරීමේ අරමුණින් පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා යහපත් නිෂ්පාදන භාවිතයන් (GMP) හඳුන්වාදීම හා ක්‍රියාත්මක කරලීම**

පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය හා නියමිත ප්‍රමිතීන් පවත්වාගනිමින්, වෙළඳපොළ තරඟකාරිත්වයට සරිලන නිෂ්පාදන සිදු කිරීමට අවශ්‍ය යහපත් නිෂ්පාදන භාවිතයන් (GMP) හඳුන්වාදී ඒවා කර්මාන්ත ආයතන තුළ ක්‍රියාත්මක කිරීම 2012 වසරේ ආරම්භ කොට ඇත.

මේ සම්බන්ධයෙන් දිසිදි පොල්, කොප්පරා හා පොල් තෙල්, පොල් කිරි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සහ කොහු හා කොහු ආශ්‍රිත නිමි නිෂ්පාදන කර්මාන්තකරුවන් හට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයවිසින් ක්‍රියාත්මක කරන යහපත් නිෂ්පාදන භාවිතයන් සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.



*පොල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ගිවිසුමට අත්සන් තැබීම*

ඒ අනුව පහත නිෂ්පාදන කර්මාන්තයන් විසින් GMP සහතිකකරණය සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන ලදී.

| | | |
|---|---|---|
| දිසිදි පොල් | - | 33 |
| කොප්පරා හා පොල් තෙල් | - | 7 |
| පොල් කිරි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | - | 2 |
| කොහු හා කොහු ආශ්‍රිත නිමි නිෂ්පාදන | - | 11 |
| | | 53 |

අයදුම්පත් ඉදිරිපත් කළ කර්මාන්තායතන 48 ක් පළමු විගණනය සඳහා යොමු කළ අතර ඉන් 2 වන විගණනය සඳහා යෝජනාවූ ආයතන අතරින් ආයතන 6 ක් දෙවන විගණන කටයුතු අවසන් කරන ලදී. මෙය 2013 වර්ෂයේද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහනකි.

- **පොල් ආශ්‍රිත කර්මාන්ත ඇරඹීම/ පවත්නා කර්මාන්ත සංවර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම**

පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන සිදු කිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දෙන ලෙසට කප්රුක සමිති විසින් සිදු කරන ලද ඉල්ලීම් පදනම් කරගනිමින් එම ප්‍රදේශයේ පවත්නා අමුද්‍රව්‍ය සුලභතාවය, නිෂ්පාදන සඳහා වන වෙළඳපොළ අවශ්‍යතාව හා අලෙවිය යන කරුණු සැලකිල්ලට ගෙන පවත්වන ලද පුහුණු වැඩසටහන් පහත පරිදිවේ.

| අංකය | පුහුණු වැඩසටහන | ප්‍රා.ලේ. කො. ගණන | පුහුණු වැඩසටහන් ගණන | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 1. | පොල් කෙඳි නිෂ්පාදනය | 03 | 04 | 97 |
| 2. | පාපිසි නිෂ්පාදනය | 09 | 12 | 223 |
| 3. | ඉදල් හා මුසුන් නිෂ්පාදනය | 15 | 18 | 425 |
| 4. | ඉදල් හා මුසුන් නිෂ්පාදනය (කාන්තා) | 01 | 01 | 15 |
| 5. | පොල් කටු ආශ්‍රිත නිෂ්පාදනය | 09 | 13 | 183 |
| 6. | ඉරටු නිෂ්පාදනය | 02 | 02 | 35 |
| 7. | පොල් කටු අඟුරු නිෂ්පාදන | 01 | 01 | 45 |
| 8. | පොල් කොළ ආශ්‍රිත නිෂ්පාදන | 03 | 03 | 55 |
| 9. | බුරුසු නිෂ්පාදනය | 06 | 06 | 115 |
| 10. | කොහු ලණු නිෂ්පාදන | 03 | 04 | 88 |
| 11. | පොල් තෙල් නිෂ්පාදන | 02 | 02 | 34 |
| 12. | කොහු කෙඳි මාල නිෂ්පාදන | 02 | 02 | 41 |
| 13. | ඉදල් නිෂ්පාදන | 02 | 02 | 43 |
| 14. | මුසුන් නිෂ්පාදන | 01 | 01 | 13 |
| 15. | රසකැවිලි නිෂ්පාදන (කාන්තා) | 05 | 05 | 93 |
| 16. | කොප්පරා | 01 | 01 | 13 |
| එකතුව | | | **76** | **1518** |

වගු අංක **4-** පුහුණු වැඩසටහන්

- **පොල් කටු හා පොල් ලෙලි එක් රැස් කර කර්මාන්ත සඳහා යොදා ගැනීම**

ප්‍රයෝජනයට නොගෙන අපතේ යන පොල් ආශ්‍රිත අමුද්‍රව්‍ය හඳුනාගනිමින් කර්මාන්තය සඳහා යොදවා ගැනිමේ අරමුණින් පොල් කටු හා පොල් ලෙලි එක් රැස්කිරිමේ මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා කටයුතු කරන ලදී. ඒ අනුව පොල් කටු එක් රැස්කිරිමේ මධ්‍යස්ථාන 47 ක් මඟින් පොල් කටු කි.ග්‍රෑ. 842,760 ක් හා පොල් ලෙලි එක් රැස්කිරිමේ මධ්‍යස්ථාන 14 ක් මඟින් පොල් ලෙලි 2,765,400 ක් එක් රැස් කරන ලදී. මෙහිදි පොල් කටු අඟුරු නිෂ්පාදනය කිරීමට කැමැත්තක් දක්වන අය හා පොල් ලෙලි ආශ්‍රිත කර්මාන්ත සිදු කිරීමට කැමති අය හට අවශ්‍ය තාක්ෂණික දැනුම හා මූල්‍ය සහනයන් ලබා ගැනීම සම්බන්ධයෙන් දැනුවත් කරනු ලැබේ.

- **කප්රුක නිපැයුම් දිරිය සහන ණය යෝජනා ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම**

පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය / නවීකරණය හා නව කර්මාන්ත ඇරඹීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය සපුරා ගැනීමට සහය වීමේ අරමුණින් පොල් සංවර්ධන අධිකාරිය හා මහජන බැංකුව හා එක්ව 6% සහන පොළී පදනම මත අයදුම්කරුවන් 25 දෙනෙකු සඳහා රු. මිලියන 16.615 ණය මුදලක් ලබා දී ඇත. මීට අමතරව තවත් අයදුම්කරුවන් 51 දෙනෙකු ණය ලබාගැනීමට සුදුසුකම් ලබා තිබුණි.



**පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන්, අමාත්‍යාංශ ලේකම්, පොල් වගාකිරිමේ මණ්ඩලයේ සභාපති හා දෙපාර්ශවයේ ජ්‍යෙෂ්ඨ නිළධාරින්ගේ සහභාගිත්වයෙන් පොල් සංවර්ධන අධිකාරියේ හා මහජන බැංකුවේ සභාපතිවරුන් විසින් අදාළ ගිවිසුම්වලට අත්සන් තැබීම**

- **කාන්තා ව්‍යවසායකත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

ප්‍රයෝජනයට නොගන්නා පොල් ආශ්‍රිත අමුද්‍රව්‍ය භාවිතා කරමින් පොල් ආශ්‍රිත අගය වැඩි නිෂ්පාදන ස්වයං රැකියාවන් වශයෙන් සිදු කරමින් ග්‍රාමීය ආර්ථිකය නංවාලීම මෙහි අරමුණ වේ. ඒ අනුව පොල් ආශ්‍රිත රසකැවිලි සැකසීම, ඉරටු, පොල් කොළ, මටලු හා කොහු ආශ්‍රිත නිෂ්පාදන සිදු කිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීමට සැලසුම් කළ අතර මෙම වර්ෂයේදී පහත වැඩසටහන් සිදු කරන ලදී.

| **පුහුණු වැඩසටහන** | **වැඩසටහන් ගණන** | **ප්‍රතිලාභීන් ගණන** |
|---|---|---|
| රසකැවිලි නිෂ්පාදනය | 5 | 93 |
| ඉදල් හා මුසුන් | 1 | 15 |
| ඉරටු විසිතුරු නිෂ්පාදන | 1 | 30 |
| **මුළු ගණන** | **7** | **138** |

**වගු අංක 5- කාන්තා පුහුණු වැඩසටහන්**

- **කප්රුක අරමුදල සඳහා මුල්‍ය දායකත්වය ලබා දිම**

2005 අංක 31 දරණ කප්රුක පනත යටතේ ස්ථාපනය කර ඇති කප්රුක අරමුදල ක්‍රියාත්මක කරන අතර පොල් වගාකිරිමේ මණ්ඩලයේ සභාපතිවරයා නිල බලයෙන් මෙම අරමුදලේ කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන අතර පාලක මණ්ඩලයේ සෙසු සාමාජිකයින් වශයෙන් පොල් සංවර්ධන අධිකාරියේ සභාපති හා අධ්‍යක්ෂ ජනරාල්, පොල් පර්යේෂණ ආයතනයේ සභාපති හා අධ්‍යක්ෂවරයාත් හා පොල් වගාකිරිමේ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයාත් නියෝජනය කරනු ලැබේ. පළමු කළමණාකරණ රැස්වීමේදී මෙම අරමුදල ආරම්භ කිරිමේදී ආයතන 3ක් විසින් රු. දස ලක්ෂ 10 බැගින් යොදවා අරමුදල ආරම්භ කිරීමට තීරණය කර ඇත. ඒ අනුව 2012 වර්ෂයට සැකසුම් සංවර්ධන අංශය සඳහා වෙන් කරන ප්‍රතිපාදන වලින් රු. දස ලක්ෂ 10 මුදලක් ලබා දීමට කටයුතු කරන ලදී.

## 1.4 මෝල් සංවර්ධන අරමුදලේ මුදල්, සංවර්ධන කාර්යයන් සඳහා ලබාදීම

දිසිඳි කර්මාන්තශාලා වැඩිදියුණු කිරීමට යහපත් නිෂ්පාදන පුරුදු තත්ත්ව සහතිකරණය සිදු කිරීමට වැයවන වියදම්, මෝල් සංවර්ධන අරමුදලින් ලබා ගැනීමට කර්මාන්තකරුවන් දැනුවත් කර ඇත. මෙම සහතිකරණය හරහා විදේශ වෙළඳපොළට ගුණාත්මක නිෂ්පාදන ඉදිරිපත් කළ හැකි වන අතර ශ්‍රී ලංකාවේ නිෂ්පාදනවලට හොඳ වෙළඳපොළක් ලබා ගත හැකිවේ.

## 1.5 කොහු හා කොහු ආශ්‍රිත කර්මාන්ත නවීකරණය හා ප්‍රමිතිකරණය කිරීම

පොල් කර්මාන්ත වලින් වාර්ෂික විදේශ විනිමය ඉපයීම් හා සැලකීමේදී කොහු හා කොහු නිෂ්පාදන වලින් උපයන විදේශ විනියම ඉතා ඉහළ අගයක පවතී. ජාත්‍යන්තර වෙළඳපොළහි ස්වභාවික අමුද්‍රව්‍ය යොදා ගනිමින් සිදු කරන නිෂ්පාදන සඳහා වඩා හොඳ මිලක් පවතී. එබැවින් කොහු කර්මාන්තශාලා සැකැස්ම, සුදුසු අමුද්‍රව්‍ය තෝරාගැනීම, ගුණාත්මක නිෂ්පාදන සැකසීම, නිෂ්පාදන ඇසිරීම, ගබඩාකරණය, ප්‍රවාහනය ආදී කරුණු ඇතුළත් නීති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව අධිකාරිය හඳුනාගත් අතර ඊට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ද දායකත්වයෙන් ක්‍රමවේදය සකස් කිරීම අවසන් කරමින් පවතී.

## 1.6 ගෘහස්ථ පරිභෝජනයේදී සිදුවන නාස්තිය අවම කරලීම හා නව නිෂ්පාදන හඳුන්වා දීම හා පොල් නිෂ්පාදන පිළිබඳව සියලු පාර්ශවයන් දැනුවත් කිරීම

පොල් හා පොල් කර්මාන්ත පිළිබඳව ජනතාව දැනුවත් කිරීම, ගෘහ පරිභෝජනයේදී සිදුවන නාස්තිය අවම කරලීම, පොල් හා පොල් ආශ්‍රිත අගය වැඩි නිෂ්පාදන සඳහා කර්මාන්තකරුවන් දැනුවත් කිරීම, කප්රුක නවෝදා වැඩසටහන පිළිබඳව ජනතාව දැනුවත් කිරීම, කර්මාන්තයේ ශක්තීන් හා අයෝජන අවස්ථා පෙන්නුම් කරමින් ප්‍රවර්ධන වැඩසටහනක් වශයෙන් ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව හා එක්ව වාර්තාමය වැඩසටහන් පෙළක් නිෂ්පාදන කර විකාශන කිරීමට සැලසුම් කර ඇත.




*පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පොල් සංවර්ධන අධිකාරියේ හා ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාවේ සභාපති වරුන් ගිවිසුම්වලට එළඹීම හා ඊට පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශ ලේකම්තුමාගේ හා පොල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ සහභාගීත්වය*

## 1.7 නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් කර්මාන්ත සංවර්ධනය

- සමස්ත පොල් වගාවෙන් 20% ක පමණ භූමි ප්‍රමාණයක් දකුණු පළාත හා රත්නපුර, මොණරාගල දිස්ත්‍රික්කවල ව්‍යාප්ත වී ඇති අතර එම ප්‍රදේශයන්හි පවත්නා ගෙඩි පොල්, පොල් ත්‍රිකෝණයේ ඇති දිසිඳි කර්මාන්තශාලාවට අලෙවිය සඳහා දෛනිකව ප්‍රවාහනය කළ යුතුවේ. ඒ අනුව පළ කරන ලද පුවත්පත් දැන්වීමට අනුකූලතාවය දැක්වූ ව්‍යවසායකයන් දෙදෙනෙකු අතරින් ඇඹිලිපිටිය ප්‍රදේශයේ කර්මාන්තායතනය ස්ථාපනය කිරීමට ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කළ ව්‍යවසායකයා සඳහා අනුමැතිය ලබා දෙන ලදි.

- කොහු කර්මාන්තයේ පාරම්පරික ක්‍රමවේදයන් භාවිතා කරමින් අතින් කොහු නිස්සාරණය කරනු ලැබේ. පාරම්පරික පෙට්ටි කුට්ටම් භාවිතා කිරීමේ කොහු ලෙලි ඇල්ලීමේදී අවධානමක් පවතින බැවින් ඒ සඳහා පුහුණු ශ්‍රමිකයින්ගේ ද අඩුවක් පවතී. මෙම ගැටළු පොල් සංවර්ධන අධිකාරිය හඳුනාගෙන පැවති අතර කාර්මික තාක්ෂණ ආයතන විසින් වැඩි දියුණු කරන ලද යාන්ත්‍රික පෙට්ටි කුට්ටම කොහු නිස්සාරණය සඳහා යෝග්‍ය බැවින් හඳුනාගත් ස්ථාන 5 කට සවි කිරීම සඳහා යාන්ත්‍රික පෙට්ටි කුට්ටම් 5ක් එම ආයතනයෙන් මිලදී ගැනීමට කටයුතු කරන ලදී.

- පොල් කටු පුළුස්සා අඟුරු සකස් කිරීම සම්ප්‍රදායී කර්මාන්තයක් ලෙස ආරම්භවී පැවතුනද මෙම කාර්යය මඟින් කාබන්ඩයොක්සයිඩ් හා කාබන්මොනොක්සයිඩ් පරිසරයට මුදා හැරේ. එහෙයින් පරිසර හිතකාමී කර්මාන්තයක් වශයෙන් පවත්වාගෙන යාම සඳහා කාලයක සිට පර්යේෂණ සිදු කළ අතර මේවන විට වඩාත් ඵලදායී ක්‍රමවේදයන් 2 ක් හඳුනා ගෙන ඇත.
    1. වැඩි දියුණු කළ සම්ප්‍රදායී වල ක්‍රමය
    2. උඳුන් ක්‍රමය

  මෙම ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දීමට සිදු වන ප්‍රායෝගික ගැටළු හඳුනා ගනිමින් ඒවා නිවැරදි කිරීම සඳහා පර්යේෂණ සිදු කරනු ලැබේ. මේ පිළිබඳ අංශයේ නිරතුරු අවධානයට යොමු වී ඇත.

## 1.8 තාක්ෂණය හුවමාරුව හා සේවා දායකත්වය විමධ්‍යගතකරණය

ප්‍රධාන කාර්යාලයේ මධ්‍යගතව පැවැති සේවාවන්, පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්ත පවත්නා ප්‍රදේශ (ගම) කරා යොමු කර සේවා විමධ්‍යගත කිරීමේ අදහසින් ප්‍රාදේශීය කාර්යාල පිහිටුවන ලදි. එමඟින් එම ප්‍රදේශයේ වෙසෙන කර්මාන්ත පාර්ශවකරුවන්ට විශාල පහසුවක් ලැබෙන අතර ඔවුන්ගේ කර්මාන්ත පිළිබඳ ගැටළු හා ඒ ආශ්‍රිතව අවශ්‍යතාවන් ඉටුකර ගැනිමට හැකි වී ඇත. කප්රුක පුරවර වැඩසටහන යටතේ සිදු කරන සමීක්ෂණ, දත්ත හා තොරතුරු එක්රැස් කිරීම්, තාක්ෂණික පුහුණු වැඩසටහන් සංවිධානය කිරිම හා පැවැත්වීම, ජාතික මට්ටමේ ප්‍රදර්ශන හා වැඩමුළු සඳහා සේවා දායකත්වය ලබා දීම යනාදිය ප්‍රාදේශීය කාර්යාල මඟින් සිදු කරන කාර්යයන් වේ.

## 1.9 කොහු හා පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් ලබා දෙන සේවා දායකත්වය

කොහු ආශ්‍රිත කර්මාන්තවලට අදාළ වන පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් සිදු කරන අතර උණු වතුර යොදාගනිමින් පොල් ලෙලි පල් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කරමින් පවතින අතර දැනට අපේක්ෂිත ඉලක්කයෙන් 80% ක් සපුරා ඇත. තවද කොහු නිෂ්පාදන පිළිබඳ දැනුම ලබා දීම / කාර්යක්ෂම නිෂ්පාදන සිදු කිරීම / පවත්නා ගැටළු සඳහා පිළියම් යෙදවීම මැයෙන් පුහුණු වැඩසටහන් 6 ක් සිදු කරන ලදී.තවද, මෙම ආයතනය හා සුනිත්‍ය බලශක්ති අධිකාරිය එක්ව බලශක්ති අරපිරිමැස්ම සම්බන්ධයෙන් කොහු කර්මාන්තකරුවන් හට වැඩමුළුවක් පවත්වන ලදී.

## 1.10 දිවිනැඟුම සංකල්පය හරහා ග්‍රාමීය පොල් කර්මාන්ත සංවර්ධනයට සහාය වීම

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ ක්‍රියාත්මක කරන දිවිනැඟුම ජාතික වැඩසටහන සඳහා පොල් සංවර්ධන අධිකාරියේද දායකත්වය ලබා දීම සිදු කෙරේ. මෙම දායකත්වය මඟින් පොල් ආශ්‍රිත ගෘහ කර්මාන්ත ඇති කිරීම හා තමා ජීවත්වන පරිසරයේ බහුලව පවත්නා අපතේ යන පොල් ආශ්‍රිත දැ අමුද්‍රව්‍ය වශයෙන් යොදා ගනිමින් කර්මාන්ත සිදු කරමින් ග්‍රාමීය ආර්ථිකය නංවාලීම සඳහා සහාය වීම අරමුණු කර පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

| අංක | පුහුණු වැඩසටහන | ප්‍රා.ලේකම් කොට්ඨාසය | පැමිණි ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|
| 1 | පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන | නාච්චාදූව | 12 |
| 2 | ලණු නිෂ්පාදන | වාවකච්චේරිය | 24 |
| | | මඩකලපුව | 9 |
| | | ඉවේගම | 7 |
| 3 | ඉදල් හා මුසුන් නිෂ්පාදන | රඹුක්කන | 12 |
| | | දෙහිඕවිට | 17 |
| | | කෑගල්ල | 11 |
| | | වාවකච්චේරිය | 16 |
| | | මඩකලපුව | 6 |
| | | මාතලේ | 19 |
| **එකතුව** | | | **133** |

වගු අංක 6 - දිවිනැඟුම පුහුණු වැඩසටහන්


මෙයට අමතරව මඩකලපුව, මුලතිව්, කිලිනොච්චි, බදුල්ල, වවුනියාව, මාතලේ, ගාල්ල, ත්‍රිකුණාමලය, නුවරඑළිය හා කුරුණෑගල යන ප්‍රදේශයන් හි පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්ත පිළිබඳව තාක්ෂණික ප්‍රදර්ශන හා දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් පවත්වන ලදී.

## 1.11 දැයට කිරුළ ජාතික වැඩසටහන වෙනුවෙන් පොල් ආශ්‍රිත කර්මාන්ත දැක්ම සඳහා අංශයේ දායකත්වය

2012 වර්ෂයේ පෙබරවාරි මස අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඔයාමඩුව ස්ථානයේ පැවති දැයට කිරුළ ජාතික වැඩසටහන සඳහා අංශයේ දායකත්වය ලබා දෙන ලදී. එහි දී පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන හඳුන්වාදීම, ඒවායේ ගුණාත්මකභාවය රැකගැනීමේ ඇති වැදගත්කම හා කර්මාන්ත සිදු කරන ආකාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙන්ම තමා ජීවත්වන පරිසරය තුළ සුලභව පවත්නා අපතේ යන පොල් ආශ්‍රිත අමුද්‍රව්‍ය යොදා ගනිමින් අත්කම් හා විසිතුරු නිෂ්පාදන සකස් කිරීම පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව පහත සඳහන් ප්‍රදර්ශනාත්මක දැනුවත් කිරීම් සිදු කරන ලදී.

- ලණු නිෂ්පාදනය
- ඉදල් හා මුසුන් නිෂ්පාදනය
- පාපිසි නිෂ්පාදනය

- ඉරටු ආශ්‍රිත නිෂ්පාදන
- පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන
- මටලු ආශ්‍රිත නිෂ්පාදන
- පොල් තෙල් නිෂ්පාදන
- පොල් කොළ ආශ්‍රිත නිෂ්පාදන
- පොල් ගෙඩි ඇසුරෙන් විසිතුරු නිෂ්පාදන




*පොල් සංවර්ධන අධිකාරියේ ප්‍රදර්ශන කුටිය වෙත පැමිණි ජනතාව*

මෙයට අමතරව කොහු නිස්සාරණ යාන්ත්‍රණය, පොල් කටු විමිනි ආදර්ශ මෙම ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන ලදී.

තවද දැයට කිරුළ ප්‍රදර්ශනයේ පැවති සියලු ප්‍රදර්ශන කුටි අතරින් Educational and Natural Exhibit Stall යන තේමාව යටතේ 4 වන ස්ථානය පොල් සංවර්ධන අධිකාරිය විසින් දිනා ගන්නා ලදී.

# 2. තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය

තත්ත්ව පාලන කටයුතු පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් අපනයන තොගවල ගුණාත්මකභාවය සහතික කිරීම, විවිධ ඉල්ලුම්කරුවන්ගේ අවශ්‍යතා පරිදි පරීක්ෂණ පහසුකම් සැපයීම සහ පොල් නිෂ්පාදන දේශීය වෙළඳපොළට යොමු වීමේදී පරීක්ෂා කොට සහතික නිකුත් කිරීම සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන උසස් මට්ටමක පවත්වා ගැනීම සඳහා උපදේශකත්වයන් සැපයීම තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශයේ ප්‍රධාන වගකීමයි.

අංශයේ කාර්යයන්;

- **අපනයනය සඳහා යොමු වන දිසිදි පොල් නිෂ්පාදනයන් පරීක්ෂා කිරීම හා තත්ත්වය සහතික කිරීම**

  පොල් නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම මද ආශ්‍රිත නිෂ්පාදනය වන දිසිදි පොල් කර්මාන්තය ප්‍රධාන වශයෙන් මනා තත්ත්ව පාලනයකට යොමුකරන අතර දෛනික දිසිදි පොල් නිෂ්පාදන සියල්ල තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේදී දිනපතා පරීක්ෂාවට භාජනය කෙරේ. අපනයනය සඳහා යොමු වන මෙම නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික නිකුත් කිරීම පිණිස මෙම පරීක්ෂණ ප්‍රතිඵල දායක වේ.

- **පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන්නන්, අපනයනකරුවන් හා පාරිභෝගික ජනතාව වෙනුවෙන් ඉටු කරනු ලබන සේවාවක් ලෙසට රසායනාගාර පරීක්ෂණ සේවා, සහන ගාස්තු ක්‍රමයක් යටතේ සිදුකිරීම.**

  ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන ප්‍රමිතීන් හි දැක්වෙන ක්ෂුද්‍රජීවී හා භෞත රසායනික පරීක්ෂා සිදුකිරීමේ හැකියාව පොල් සංවර්ධන අධිකාරියේ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය සතු වන අතර පොල් කර්මාන්තයේ නියැළි ව්‍යවසායකයන්ගේ අභිවෘද්ධිය සඳහා සහනදායී මිලකට, කඩිනම් පරීක්ෂණ සේවාවන් ලබාදීමට සැම විටම කටයුතු කරනු ලැබේ.

- **දිසිදි පොල් නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා ක්ෂුද්‍රජීවී, භෞත රසායනික පරීක්ෂා සිදුකිරීම**

  අධිකාරියේ රසායනාගාරයේ සිදුකරන පරීක්ෂා හැරුණු කොට ජංගම රසායනාගාර සේවා මඟින් පොල් නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම හා නිෂ්පාදනයන්හි උසස් ප්‍රමිතියක් පවත්වා ගැනීම සඳහා ක්ෂුද්‍රජීවී සහ රසායනික පරීක්ෂා සිදුකරනු ලැබේ.

මීට අමතරව;

- ♦ පොල් නිෂ්පාදන සිදුකරනු ලබන කර්මාන්තශාලා සඳහා තාක්ෂණික සහය ලබාදීම, කර්මාන්තශාලා පරීක්ෂා කිරීම සහ උපදේශක දායකත්වය සැපයීම.
- ♦ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ රසායනාගාර සඳහා ISO 17025 තත්ත්ව සහතිකය ලබා ගැනීමේ කටයුතු සිදුකිරීම.

- ක්ෂුද්‍රජීවී විෂගතවීම් වැනි තත්ත්වයන් හමුවේ පොල් මද ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තශාලා විශේෂ පරික්ෂාවට (Swab tests) භාජනය කිරීම සහ රසායනාගාර පරික්ෂා සිදුකර උපදේශකත්වය සැපයීම.

- පොල් තෙල් කර්මාන්තය සෞඛ්‍යාරක්ෂිතව පවත්වා ගැනීම හා නගාසිටුවීම අරමුණු කරගනිමින් පොල් තෙල් නිෂ්පාදනාගාරයන් හි සෞඛ්‍යාරක්ෂිතභාවය පරික්ෂා කිරීමත් පොල් තෙල් නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය වන කොප්පරා, නිෂ්පාදිතය වන පොල් තෙල් හා එහි අතුරුඵලය වන පුන්නක්කු ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුකූල වන්නේදැයි පරික්ෂා කිරීම.

- දේශීය වෙළඳපොළෙහි පවතින පොල් තෙල් නිෂ්පාදනයන්හි තත්ත්වයන් පරික්ෂා කිරීම සිදුකරන අතර හඳුනාගත් මිශ්‍ර පොල් තෙල් විකුණුම්කරුවන් පිළිබඳ විස්තර පාරිභෝගික කටයුතු පිළිබඳ වන පාරිභෝගික අධිකාරිය සහ ආහාරමය ද්‍රව්‍ය සඳහා පාලනමය බලතල ඇති ආයතනය වන සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන ඒකකය වෙත සපයා එකී ආයතන සමඟ එක්ව කටයුතු කර මිශ්‍ර පොල් තෙල් අනුභවයෙන් පාරිභෝගික ජනතාව රැකගැනීම සඳහා සේවාවන් සැපයීම.

- පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධව පැන නැගෙන දේශීය හා විදේශීය පැමිණිලි හමුවේ නිෂ්පාදන පරික්ෂණ සිදුකිරීම.

- පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හි වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන්, ප්‍රදර්ශන සඳහා සහභාගී වීම.

- ආහාරමය වෙනත් නිෂ්පාදන පරීක්ෂා කිරිමේ සේවාවන් පවත්වා ගෙන යාම.

- ජල විශ්ලේෂණ කාර්යයන් සිදුකිරීම.

- වර්තමානයේ පවතින ශ්‍රී ලංකා ප්‍රමිතීන් යාවත්කාලීන කිරීම සහ දැනට ප්‍රමිතීන් නොමැති පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ප්‍රමිති සැකසීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ සම්බන්ධ වී වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

- පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ පවතින රසායනාගාරයන්හි සේවයේ නියුතු කාර්යය මණ්ඩලය උදෙසා පුහුණු වැඩ සටහන් පැවැත්වීම.

මේ අනුව පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය විසින් හඳුන්වාදී ඇති, කප්රුක නාවෝදාව, ජාතික පොල් සංවර්ධන සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා පොල් සංවර්ධන අධිකාරියෙහි තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින්, ක්‍රියාකාරී සැලැස්මට අදාළව ප්‍රගතීන් අත්කර ගෙන ඇත.

එකී සැලැස්මට අදාළව ගුණාත්මක පොල් නිෂ්පාදන බිහිකිරීමත්, ඒ අනුව දේශීය හා විදේශීය වෙළඳපළ වර්ධනය වීමත් අපේක්ෂා කරමින් පොල් නිෂ්පාදන පරික්ෂා කිරීම තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් සිදුකර ඇත. මෙම සේවාව වඩාත් ප්‍රමිතියානුකූලව සැපයීම සඳහා රසායනාගාරය වෙනුවෙන් ISO 17025 තත්ත්ව සහතිකය ලබා ගැනිමේ කාර්යයන් ආරම්භ කර ඇත.

## 2.1 අපනයනය සහ දේශිය පරිභෝජනය සඳහා යොමු වන පොල් නිෂ්පාදනයන්හි තත්ත්වය සහතික කිරීම


### 2.1.1 පොල් නිෂ්පාදනයන්හි පූර්ව අපනයන ක්ෂුද්‍ර ජීවි විශ්ලේෂණ සිදුකිරීම සහ සහතික කිරීම

පොල් මද ආශ්‍රිත නිෂ්පාදනයන්හි පරීක්ෂණ කටයුතු ප්‍රධාන වශයෙන් සිදුවන්නේ දිසිදි පොල් සඳහා වේ. දිසිදි පොල් නිෂ්පාදනාගාරයන්හි සිදුවන දෛනික නිෂ්පාදන, සැල්මොනෙල්ලා පරික්ෂාවට භාජනය කිරීම, තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ ක්ෂුද්‍රජීවි රසායනාගාරයේදී සිදුකෙරේ. මේ අනුව අපනයනය සඳහා යොමුවන දිසිදි පොල් නිෂ්පාදනයන් සියල්ල තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ රසායනාගාරයේදී පරික්ෂාවට භාජනය කෙරේ. පොල් ඵලදාව, පොල් ගෙඩිවල ප්‍රමාණය හා පොල් මිල හා විදෙස් වෙළඳපොළෙහි දිසිදි පොල් මිල මත දේශීය දිසිදි පොල් නිෂ්පාදනය රඳා පවතින අතර එම නිෂ්පාදන ප්‍රමාණය මත ආදර්ශ රසායනාගාරයට ලැබීම රඳා පවතී.


2012 වර්ෂයේදී සැල්මොනෙල්ලා පරික්ෂණ සඳහා යොමු වූ දිසිදි පොල් ආදර්ශ ප්‍රමාණය 2011 වර්ෂය සමඟ සැසඳූ කළ අඩුවීමක් පෙන්නුම් කරයි. මෙයට ප්‍රධානතම හේතුව 2012 වසරේ දිසිදි නිෂ්පාදනය අඩුවීම බව පැහැදිලි වේ.

| වසර | දිසිදි නිෂ්පාදනය | රසායනාගාරයට ලැබී ඇති ආදර්ශ ගණන |
|---|---|---|
| 2011 | 46,620.477 | 10,223 |
| 2012 | 41,647.384 | 9,381 |

2012 වසර සඳහා ආදර්ශ 9500ක ඉලක්කයක් තිරණය කරන ලදී. ඒ අනුව 2012 වසරේදී මෙම පරික්ෂණ වෙනුවෙන් ලබා ඇති ප්‍රගතිය 98% කි.




2011 වසරේදී පරික්ෂාවට භාජනය කළ දිසිදි පොල් නිෂ්පාදන අතුරින් ආදර්ශ 21ක් සැල්මොනෙල්ලා විෂගතවීම වාර්තා විය. ප්‍රතිශතයක් ලෙස සම්පූර්ණ විෂගතවීම් 0.20%කි. 2012 වසරේදී විෂගතවීම ආදර්ශ 08කි. 2012 වසරේදී පරික්ෂාවට භාජනය කළ ආදර්ශයන්හි ප්‍රතිශතයක් ලෙස ගත්කල මෙය 0.08% වන අතර විෂගතවීමෙහි අඩුවීමක් පෙන්නුම් කෙරේ. මෙමගින් නිෂ්පාදන තත්ත්වයන් හි සෞඛ්‍යාරක්ෂිත භාවයෙහි වර්ධනයක් පෙනී යයි.




| වසර | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|
| විෂගතවීම් ප්‍රතිශතය | 0.50% | 0.10% | 0.12% | 0.12% | 0.2% | 0.08% |

පූර්ව අපනයන විශ්ලේෂණය සිදුකිරීම සඳහා මද නොවන නිෂ්පාදන අතුරින් ප්‍රමුඛත්වය ගනු ලබන්නේ කොහු බත් ආශ්‍රිත නිෂ්පාදනයයි. 2011 වසරේදී ආදර්ශ 640ක් පරික්ෂා කර ඇති අතර 2012 වසරේදී ආදර්ශ 645ක් පරික්ෂා කර ඇත. 2012 වර්ෂයේදී කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන වාර්ෂික ඉලක්කයට සාපේක්ෂව, වැඩි ප්‍රමාණයක් පරික්ෂා සඳහා භාජනය වී ප්‍රගතිය 108%ක් ලෙස වාර්තා වී ඇත.




### 2.1.2 පොල් නිෂ්පාදනයන්හි පූර්ව අපනයන භෞත රසායනික පරික්ෂා සිදුකිරීම සහ සහතික කිරීම

දෛනික දිසිදි පොල් ආදර්ශ, විශේෂ අපනයන පරික්ෂා මාර්ස් / ඇමරිකානු අපනයන, දිසිදි පොල් නැවත සාම්පල් කිරීම, නැවත සැකසූ දිසිදි පොල් ආදර්ශ, විශේෂ දෛනික ආදර්ශ, පැරණි තොග ආදර්ශ කිරීම, මේදය ඉවත් කළ දිසිදි පොල් යන ආදර්ශයන් වර්ෂය තුළදී විශ්ලේෂණයට භාජනය වී ඇත.

**භෞතික හා සංවේදී පරික්ෂා ලෙස;**

දිසිදි පොල් හි වර්ණය, කැටිති ප්‍රමාණය, තෙතමනය, රස, සුවඳ, අපද්‍රව්‍ය, කුරුටු, තෙල් බේරී ඇත්ද යන පරික්ෂා ප්‍රධානව සිදුකර ඇත. මේ අනුව 2011 වසරේදී ආදර්ශ 10,307ක් පරික්ෂා කර ඇති අතර 2012 වසරේදී ආදර්ශ 9381ක් පරික්ෂා කර ඇත. 2012 වසරේ ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය 99%කි.




2011 වර්ෂය තුළ පරික්ෂණයට භාජනය කළ දිසිදි ආදර්ශ 10,307 අතුරින් ආදර්ශ 223ක් එනම් 2.2%ක් භෞතික ලක්ෂණයන්හි අඩුපාඩු පෙන්නුම් කරන ලද අතර 2012 වර්ෂයේදී පරික්ෂා කළ ආදර්ශ 9,381න් ආදර්ශ 180 එනම් 1.9%ක් එම අඩුපාඩු පෙන්වා ඇත. භෞතික ලක්ෂණයන්හි අඩුපාඩු සුළු ප්‍රමාණයකින් 2012 වර්ෂයේදී පහත වැටී ඇත. එනම් භෞතික ලක්ෂණ අඩුපාඩු සහිත ආදර්ශ අඩු වශයෙන් වාර්තාවීම යහපත් ප්‍රවණතාවයකි.

ආන්තික තත්ත්ව දෝෂ එනම් උපරිම අනුමත සීමාවේ පවතින දිසිදි ආදර්ශ ප්‍රමාණය 2012 වර්ෂයේදී ප්‍රතිශතය 7.1%කි. මෙය 2011 වර්ෂයේදි 9.9%ක ප්‍රතිශතයක් වූ අතර සාපේක්ෂව අඩු ආන්තික තත්ත්ව දෝෂ ප්‍රමාණයක් 2012 වර්ෂයේදී වාර්තා වී ඇත. ආන්තික දෝෂයක් සහිතව නිෂ්පාදන සිදුවුවහොත් නිෂ්පාදන දෝෂ ඇති වී නිෂ්පාදිතය ප්‍රමිතියානුකූල නොවීමට ඉඩකඩ ඇති බැවින් මෙවැනි ආදර්ශ පිළිබඳ කඩිනමින් වාර්තා නිකුත් කර නිෂ්පාදන ක්‍රියාවලිය සකස් කර ගැනීම සඳහා සැකසුම් සංවර්ධන අංශය හරහා නිෂ්පාදනකරුවන් වෙත අඩුපාඩු දැනුම් දීමට කටයුතු කරනු ලැබේ.

අපනයනය කරනු ලබන දිසිදි පොල් අතුරින් ඇමරිකානු අපනයනය සඳහා යොමුවූ දිසිදි ආදර්ශ 02ක් 2011 වර්ෂය සඳහා ලැබී ඇත. 2012 වසර සඳහා මෙම පරීක්ෂණයන්ට ආදර්ශ 185ක් ලැබී ඇති නමුත් ඇමරිකානු අපනයනය සඳහා ප්‍රමිතියානුකූලව එකඟවූ ආදර්ශ 107ක් පමණක් සමත්වී ඇත. මාර්ස් නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ලෙස භාවිතා කිරීම පිණිස අපනයනය කරනු ලබන දිසිදි පොල් ආදර්ශ 53ක් 2011 වසරේදි ලැබී ඇති අතර 2012 වසර සඳහා මෙවැනි ආදර්ශ 77ක් පරික්ෂා කර ඇත. 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදි ඇමරිකානු අපනයන මෙන්ම මාර්ස් නිෂ්පාදන වෙනුවෙන් යොමුවන දිසිදි අපනයනයද සාපේක්ෂව ඉහල ගොස් ඇති බව පෙනේ.


## 2.2 පොල් ආශ්‍රිත නිෂ්පාදන පරික්ෂා කිරිමේ සේවා පවත්වා ගැනීම

දේශිය නිෂ්පාදකයන්ගේ විවිධ පොල් නිෂ්පාදන විශ්ලේෂණය කිරිම, සේවාවක් වශයෙන් පවත්වා ගැනීම තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් සිදුකරයි. ක්ෂුද්‍රජීවි පරික්ෂාවන්, රසායනික පරික්ෂාවන්, භෞතික පරික්ෂාවන් සහ සංවේදි පරික්ෂාවන් මේ යටතේ සිදු කෙරේ. මෙම සේවාව සාධාරණ මිලකට, සිදුකරන අතර ඉල්ලුම්කරුගේ අවශ්‍ය පරාමිතීන්ට අදාලව පරික්ෂා කර වාර්තා නිකුත් කරනු ලැබේ. පොල් ආශ්‍රිත නිෂ්පාදනකරුවන්, පාරිභෝගික ජනතාව, සුළු, මධ්‍යම හා මහා පරිමාණ වෙළඳ මහතුන් සහ අපනයන කරුවන් ආදී වූ ඕනෑම කාණ්ඩයක් සඳහා පොල් ආශ්‍රිත නිෂ්පාදන පරික්ෂා කිරිමේ සේවාව ලබා දෙනු ලැබේ.

අපනයනකරුවන්ගේ විශේෂ ඉල්ලිම් මත දිසිදි පොල් සඳහා සිදුකරනු ලබන පරික්ෂා මද වශයෙන් මේදය ඉවත් කල දිසිදි පොල්, කොප්පරා, පොල් කෙඳි, පොල් තෙල්, පුන්නක්කු, කොහු බත් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සහ පොල් කිරි හා කිරි ආශ්‍රිත වෙනත් නිෂ්පාදන ආදි වූ විවිධ පොල් නිෂ්පාදන ද්‍රව්‍යයන් ශ්‍රී ලංකා ප්‍රමිතියට අදාලව පරික්ෂා කිරිමේ සේවාව පවත්වා ගෙන යනු ලැබේ. මේ සඳහා අවශ්‍ය වන නවීන රසායනාගාර උපකරණ, තත්ත්ව පාලන අංශය සතු වන අතර කඩිනම් ප්‍රතිඵල ලබාදීම තත්ත්ව පාලන අංශයෙන් සිදුකරනු ලැබේ.

ප්‍රමිතියානුකූල ලෙස පොල් ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම හා පරික්ෂා කර එහි තත්ත්වයන් පිළිබඳව අවබෝධය ලබා ගැනිම උදෙසා නිෂ්පාදකයින් දිරිගැන්වීම සඳහාත්, ශ්‍රී ලාංකික භාවය රැකෙන පරිදි තත්ත්වයෙන් උසස් පොල් නිෂ්පාදන නිරතුරුව විදේශිය වෙළඳපළ කරා යොමු කරවීම පිණිස අපනයන කරුවන් දිරිගැන්වීම සඳහාත්, පොල් සංවර්ධන අධිකාරියෙහි ඉහත කී ලියාපදිංචි ආයතන සඳහා වට්ටම් ගාස්තුවක් යටතේ මෙම පරික්ෂණ කඩිනමින් සිදුකරනු ලැබේ.

පරික්ෂා කර ගැනීම සඳහා පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ප්‍රධාන වශයෙන් යොමුවන අතර 2011 වසරේදී ආදර්ශ 293ක් පරික්ෂා කර ඇත. 2012 වසර තුළ ඉල්ලුම්කරුවන්ගේ අවශ්‍යතාවය මත පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ආදර්ශ 766ක් විශ්ලේෂණයකර ඇති අතර ඉලක්කය වන ආදර්ශ 700ට සාපේක්ෂ ප්‍රගතිය 108%කි. 2012 වසරේදි පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ආදර්ශ 766 අතුරින් සල්ෆඩයොක්සයිඩ් හා ඇෆ්ලටොක්සින් සඳහා පමණක් දිසිදි ආදර්ශ 452ක් විශ්ලේෂණය කර ඇත. මෙය පරික්ෂා කළ මුළු ආදර්ශ ප්‍රමාණයෙන් 59.7%කි. සෙසු පරික්ෂා පහත දැක්වේ.




| වර්ෂය | විශේෂ දිසිදි පොල් (ආදර්ශ) | පුන්නක්කු (ආදර්ශ) | පොල් තෙල් (ආදර්ශ) | කොප්පරා (ආදර්ශ) | මද මේදය ඉවත් කරන ලද දිසිදි පොල් (ආදර්ශ) | ගෙඩි පොල් | පොල් ක්‍රීම්/ පිටි | මුළු ආදර්ශ ගණන (ආදර්ශ) |
|---|---|---|---|---|---|---|---|---|
| 2012 | 82 | 33 | 86 | 15 | 95 | 01 | 02 | 314 |
| 2011 | 80 | 07 | 78 | 04 | 124 | -- | -- | 293 |

අංශයේ පහසුකම් පුළුල් කිරීම හේතුවෙන් පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයෙන් බැහැරව වෙනත් නිෂ්පාදන ද පරීක්ෂා කිරීම සිදුකර ඇති අතර වට්ටමක් ලබා නොදුන්නද පහසු මිල ගණන් යටතේ කඩිනම් සේවයක් සැපයීමට කටයුතු කර ඇත. මේ අනුව මෙවැනි ආදර්ශ 16ක් 2012 වර්ෂය තුළ පරීක්ෂා කර ඇති අතර ජලය, තැඹිලි තෙල්, පිරිපහදුකරන ලද පාම් තෙල්, සහල්භාශීතකළ ගාගත් පොල් වැනි ආදර්ශ රසායනික පරීක්ෂා සඳහා යොමු කර ඇත. මීට අමතරව දිසිදි නිෂ්පාදනාගාරයන්ගෙන් පිටවන අප ජලය පාරිසරික ප්‍රමිතීන් හා එකඟවේද යන්න පරීක්ෂා කර වාර්තා නිකුත් කර ඇත.

## 2.3 ISO තත්ත්ව සහතිකය ලබා ගැනීම

පොල් සංවර්ධන අධිකාරියේ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය මඟින් නිකුත් කරනු ලබන පරීක්ෂණ සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් ලැබෙන පරිදි හා පරීක්ෂණ කටයුතු නිවැරදිව, විධිමත්ව හා ක්‍රමානුකූලව කරනු ලැබේ.

ඒ සඳහා පොල් තෙල් පරීක්ෂණ ක්‍රමවේදයන් සඳහා තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ රසායනික විශ්ලේෂණඅංශය විසින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මඟින් පිරිනමනු ලබන ISO 17025 තත්ත්ව සහතිකය, 2012.06.12 වන දින හිමිකර ගන්නා ලදි.





SLAB

SRI LANKA ACCREDITATION BOARD

Certificate of Accreditation

Sri Lanka Accreditation Board for Conformity Assessment hereby declares that

Chemical Laboratory of Quality Control and Quality Assurance Division Coconut Development Authority

having being found to comply with the accreditation criteria for testing/calibration laboratories as described in ISO / IEC 17025 :2005,has been accredited as a testing laboratory under the field of

Chemical Testing

and has been assigned the accreditation number

TL 030-01

This certificate is issued on 12 June 2012 and is valid until

11 June 2015

The accreditation was granted for the first time on 12 June 2012

The scope and conditions of accreditation are specified in the Schedule of Accreditation bearing the accreditation number appearing in this certificate.

Director / CEO
Sri Lanka Accreditation Board for Conformity Assessment
Colombo, Sri Lanka

පොල් තෙල් සඳහා පළමු සුපරීක්ෂණ පරීක්ෂණය (1st Surveillance) පවත්වා එම වාර්තා ද ක්ෂුද්‍රජීවී රසායනාගාරය සඳහා මූලික විගණන කටයුතු පවත්වා ක්ෂුද්‍රජීවී රසායනාගාරයේ සැල්මොනෙල්ලා, සම්පූර්ණ ඝණාවාස සංඛ්‍යාව, දිලීර හා පුස් සංඛ්‍යාව, කොලිෆෝම් සංඛ්‍යාව, ඊ. කෝලයි සංඛ්‍යාව සඳහා ISO ප්‍රමිතිය ලබා ගැනීම සඳහා එහි වාර්තා ද සමඟ අයදුම්පත් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙත යොමුකර ඇත. භෞතික ප්‍රගතිය 2012 වසර සඳහා 100%ක් අත්කර ගෙන ඇත.

### 2.3.1 පුහුණු වැඩසටහන් පැවැත්වීම

තත්ත්ව පාලන අංශයේ ආරම්භ කර ඇති ISO තත්ත්ව සහතික ලබා ගැනීමේ කටයුතු සඳහා සහ නව ව්‍යාපෘති යටතේ කාලීනව හඳුන්වා දී ඇති පොල් නිෂ්පාදන පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන පුහුණු වැඩ සටහන්, රසායනාගාරයේ සේවක පිරිස වෙනුවෙන් ලබාදී ඇති අතර වෙනත් බාහිර රසායනාගාරයන්හි සේවක පිරිස සඳහා තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් පුහුණු වැඩ සටහන් පවත්වා ඇත.

**තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ රසායනාගාර සේවක මණ්ඩලය සඳහා පුහුණුවීම්**

| | පුහුණු වැඩසටහන | සහභාගී වූ සේවක සංඛ්‍යාව |
|---|---|---|
| 1. | Seminar on new food Hygiene Regulations | 01 |
| 2. | Training programme on statistical process control (SPC) sampling techniques and inspection for ISO 9001 quality Management system | 01 |

| | පුහුණු වැඩසටහන | සහභාගී වූ සේවක සංඛ්‍යාව |
|---|---|---|
| 3. | Seminar on Agilent spectroscopy | 01 |
| 4. | සේවක ඵලදායිතාව ඉහළ නැංවීම | 06 |
| 5. | Detection and enumeration of international enterococci in water and food | 03 |
| 6. | Seminar on Accreditation supporting safe food and clean drinking water | 02 |

## 2.4 අපනයනය සඳහා නිෂ්පාදනය වන පොල් නිෂ්පාදන කර්මාන්තයන්හි තත්ත්වය සුරක්ෂිත කිරීම

දිසිදි පොල් නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා ක්ෂුද්‍රජීවි භෞත රසායනික පරික්ෂා සිදුකිරීම, කර්මාන්තශාලා පරික්ෂා කිරීම සහ උපදේශක දායකත්වය සැපයීම. මේ යටතේ සිදුකරනු ලබන කාර්යයන් වේ.

දිසිදි පොල් නිෂ්පාදනාගාරයන්හි තත්ත්ව ආරක්ෂණ කටයුතු නිසි පරිදි පවත්වා ගැනීම සඳහා, මාසයක කාලයක් තුළ සියලුම දිසිදි පොල් මෝල් ආවරණය වන පරිදි සකස් කර ගත් පූර්ව වැඩසටහන් සැලැස්මකට අනුව ජංගම රසායනාගාරය යොදවා ඉහත කී සේවාවන් ක්‍රියාවට නැංවේ. පවතින සේවක සංඛ්‍යාව හා රජයේ අනුමත අතිකාල ආදී වු ගෙවීම් සීමාව තුළ රුදෙමින් රසායනාගාරයේ දෛනික පරික්ෂණ කටයුතු සඳහා අවහිරයක් නොවන පරිදි මෙම කර්තව්‍යයන් මනා සැලැස්මකින් යුතුව සිදුකරනු ලැබේ. 2011 වර්ෂය සඳහා ක්ෂේත්‍ර පරික්ෂා 494ක් සිදුකර ඇති අතර 2012 වර්ෂය තුළ ක්ෂේත්‍ර පරික්ෂා 419ක් පැවැත්වීමට හැකියාව ලැබී ඇත. 2012 වසරේ ඉලක්කයට සාපේක්ෂ ප්‍රගතිය 105%කි.

දිසිදි පොල් නිෂ්පාදන තත්ත්වය වැඩි දියුණු කිරිම සඳහා ක්ෂුද්‍රජීවි පරික්ෂා සිදුකිරිම 2011 වර්ෂය සඳහා ආදර්ශ 413 වන අතර 2012 වර්ෂය සඳහා ආදර්ශ 311කි. 2011 වසරේදී 2012 වසරට සාපේක්ෂව ඉහළ දිසිදි නිෂ්පාදනයක් පැවති හෙයින් ඒ අනුව පරික්ෂණ සංඛ්‍යාවද වැඩිවී ඇත. එසේ වුවද 2012 වසරේදී ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය 99%කි.

තවද දිසිදි පොල් නිෂ්පාදනයේදී භාවිතා කරනු ලබන ජලය නිසි ප්‍රමිතියෙහි පවතින්නේද යන්න පරික්ෂා කිරිම සඳහා එම ජලයේ ක්ෂුද්‍රජීවී, රසායනික හා බැරලෝහ විශ්ලේෂණය සිදුකරනු ලැබේ. ක්ෂුද්‍රජීවී හා රසායනික විශ්ලේෂණ ආදර්ශ 206ක් පරික්ෂා කර ඇති අතර (ඉලක්කයට සාපේක්ෂ ප්‍රගතිය 103%) බැරලෝහ විශ්ලේෂණය සඳහා ජල ආදර්ශ 86ක් පරික්ෂා කර ඇත. මෙම ආදර්ශයන්හි බැර ලෝහ වර්ග 7 බැගින් පරික්ෂණ 616ක් සිදුකර ඇත.

## 2.5 පොල් තෙල් කර්මාන්තය නගාසිටුවීම

### 2.5.1 මිශ්‍ර පොල් තෙල් පිළිබඳ වෙළඳපොළ අධීක්ෂණ කටයුතු

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් හි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ආහාරයක් වශයෙන් පොල් තෙල් වල ඇති සෞඛ්‍යාරක්ෂිත ගුණය පිළිබඳව හා එම නිෂ්පාදන ප්‍රමිතියානුකූලව නිපදවීම සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය මෙන්ම, තත්ත්වය බාලවීමකින් තොරව වෙළඳපළට යොමු වීම, අරමුණුකර ගනිමින් තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් පරීක්ෂණ හා සමීක්ෂණ කාර්යයන් සිදුකර ඇත.

මිශ්‍ර පොල් තෙල් පිළිබඳ ලැබී ඇති විශ්ලේෂණ ප්‍රතිඵල සෞඛ්‍ය අමාත්‍යාංශය සහ පාරිභෝගික අධිකාරිය වෙත ලබාදී නීතිමය ක්‍රියාදාමයන් මඟින්, පිරිසිදු පොල් තෙල් ලෙස මිශ්‍ර පොල් තෙල් වෙළඳාම සිදුකරන වෙළඳසැල් යම් පාලනයකට යටත් කිරිමට දායකවී ඇත.

දිවයිනේ දිස්ත්‍රික්කමය වශයෙන් වෙළඳපළෙහි පවතින පොල් තෙල් ආදර්ශ රැස්කොට ඒවා මිශ්‍ර පොල් තෙල් වේ දැයි විමර්ශනය කිරීම සඳහා විශ්ලේෂණයන් නොකඩවා පැවැත්වීම 2012 වසරේද සිදුකර ඇති අතර කුඩා, මධ්‍යම හා මහා පරිමාණ වෙළඳසැල් සියල්ල ආවරණය වන පරිදි විධිමත්ව මෙම අධීක්ෂණ කටයුතු සිදුකර ඇත. එසේම පාරිභෝගික අධිකාරිය හා එක්ව වෙළඳපොළ පොල් තෙල් ආදර්ශ රැස්කර එම ආදර්ශ පරීක්ෂා කර ප්‍රතිඵල ලබාදී ඉහත කී කාර්යය සඳහා දායකවී ඇත. 2012 වසරේදී ආදර්ශ 96ක් පරීක්ෂා කර, මිශ්‍ර පොල් තෙල් වාර්තාවීමේ ප්‍රතිශතය 28% ක් ලෙස පැවති අතර 2011 වසරේදී සිදුකරනු ලැබූ මෙවැනි පරීක්ෂණ ප්‍රමාණයෙන් 39%ක් වැනි අධික ප්‍රතිශතයක් මිශ්‍ර පොල් තෙල් ලෙස වාර්තාවී ඇත. ඒ අනුව 2012 වසර තුළ පොල් තෙල් මිශ්‍ර කිරිමෙහි පසුබෑමක් පෙනී යයි. පොල් තෙල් කර්මාන්තයේ පැවැත්ම සඳහාත්, පරිභෝගික ජනතාව කෙරෙහිත් මෙය යහපත් ප්‍රවණතාවයකි.

### 2.5.2 පොල් තෙල් කර්මාන්තයේ තත්ත්වය වැඩි දියුණු කිරීම

පොල් තෙල් නිෂ්පාදනය ප්‍රමිතියානුකූල තත්ත්වයට පත්කිරීම සඳහා පොල් තෙල් මෝල් ආශ්‍රිතව තත්ත්ව පාලන වැඩසටහන් ක්‍රියාවට නංවන ලදී. මේ අනුව පොල් තෙල් නිෂ්පාදනයේ අමුද්‍රව්‍යය වන කොප්පරා නිසි ප්‍රමිතියෙන් පවතීද යන්නත්, නිෂ්පාදනය කරනු ලබන පොල් තෙල් ගුණාත්මක තත්ත්වයේ පවතීද යන්නත්, පොල් තෙල් නිස්සාරණය කාර්යක්ෂමව සිදුවේද යන්නත් අධ්‍යයනය කිරීම සඳහා පිළිවෙළින් කොප්පරා, පොල් තෙල් හා පුන්නක්කු ආදර්ශයන් පොල් තෙල් නිෂ්පාදනාගාර ආශ්‍රිතව රැස්කර පරීක්ෂණ ප්‍රතිඵල නිකුත් කර ඇත. මේ අනුව 2012 වර්ෂය සඳහා පොල් තෙල් ආදර්ශ 100ක්ද, කොප්පරා ආදර්ශ 60ක්ද, පුන්නක්කු ආදර්ශ 100ක්ද පරීක්ෂා කර ඇති අතර 2012 ඉලක්කයට සාපේක්ෂව මෙකී සියලු පරීක්ෂණයන්හි ප්‍රගතිය 100%ක් ලෙස ලබා ඇත. ගාල්ල, මාතර, හම්බන්තොට, පුත්තලම, කුරුණෑගල, ගම්පහ, කොළඹ යන දිස්ත්‍රික්කවලින් ලබාගත් ආදර්ශවල ප්‍රතිඵල ප්‍රමිතිය හා එකඟ නොවීම සම්බන්ධව

සැකසුම් සංවර්ධන අංශය හරහා නිෂ්පාදන කරුවන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**වෙනත් බාහිර ක්‍රියාකාරකම්**

පොල් නිෂ්පාදන ක්ෂේත්‍රය ප්‍රමුඛව, සෙසු පරික්ෂණ අවශ්‍යතා සඳහා පොල් සංවර්ධන අධිකාරියේ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ දායකත්වය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම උදෙසා අනුරාධපුරයේ පැවති දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය සඳහා 2012 වර්ෂයේදි සහභාගී වී ඇත.





2013 වසරේදි අම්පාර ප්‍රදේශයේ පැවැත්වීමට නියමිත දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට පූර්වගාමීව පහත දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයන්හි පවතින වෙළඳසැල් හි මිශ්‍ර පොල් තෙල් අධික්ෂණ කටයුතු සිදුකර ඇත.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | රැස්කල මුළු ආදර්ශ ගණන |
|---|---|---|
| ත්‍රිකුණාමලය | කන්තලේ, තම්පලාකාමම්, ත්‍රිකුණාමලය, කින්නියා, මුත්තූර්, සේරුවිල, එච්චලම්පත්තෙයි, කුච්චවේලි, මොරවැව, පදවි ශ්‍රී පුර, ගෝමරන්කඩවල | 22 |
| පොලොන්නරුව | හිගුරග්ගොඩ, ඇලහැර, තමන්කඩුව, මැදිරිගිරිය, ලංකාපුර, දිඹුලාගල, වැලිකන්ද | 19 |
| මඩකලපුව | එරාවූර් පත්තු, එරාවූර් නගරය, කාත්තන්කුඩි, ඔඩ්ඩමාවෙඩි, වාලච්චේන, කෝරලෙයි පත්තු උතුර, මන්මුනෙයි උතුර, අරෙයිපත්තු, මන්මුනෙයි දකුණ හා එරුවාවිල්පත්තු, මන්මුනෙයි නිරිත, මන්මුනෙයි බටහිර, පෝරටිව් පත්තු | 36 |

**මූලධ්‍ය වියදම්**

තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ මූලධ්‍ය වියදම් වශයෙන් ප්‍රාග්ධන සංවර්ධන අරමුදල යටතේ ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. මෙම මුදල් වැය කර රසායනාගාර පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍යවන රසායනාගාර උපකරණ මිලදී ගැනීම, නවීකරණ කටයුතු, අළුත්වැඩියා සිදුකිරීම්, ISO තත්ත්ව සහතික ලබා ගැනීමේ කාර්යයන් ආදිය සඳහා වැය කෙරේ. 2012 වර්ෂය සඳහා රු. මිලියන 8.5ක මුදලක් අනුමත වූ අතර ඉහත කාර්යයන් සිදු කිරීමට ප්‍රතිපාදන වැය වීම සිදුවී ඇත.

පුනරාවර්තන වියදම් යටතේ ප්‍රධාන වශයෙන් රසායනාගාර පරීක්ෂණ සඳහා අවශ්‍ය වන වීදුරු භාණ්ඩ, ක්ෂුද්‍ර ජීවී මාධ්‍ය, රසායනික ද්‍රව්‍ය යනාදිය මිලදී ගන්නා අතර සේවක භවතුන්ගේ වැටුප් සහ සෙසු වියදම් සඳහා අංශයට වෙන්වී ඇති ප්‍රතිපාදන වැය වීම සිදුවී ඇත.

# 3. අලෙවි සංවර්ධන සහ පර්යේෂණ අංශය

පොල් සංවර්ධන අධිකාරියේ පරමාර්ථ සපුරාලීම වෙනුවෙන් එහි ප්‍රධාන අංශයක් වන අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් 2012 වසරේදී විවිධ කාර්යයන් ඉටුකරන ලදි. මෙහිදී පොල් කර්මාන්ත නිෂ්පාදන, අලෙවි සහ අනිකුත් සේවාවන්වල නියැලි කොටස්කරුවන්ගේ සහ පාරිභෝගිකයින්ගේ අවශ්‍යතාවයන් වෙත අවධානය යොමු කරන ලදී. ඔවුන්ගේ අදහස් සහ අවශ්‍යතාවයන් මත ක්ෂේත්‍රයේ දියුණුව සහ ඉදිරිගමන වෙනුවෙන් ස්ථාවරභාවයෙන් කටයුතු කරන ලද අතර එමගින් ලාංකීය ආර්ථිකයට (දේශීය හා විදේශීය වෙළඳාම තුළින්) දායක වීම මෙම අංශයෙන් කරන ලදී.

අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මගින් 2012 වසරේදී කරන ලද කාර්යයන්,

- දේශීය හා ජාත්‍යන්තරව පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධන කටයුතු
- පරිසර හිතකාමී පොල් නිෂ්පාදනයන් භාවිතයට සහ පරිභෝජනයට ජනතාව යොමුකිරීම
- පොල් භාවිතයේදී සිදුවන නාස්තිය අවම කිරීම සඳහා පාරිභෝගිකයින් දැනුවත් කිරීම මෙමගින් පොල් නිෂ්පාදන භාවිතයට මහජනතාව හුරුකිරීමෙන් පොල් කර්මාන්ත නිෂ්පාදනය ඉහල යාම තුළින් අපනයන ආදායම වැඩිකර ගත හැකිය.
- පොල් ආශ්‍රිත කර්මාන්තවල නිෂ්පාදන සඳහා වෙළඳපළ සොයාගැනීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අපනයනකරුවන්, පොල් වතු සහ වතු හිමියන්, වෙළෙඳුන්, වෙන්දේසිකරුවන් හා තැරැව්කරුවන් ලියාපදිංචි කිරීම, සමථ කිරීම හා බේරුම්කරණය සඳහා මැදිහත් වීම
- අදාළ පර්ශවයන්ට ලබාදීම සඳහා පොල් කර්මාන්ත කේෂ්ත්‍රයට අදාළ වෙළඳපළ තොරතුරු, ආයාත හා නිර්යාත තොරතුරු රැස්කිරීම සහ ප්‍රකාශයට පත්කිරීම
- පොල් සහ කොප්පරා වෙන්දේසි පැවැත්වීම
- සුළු හා මධ්‍ය පරිමාණ පොල් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදකයින් දිරිගැන්වීම සඳහාත් ඔවුන්ගේ අලෙවි කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහාත්, ඉසුරුසැල නමින් වෙළඳ කුටියක් පවත්වාගෙන යාම
- ප්‍රාදේශීයව විසිරී ඇති පොල් ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදනයට කැමැත්තෙන් සිටින්නන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතියට අදාළ අලෙවි සංවර්ධන හා පර්යේෂණ ක්‍රියාවලීන් හඳුනාගැනීම, තීරණ ගැනීම, යෝජනා කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පසුවිපරම් කිරීම

අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය ඉහත දක්වා ඇති කාර්යභාරයන් පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ වඩා වැඩි ඵලදායිතාවයක් සඳහා 2012 වසරේදී ද කාර්යක්ෂමව ඉටුකරන ලදි.

ඉහත දක්වා ඇති වැඩසටහන් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම හේතුවෙන් 2012 වසර අවසන් වන විට සමස්ත ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ අපනයන ආදායම රු. බිලියන 46 ක් බව සඳහන් කළ හැකිය.

2012 වසරේදී අලෙවි සංවර්ධන සහ පර්යේෂණ අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන් එහි ප්‍රගතියද සහිතව පහත දක්වා ඇත.

## 3.1 නිෂ්පාදකයින්ගේ හා අනාගත ගැණුම්කරුවන්ගේ ජාලයක් ඇතිකිරීම

### 3.1.1 පොල් හා පොල් ආශ්‍රිත නිමි භාණ්ඩ අලෙවිකරණ සම්බන්ධ සියල්ලන් හා පොල් වතු ලියාපදිංචිය

පසුගිය වසරවල මෙන් 2012 වසරේදී ද පොල් කර්මාන්ත ක්ෂේත්‍රයෙහි අපනයනයන්හි නියැලෙන ව්‍යවසායකයින්, අපනයනකරුවන්, පොල් හා කොප්පරා සම්බන්ධ වෙළඳුන් වෙන්දේසිකරුවන් සහ තැරැව්කරුවන් ලියාපදිංචිකිරීමේ කටයුතු සිදුකරන ලදී. මෙමඟින් ඔවුන් අතර මනා සම්බන්ධීකරණයක් සිදුකිරීමට කටයුතු සැලසිනි.

2011 සහ 2012 වසර සඳහා පහත සඳහන් අයුරු ලියාපදිංචි කිරීමේ කටයුතු සිදුකරන ලදී.

| | 2011 | 2012 |
|---|---|---|
| අපනයනකරුවන් | 508 | 566 |
| බ්‍රෝකර්වරුන් | 22 | 21* |
| වෙළඳුන් | 11 | 23 |
| පොල් වතු | 108 | 122 |

*සෑම වසරකම ලියාපදිංචිය ලබාගන්නා එක් බ්‍රෝකර්වරයෙක් මිය ගොස් ඇති හෙයින් ඔහුගේ ලියාපදිංචිය 2012 වසරට ඉදිරිපත් වී නැත. එහෙයින් 2011 වසරට සාපේක්ෂව 2012 වසරේ බ්‍රෝකර්වරුන්ගේ ලියාපදිංචිය සම්බන්ධයෙන් අඩුවීමක් පෙන්නුම් කෙරේ.

### 3.1.2 පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන වෙන්දේසි පැවැත්වීම

#### 3.1.2.1 කොළඹ ගෙඩි පොල් වෙන්දේසිය

1994 වසරේ සිට අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් සාර්ථකව පවත්වාගෙන යනු ලබන ගෙඩි පොල් වෙන්දේසිය 2012 වසරේදී පහත දක්වා ඇති අයුරින් ප්‍රගතියක් පෙන්වා ඇත.

| වසර | ගෙඩි ප්‍රමාණය | | සාමාන්‍ය මිල රු. (ගෙඩි 1000 කට) |
|---|---|---|---|
| | ඉදිරිපත් කළ ප්‍රමාණය | විකුණූ ප්‍රමාණය | |
| 2011 | 60,675,031 | 36,126,573 | 29,606.94 |
| 2012 | 86,987,442 | 46,123,219 | 22,897.10 |

2012 වසරේදී නව පිවිසුමක් ලෙස ගෙඩි පොල් වෙන්දේසිය අන්තර්ජාලය හරහා සිදුකිරීමට කටයුතු පිළියෙල කෙරෙමින් පවතී.

### 3.1.2.2 ප්‍රාදේශීය ගෙඩි පොල් වෙන්දේසිය

කොළඹට පමණක් මධ්‍යගතව පැවති ගෙඩි පොල් වෙන්දේසිය ප්‍රාදේශීයව විමධ්‍යගත කිරීමෙන් පසුව කුඩා සහ මධ්‍යම පොල් වගාකරුවන්ට තම නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබාගැනීමට හැකිවී ඇත. දැනට කුලියාපිටියේදී මෙම ප්‍රාදේශීය පොල් වෙන්දේසිය මසකට දෙවරක් පවත්වනු ලබන අතර 2012 වසරේදී 2011 වසරට සාපේක්ෂව වැඩිපුර ගෙඩි පොල් ප්‍රමාණයක් වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරන ලදි.

| වසර | ගෙඩි ප්‍රමාණය | | සාමාන්‍ය මිල රු. (ගෙඩි 1000 කට) |
|---|---|---|---|
| | ඉදිරිපත් කළ ප්‍රමාණය | විකුණූ ප්‍රමාණය | |
| 2011 | 1,816,980 | 751,410 | 27,948.03 |
| 2012 | 1,937,821 | 1,259,515 | 22,532.13 |

### 3.1.2.3 කොප්පරා වෙන්දේසිය

2012 වසරේදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් සතිපතා පවත්වන ලද කොප්පරා වෙන්දේසියේදී 2011 වසරට සාපේක්ෂව 2012 වසරේදී වැඩි කොප්පරා ප්‍රමාණයක් වෙන්දේසිකරුවන් විසින් ඉදිරිපත් කර තිබුණි.

| වසර | ඉදිරිපත් කළ ප්‍රමාණය (කි.ග්‍රෑ.) | විකුණූ ප්‍රමාණය (කි.ග්‍රෑ.) | සාමාන්‍ය මිල ගණන් (රු.කි.ග්‍රෑ 250 පාරමක් සඳහා) | |
|---|---|---|---|---|
| | | | විශිෂ්ඨ අංක 1 | විශිෂ්ඨ අංක 2 සහ 3 |
| 2011 | 457,050 | 414,340 | 39,903 | 36,267 |
| 2012 | 601,664 | 563,144 | 29,557 | 28,407 |

2011 වසරට සාපේක්ෂව 2012 වසරේදී පොල් ඵලදාවේ වැඩිවීමක් අපේක්ෂා කළ අතර එහෙයින් පොල් වෙන්දේසිය සඳහා වැඩි පොල් ප්‍රමාණයක් ඉදිරිපත්වුණි. තවද, පොල් වෙන්දේසියේදී නිෂ්පාදකයන්ට සාධාරණ මිලක් ලැබීම හේතුවෙන් වෙන්දේසිය සඳහා වැඩි පොල් ප්‍රමාණයක් ඉදිරිපත් කිරීමේ ප්‍රවණතාවයක් 2012 වසරේදී දක්නට ලැබුණි.

### 3.1.2.4 වෙළඳ ආරවුල් සම්බන්ධ කටයුතු

පොල් නිෂ්පාදන, වෙළඳ, අපනයන කාර්යයේදී වෙළඳ ආරවුල් ඇති වීම නොවැළැක්විය හැකි කරුණකි. 2012 වසරේදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් මෙම වෙළඳ ආරවුල් සමථයකට පත්කිරීම සඳහා වැඩි කාර්යය භාරයක් ඉටුකරන ලද අතර එමඟින් පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා අනගි දායකත්වයක් ලැබිණි.

### 3.1.3 පෞද්ගලික අංශයේ සහය ඇතිව අලෙවි අවස්ථා ඇති කිරීම - දේශීය වෙළඳ ප්‍රදර්ශන

පාසැල් සිසුන් හා මහජනතාව අතර පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රචලිත කිරීම සඳහා පහත සඳහන් කර ඇති ප්‍රදර්ශනයන්ට සහභාගී වීමෙන් අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් සිය කාර්යභාරය ඉටුකරන ලදී.

| ප්‍රදර්ශනයේ නම | ස්ථානය | සංවිධානය |
|---|---|---|
| 1. දැයට කිරුළ | අනුරාධපුර | මුදල් අමාත්‍යාංශය |
| 2. අවුරුදු පොළ | විශාඛා විද්‍යාලය - කොළඹ | විශාඛා විද්‍යාලය - කොළඹ |
| 3. පොල් වගා පර්යේෂණ හා කර්මාන්ත ආශ්‍රිත අධ්‍යාපනික වැඩසටහන කප්රුකයි - සිප්නැණයි | මොරටුව | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය |
| 4. පොල් වගා කරුවන්ගේ සංගමයේ වාර්ෂික වැඩසටහන | මිහිලක මැදුර - සිරිමාවෝ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව | පොල් වගා කරුවන්ගේ සංගමය |
| 5. කෘෂිකර්ම ප්‍රදර්ශනය | ගන්නෝරුව - නුවර | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 6. කර්මාන්ත හා යන්ත්‍රෝපකරණ ප්‍රදර්ශනය | සිරිමාවෝ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව | ලංකා කුඩා හා මධ්‍යම ව්‍යවසාය කර්මාන්ත මණ්ඩලය |
| 7. පොල් පැළ බෙදා හැරීමේ වැඩසටහන | බණ්ඩාරගම | පොල් වගාකිරීමේ මණ්ඩලය |
| 8. දම් ආසිරි ප්‍රදර්ශනය | ධම්මිස්සර මධ්‍ය මහා විද්‍යාලය - නාත්තන්ඩිය | ධම්මිස්සර මධ්‍ය මහා විද්‍යාලය - නාත්තන්ඩිය |
| 9. සම්ප්‍රදායික කර්මාන්ත හා වෙළඳ ප්‍රදර්ශනය (ශිල්ප 2012) | සිරිමාවෝ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව | ජාතික ශිල්ප සභාව |

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද දිවිනැගුම ප්‍රදර්ශනය සඳහා මන්නාරම, හම්බන්තොට, රත්නපුර, මහනුවර, ත්‍රිකුණාමලය, මුලතිව් හා මාතර දිස්ත්‍රික්කවලදී පොල් ආශ්‍රිත කර්මාන්ත නංවාලීම උදෙසා පොල් සංවර්ධන අධිකාරියේ සහභාගීත්වය සිදුවිය.

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය මඟින් සංවිධානය කරන ලද කප්රුක පුරවර වැඩසටහන පහත සඳහන් ප්‍රදේශවල ක්‍රියාත්මක විය. එම වැඩසටහනට ද මෙම අංශයේ සහභාගීත්වය සිදුවූ අතර එම ප්‍රදර්ශන වලදී පොල් හා පොල් ආශ්‍රිත නිපැයුම් සඳහා ලැබී ඇති ආදායම පහත පරිදි වේ.

| ප්‍රදර්ශනය පැවැත්වූ ස්ථානය | ලැබූ ආදායම (රු.) |
|---|---|
| රඹුක්කන | 1,640 |
| මඩකලපුව | 2,055 |
| මුලටියන - මාතර | 3,300 |
| බණ්ඩාරගම | 5,810 |
| මඩුල්ල | 3,225 |
| ජලතර - හෝමාගම | |
| වේවැල්පනාව | 5,805 |

**විදේශීය වෙළඳ ප්‍රදර්ශන**




පොල් ආශ්‍රිත දේශීය නිම්භාණ්ඩ සඳහා විදේශීය වෙළඳපළවල් සොයායෑමේදී විදේශීය වෙළඳ ප්‍රදර්ශන සඳහා අපනයනකරුවන්ගේ සහභාගීත්වය වැදගත් සේ සලකනු ලැබේ. මෙමඟින් විදේශ ඇණවුම් වැඩි වැඩියෙන් ලබාගැනීමටත් තරඟකාරී භාණ්ඩයන් පිළිබඳව හැදෑරීමටත් දිනෙන් දින යාවත්කාලීන වන භාණ්ඩයන්ගේ ප්‍රමිතීන් පිළිබඳව දැනුවත්වීමටත් අපනයනකරුවන්ට හැකියාව ලැබේ.

2012 වසරේදී ඇමරිකා එක්සත් ජනපදයේ පැවති "Seattle Gift Show 2012 " සඳහා පොල් සංවර්ධන අධිකාරියේ අනුග්‍රාහකත්වය පහත දක්වා ඇත.

මෙම ප්‍රදර්ශනය සඳහා කොහු බත් කැට හා වගා මලු, රබර් මිශ්‍රිත කොහු මල් පෝච්චි, බුමුතුරුණු, තවාෂි බුරුසු, තවාෂි විසිතුරු භාණ්ඩ, පොල් කටුවෙන් සාදන ලද ආභරණ හා විසිතුරු භාණ්ඩ ඉදිරිපත් කළ අතර අපනයනකරුවන් දෙදෙනෙකුට මෙම ප්‍රදර්ශනය සඳහා සහභාගී වීමට පොල් සංවර්ධන අධිකාරිය විසින් අවස්ථාව ලබාදෙන ලදී.

### 3.1.4 දේශීය හා ජාත්‍යන්තරව පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ වෙළඳාම සඳහා පහසුකම් සැලසීම හා පාලනය කිරීම

ගෙඩි පොල්, තැඹිලි සහ පොල් කොළ ආශ්‍රිත විසිතුරු භාණ්ඩ අපනයන සඳහා අදාළ අපනයනකරුවන් විසින් පොල් සංවර්ධන අධිකාරියේ අවසරය ලබාගත යුතුව ඇත. අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් 2012 වසරේදී ද මෙම අපනයනයන් සඳහා තාවකාලික අවසරපත් නිකුත් කරන ලදී.

අධිකාරියේ වෙබ් අඩවිය මඟින් හා වෙනත් ආයතන/පුද්ගලයින් මඟින් අධිකාරිය වෙත ලැබෙන පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ පිළිබඳ වෙළඳ ඇණවුම් පොල් සංවර්ධන

අධිකාරියේ ලියාපදිංචි වී ඇති අපනයනකරුවන් වෙත ලබාදීම 2012 වසරේදී ද සිදුකෙරිණි

### 3.1.5 පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ පිළිබඳ නිෂ්පාදනයන්, වෙළඳාම සහ අපනයන සඳහා තොරතුරු සන්නිවේදනය කිරීම

පොල් කර්මාන්ත කේෂ්ත්‍රයේ නියැලි සියල්ලන්ට සිය වෙළඳ තීරණ ගැනීමේදී තීරණාත්මක සාධකයක් වනුයේ නිවැරදි තොරතුරු ලබාගෙන ඒවා විශ්ලේෂණය කිරීමය. මෙහිදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයේ තොරතුරු සේවාව 2012 වසරේදී විශේෂ කාර්යයභාරයක් පහත දක්වා ඇති අංග තුළින් ඉටුකරන ලදී.

- පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන තොරතුරු, අපනයන සහ ආනයන දත්ත ලබාගැනීම හා අදාළ පාර්ශවකරුවන් වෙත බෙදාහැරීම

- ගොවිපළ මිල ගණන් සම්බන්ධයෙන් අදාළ තොරතුරු සහ දත්ත විධිමත්ව රැස්කිරීම හා බෙදාහැරීම

- ගෘහස්ත පොල් හා පොල් තෙල් පරිභෝජනය පිළිබඳව දත්ත විධිමත්ව රැස්කිරීම, සසඳා බැලීම

- නවතම අලෙවි ක්‍රම හඳුන්වාදීම මඟින් අපනයන ආදායම වැඩිකර ගැනීමට සහය වීම


- වර්තමාන හා අපේක්ෂිත පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් පිළිබඳව තොරතුරු විධිමත්ව රැස්කිරීම, සටහන් කිරීම හා ප්‍රචාරණය කිරීම

- මෙම තොරතුරු බෙදාහැරීමේ කර්තව්‍ය සඳහා පහත නම් සඳහන් ආයතන සිය දායකත්වය නොමසුරුව ලබාදෙන ලදී.
    - ශ්‍රී ලංකා රේගුව
    - ශ්‍රී ලංකා මහ බැංකුව
    - අපනයන සංවර්ධන මණ්ඩලය
    - ජනගහන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
    - කාළගුණ දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතන


- තවද විදේශීය ආයතන වන ආසියානු පැසිපික් පොල් ප්‍රජාව, විදේශ සඟරා (Cocommunity, Oil World, UCAP, Indian Coconut Journal) ආදියෙන්ද පොල් කර්මාන්තය සඳහා ලබාගන්නා විශේෂිත තොරතුරු නිරතුරුවම ශ්‍රී ලංකා පොල් ප්‍රජාවට ලබාදීමේ කාර්යභාරය 2012 වසරේදී ද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් සාර්ථකව ඉටුකරන ලදී.

- ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍යයෙන් පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනවල දේශීය මිල ගණන් 2012 වසරේදී ද දිනපතා පුවත්පත් මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

- අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් ප්‍රකාශයට පත්කරන ලද "Coco Market Focus" සති වාර්තාවේ ප්‍රකාශන 48ක් 2012 වසරේදී ද නිකුත් කෙරිණි.




- පෙර වසරේ අදාළ මාසය සමඟ විශ්ලේෂිත දත්තයන් ඇතුළත් වී ඇති "Coco Market Focus" මාසික සඟරාවේ ප්‍රකාශන 12ක් අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ අවශ්‍යතාවයන්ට අනුව සම්පාදනය කොට 2012 වසරේදී ප්‍රකාශයට පත්කරන ලදී.




- "Sri Lanka Coconut Statistics - 2011" නමින් අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් ප්‍රකාශයට පත්කරන හරවත් වාර්ෂික ප්‍රකාශනය 2012 වසරේදී ද සම්පාදනය කොට ඉදිරිපත් කරන ලදී. එම ප්‍රකාශනයේ ඇතුළත් දත්තයන් අතර ශ්‍රී ලංකාවෙන් අපනයන කරන ලද සියලුම පොල් ආශ්‍රිත භාණ්ඩ වල අපනයන ප්‍රමාණ හා මිල ගණන්, ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ පොල් තෙල් සහ අනෙකුත් ඛාද්‍ය තෙල් වර්ගවල ප්‍රමාණ හා මිලගණන්, අන්තර්ජාතික පොල් ඵලදාව හා අපනයන තොරතුරු, නිෂ්පාදන සහ අපනයන පාර්ශවකරුවන්ගේ තොරතුරු විශේෂයෙන් සඳහන් කළ හැක. මෙම ප්‍රකාශනය සඳහා ශ්‍රී ලංකාව තුළත් විදේශයන්හිත් මනා ඉල්ලුමක් පවතී.

## 3.2 නව නිෂ්පාදන, අගය එකතු කිරීම්, වෙළඳපළ ප්‍රවර්ධනය හඳුන්වාදීම සහ වෙළඳපළ ප්‍රවිෂ්ඨය වැඩිකිරීම

### 3.2.1 දේශීය හා විදේශීය පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ භාවිතයන් හඳුනාගැනීම සඳහා අලෙවි සමීක්ෂණ පැවැත්වීම

2012 වසරේදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් පහත දක්වා ඇති ක්ෂේත්‍රයන්හි සමීක්ෂණ සිදුකරන ලදී.

- ඒක පුද්ගල ගෙඩි පොල් පරිභෝජනය
- පොල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ දත්තයන්
- නිෂ්පාදන පිරිවැය වෙනස් වූ ආකාරය
- දේශීය වෙළඳ පොළ මිල ගණන් හැසිරුණු ආකාරය
- පොල් තෙල් සහ අනෙකුත් ආදේශක තෙල් පරිභෝජනය
- පාරිභෝගික අවශ්‍යතාවයන් වෙනස්වන ආකාරය

ඉහත දක්වා ඇති සමීක්ෂණ තුළින් පහත දක්වා ඇති අරමුණු ඉටුකර ගැනීම අපේක්ෂා කෙරිණි.

- රට තුළ විසිරී සිටින පොල් ආශ්‍රිත නිෂ්පාදකයින් හඳුනාගැනීම
- පොල් ආශ්‍රිත නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ප්‍රමාණයන් පිළිබඳව තොරතුරු එක්රැස් කිරීම
- පොල් මද ආශ්‍රිත නිෂ්පාදන - විශේෂයෙන් පොල් තෙල් හා දිසිදි තෙල් කර්මාන්තයන්හි නිෂ්පාදන ධාරීතාව පිළිබඳ තොරතුරු ලබාගැනීම
- නිෂ්පාදන පිරිවැය තොරතුරු එක් එක් පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් සඳහා එක්රැස් කිරීම සහ එහි වෙනස් වීම් හඳුනාගැනීම. එතුළින් ඉදිරි වර්ෂයේ නිෂ්පාදන රටාවන් පිළිබඳ අවබෝධයන් ලබාගැනීමට හැකියාව ලැබුණි. ඒක පුද්ගල ගෙඩි පොල් පරිභෝජනය පිළිබඳ තොරතුරු රැස්කිරීම සහ එතුළින් ඉදිරි වර්ෂය සඳහා ගෙඩි පොල් අවශ්‍යතාවය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම
- දේශීය පොල් තෙල් නිෂ්පාදනය පිළිබඳ ඉල්ලුම් සහ සැපයුම් තත්ත්ව හඳුනාගැනීම සහ එමඟින් ඉදිරි වසරේ දේශීය පොල් තෙල් අවශ්‍යතාවය සපුරාලීමට ගතයුතු ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්ති සැලසුම් කිරීම

### 3.2.2 නව නිෂ්පාදනයන් පිළිබඳ ඇති හැකියාවන් කලාපීය වශයෙන් හඳුනාගැනීම, භාණ්ඩ නිපදවීම වැඩි දියුණු කිරීම සහ අලෙවිය සඳහා මූලිකව ප්‍රවිෂ්ය වීම

විදේශිකයන් ශ්‍රීලංකාවට වැඩි වැඩියෙන් සංචාරය කිරීම සැලකිල්ලට ගෙන සංචාරක කර්මාන්තය විශේෂිත වූ ප්‍රදේශ ඉලක්කකොට පොල් ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදනයේ යෙදීමට අපේක්ෂා කරන්නන් සඳහා පුහුණු වැඩමුළු කීපයක් අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් පැවැත්විණි.







## 3.3 ගෘහස්ත පොල් භාවිතයේදී වන අපතේ යාම අවම කිරීම සඳහා පොල් මද ආශ්‍රිත නව නිෂ්පාදන හඳුන්වාදීම

පොල් භාවිතයේදී අපතේ යාම අවම කිරීමට පොල් මද නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කරන ලදී.




- සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට ඔවුන්ගේ නිෂ්පාදන වෙළඳපළට ඉදිරිපත් කිරීම සඳහා දිරිදීමක් ලෙස "කප්රුක ඉසුරු සැල" නමින් වෙළඳකුටියක් අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් පවත්වාගෙන යනු ලැබේ. 2012 වසරේදී ද මෙම කප්රුක ඉසුරුසැල පාරිභෝගික ජනතාව වෙනුවෙන් පරිසර හිතකාමී නිෂ්පාදන රැසක් ප්‍රචලිත කරන ලදී. ඒ අතරින් කොහු මල් පෝච්චි, පොල් කටු ආශ්‍රිත නව නිෂ්පාදන සහ පොල් කෙඳි ආශ්‍රිත ආභරණ පාරිභෝගිකයින් අතර ප්‍රචලිතය.

## 3.4 පොල් ආශ්‍රිත නිෂ්පාදනවල පෝෂණාත්මක හා ඖෂධීය ලක්ෂණයන්හි ගුණාත්මකභාවය මාධ්‍ය හරහා දැනුවත්වීම වැඩිකිරීම

නව තාක්ෂණයට පිවිසුමක් ලෙස පොල් සංවර්ධන අධිකාරිය මගින් පවත්වාගෙන යන වෙබ් අඩවිය භාෂා තුනෙන්ම සකස් කර යාවත්කාලීන කිරීම තුළින් දේශීය හා විදේශීය ආයතන සමග තොරතුරු හුවමාරු කරගැනීමටත් නිරතුරු සම්බන්ධතාවයන් ගොඩනගාගැනීමටත් හැකියාව ලැබුණි. එමඟින් පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ පෝෂණාත්මක හා ඖෂධීය ලක්ෂණයන්හි ගුණාත්මකභාවය පිළිබඳව පාරිභෝගිකයන්ට වඩාත් දැනෙන අයුරින් දැනුවත් කිරීමට හැකියාව ලැබුණි.

## 3.5 දේශීය මාධ්‍ය හරහා දැන්වීම් ප්‍රචාරණය හා දැනුවත් කිරීමේ වැඩසටහන්

පරිසර හිතකාමී පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ පිළිබඳව ශ්‍රී ලාංකික ජනතාව දැනුවත් කිරීමේ අරමුණෙන් රූපවාහිනී දැන්වීම්, ප්‍රදර්ශන පුවරු, බැනර් හා පුවත්පත් දැන්වීම් ප්‍රවර්ධන සේවාවක් ලෙස 2012 වසරේදී ද ඉදිරිපත් කරන ලදී.





## 3.6 අලෙවි සංවර්ධන සහාය සේවා

- නිෂ්පාදන / වෙළඳපොළවල් හා විවිධ සේවාවන් පිළිබඳව උපදේශක සේවාවන් ලබාදීම
- පොල් කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ නිෂ්පාදන සඳහා පුරෝකථනයන් සැකසීම සඳහා පොල් කර්මාන්ත හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයට සහයෝගය දැක්වීම

## 3.7 අපනයන ඉපැයීම්

පොල් නිෂ්පාදිත අපනයන (2005 - 2012)

| වසර | වටිනාකම (රු. මිලියන) |
|---|---|
| 2005 | 17,520 |
| 2006 | 19,661 |
| 2007 | 24,096 |
| 2008 | 28,094 |
| 2009 | 29,081 |
| 2010 | 32,433 |
| 2011 | 47,306 |
| 2012 | 46,666 |




ශ්‍රී ලංකාව පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමෙන් 2012 වසරේදී රු.බිලියන 46ක ආදායමක් ලබාගෙන ඇත. 2012 වසරේ පොල් මද නිෂ්පාදන අපනයන ආදායම 2011 වසරට සාපේක්ෂව 21%ක අඩුවීමක් පෙන්නුම් කරයි. අදාල වසර තුළදී දිසිදි පොල් නිෂ්පාදනයේ අඩුවීමක් 2011 වසරට සාපේක්ෂව දක්නට ලැබිණි. මෙයට ප්‍රධාන හේතුව වශයෙන් සඳහන් කළ හැක්කේ කි.ග්‍රෑ.1කට රුපියල් 75/- ලෙස තිබූ පාම් තෙල් ආනයන බද්ද වැඩිකිරීමෙන් (2012.05.14 දී-. කි.ග්‍රෑ. 1කට රුපියල් 90/-ක් සහ 2012.11.09 දී කි.ග්‍රෑ. 1කට රුපියල්110/-ක්) රටතුලට අඩුවෙන් ගෙන්වූ පාම්තෙල් වෙනුවට දේශීය පොල් තෙල් නිෂ්පාදනයට වැඩිපුර ගෙඩිපොල් ප්‍රමාණයක් යොමු කිරීමයි. මේ හේතුවෙන් දිසිදි පොල් නිෂ්පාදනය සඳහා යොමු වූ පොල් ප්‍රමාණයේ අඩුවීමක් දක්නට ලැබුණි. පොල් ආශ්‍රිත භාණ්ඩ අපනයනයේ දී වැඩිම විදේශ විනිමය ප්‍රමාණයක් ලැබෙනුයේ දිසිදි පොල් අපනයන ක්ෂේත්‍රයෙනි. එබැවින් දිසිදි පොල් අපනයනයෙන් ලැබූ විදේශ විනිමය ප්‍රමාණය 2012 වසරේදී අඩුවීම එම වර්ෂයේ සමස්ත පොල් අපනයන ආදායම අඩුවීමට ඍජුව බලපාන ලද සාධකයකි.

ශ්‍රී ලංකාවේ නිපදවන පොල් කෙඳි අමුද්‍රව්‍ය ලෙස අපනයනය කිරීමට පොල් සංවර්ධන අධිකාරිය විසින් පෙළඹීමක් කරනු නොලබයි. එබැවින් ගුදිරි කෙඳි සහ බ්‍රිස්ටල් කෙඳි අපනයනයේ පසුබෑමක් පෙන්නුම් කර ඇත. පොල් සංවර්ධන අධිකාරියේ අභිප්‍රාය වනුයේ අපනයනකරුවන් අගය වැඩි කරන ලද පොල් කෙඳි නිමි භාණ්ඩ අපනයන කිරීමත් එමඟින් වැඩිපුර විදේශ විනිමය උපයාගැනීමත්ය. කොහු කෙඳි ආශ්‍රිත අගය එකතු කරන ලද නිෂ්පාදන,පොල් කටු ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදන සඳහා ද වැඩි අපනයන ආදායමේ ප්‍රතිශතයක් පෙන්නුම් කර ඇත. කොහු කෙඳි ආශ්‍රිත අගය එකතු කරන ලද නිෂ්පාදන අපනයන ආදායම 2012 වසරේ රුපියල් බිලියන 14.85ක් වූ අතර 2011 වසරේ එහි වටිනාකම රුපියල් බිලියන 12.97කි. තවද 2012 වසරේ පොල් කටු ආශ්‍රිත නිමි භාණ්ඩ අපනයන ආදායම 2011 වනවිට 20%ක සාපේක්ෂ වර්ධනයක් පෙන්නුම් කරයි. එය 2012 වසරේදී රුපියල් බිලියන 9.27ක් වූ අතර 2011 වසරේදී එය රුපියල් බිලියන 7.69 ක් විය. එමෙන්ම පොල් ආශ්‍රිත අනෙකුත් නිෂ්පාදනවල අපනයන ආදායමද 2011 වසරට සාපේක්ෂව 2012 වසරේදී 51%කින් ඉහල ගොස් තිබේ.

# පොල් නිෂ්පාදිත අපනයන - 2011/2012

## සංසන්දනාත්මක සංඛ්‍යාලේඛන

| නිෂ්පාදන වර්ගය | ප්‍රමාණය (මෙ.ටො.) | | | වටිනාකම (රු.මිලියන) | | |
|---|---|---|---|---|---|---|
| | ජන- දෙසැ. 2011 | ජන- දෙසැ. 2012 | % වෙනස | ජන- දෙසැ. 2011 | ජන- දෙසැ. 2012 | % වෙනස |
| **1. පොල් මද නිෂ්පාදිතයන්** | | | | | | |
| 1. පොල් තෙල් | 1,931 | 2,499 | 29 | 854.10 | 1,277.12 | 50 |
| 2. දිසිදි පොල් | 45,761 | 40,224 | -12 | 13,956.87 | 8,625.57 | -38 |
| 3. කොප්පරා | 2,185 | 653 | -70 | 280.54 | 90.49 | -68 |
| 4. ගෙඩි පොල් (1000 ගෙඩි) | 7,910 | 19,150 | 142 | 456.47 | 986.69 | 116 |
| 5. බීජ පොල් (ගෙඩි) | 6,417 | 280 | -96 | 0.760 | 0.040 | -95 |
| 6. තැඹිලි පොල් (ගෙඩි) | 139,849 | 341,560 | 144 | 9.970 | 13.48 | 35 |
| 7. පුන්නක්කු | 6,522 | 9,685 | 48 | 202.85 | 303.45 | 50 |
| 8. පොල් කිරිම | 1,745 | 2,000 | 15 | 667.22 | 655.49 | -2 |
| 9. පොල් කිරි | 6,351 | 9,036 | 42 | 1,255.33 | 1,651.40 | 32 |
| 10. පොල් කිරිපිටි | 4,446 | 4,641 | 4 | 2,522.89 | 2,558.92 | 1 |
| 11. මේදය ඉවත් කල පොල් | 3,876 | 3,116 | -20 | 822.99 | 525.72 | -36 |
| ***උප එකතුව පොල් මද නිෂ්පාදිතයන් (ගෙඩි 1000)*** | **480.52** | **458.56** | **-5** | **21,029.99** | **16,688.37** | **-21** |
| **2. කෙඳි නිෂ්පාදිතයන්** | | | | | | |
| 12. ගුදිරි කෙඳි | 78,174 | 57,924 | -26 | 3,354.62 | 2,566.22 | -24 |
| 13. බ්‍රිස්ටල් කෙඳි | 9,450 | 8,160 | -14 | 635.62 | 637.20 | 0.25 |
| 14. අඹරන ලද කෙඳි | 26,808 | 45,119 | 68 | 1,436.44 | 2,372.18 | 65 |
| ***උප එකතුව නිෂ්පාදිතයන්*** | **114,432** | **111,203** | **-3** | **5,426.68** | **5,575.60** | **3** |
| **3. පොල් කටු නිෂ්පාදිතයන්** | | | | | | |
| 15. පොල් කටු අඟුරු | 4,957 | 6,919 | 40 | 278.42 | 475.04 | 71 |
| 16. පොල් කටු හා පොල් කටු කුඩු | 546 | 698 | 28 | 22.79 | 34.76 | 53 |
| 17. පොල් කටු සක්‍රිය කල කාබන් | 31,359 | 30,271 | -3 | 7,396.07 | 8,759.17 | 18 |
| ***උප එකතුව නිෂ්පාදිතයන්*** | **36,862** | **37,888** | **3** | **7,697.28** | **9,268.97** | **20** |
| **4. නිමි භාණ්ඩ නිෂ්පාදිතයන් (කොහු කෙඳි)** | | | | | | |
| 18. කොහු ලණු | 767 | 1,025 | 34 | 68.04 | 127.56 | 87 |
| 19. කොහු ලණු / කඹ | 5,417 | 7,148 | 32 | 869.48 | 1,037.33 | 19 |
| 20. තවාෂි බුරුසු (සංඛ්‍යාව) | 23,791,814 | 26,312,793 | 11 | 433.53 | 558.56 | 29 |
| 21. කොහු ලණු (සංඛ්‍යාව) (තවාෂි බුරුසු හැර) | 24,498,840 | 19,957,696 | -19 | 2,235.14 | 2,174.05 | -3 |
| 22. කොහු ලණු පැදුරු හාබුමුතුරුණු | | | | | | |
| - වර්ග මීටර | 1,533,343 | 624,581 | -59 | 685.00 | 627.47 | -8 |
| - සංඛ්‍යාව | 146,063 | 39,773 | -73 | | | |
| 23. කොහු කලාල (වර්ග මීටර) | 18,308 | 15,663 | -14 | 15.54 | 11.46 | -26 |
| 24. රබර් මිශ්‍ර කොහු පැඩි හා ඇඳන් මෙට්ට | | | | | | |
| - වර්ග මීටර | 2,512,641 | 4,178,312 | 66 | 255.01 | 296.62 | 16 |
| - සංඛ්‍යාව | | | | | | |
| 25. මිහිසළු | 3,722 | 2,536 | -32 | 440.53 | 385.43 | -13 |
| 26. උද්‍යාන වගා සඳහා යොදා ගන්නා කොහු නිෂ්පාදිතයන් | 64,547 | 66,151 | 2 | 2,927.41 | 3,517.04 | 20 |
| 27. කොහු බත් | 131,913 | 133,494 | 1 | 4,363.54 | 5,248.98 | 20 |
| 28. පොල් ලෙලි කැබලි | 14,311 | 14,848 | 4 | 673.29 | 869.02 | 29 |
| ***උප එකතුව කොහු ආශ්‍රිත නිෂ්පාදිතයන්*** | | | | **12,966.51** | **14,853.52** | **15** |
| **5. වෙනත් නිෂ්පාදිතයන්** | | | | | | |
| 29. පොල් අරක්කු (ලීටර) | 34,611 | 36,775 | 6 | 15.99 | 17.48 | 9 |
| 30. පොල් විනාකිරි (ලීටර) | 28,729 | 26,044 | -9 | 2.20 | 2.77 | 26 |
| 31. පොල් ඉරටු (මෙ.ටො.) | 8,686 | 10,944 | 26 | 167.14 | 248.16 | 48 |
| 32. ෆැටි ඇසිඩ් (මෙ.ටො.) | - | 90 | - | - | 11.63 | - |
| **උප එකතුව (වෙනත් නිෂ්පාදිතයන්)** | | | | **185.33** | **280.04** | **51** |
| **මුළු අපනයන ආදායම** | | | | **47,305.79** | **46.666.50** | **-1** |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගුව

# 4. පරිපාලන අංශය

පරිපාලන අංශයේ මූලික පරමාර්ථය වනුයේ ආයතනයේ සංවර්ධන අංශයන් සඳහා සහාය සේවාවන් ලබාදීම හා පහසුකම් සැපයීම, අධිකාරියේ මනා පැවැත්ම හා ප්‍රවර්ධනය වෙනුවෙන් අදාළ වන සියලුම ආයතනික කටයුතු, මානව සම්පත් සංවර්ධනය හා පරිපාලන කටයුතු මෙහෙයවීමද එමඟින් ආයතනයේ අනෙකුත් ක්‍රියාකාරී අංශවලට ස්වකීය කාර්යයභාරය ඉටු කිරීමේදී සහායවීම මෙන්ම සමස්ත ආයතනයේ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වීමයි.

## 4.1 සේවක සංඛ්‍යාව

2012 වර්ෂය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 166 කි. 2012.12.31 දිනට සිටින කාර්යය මණ්ඩලය 121 කි. පුරප්පාඩු සංඛ්‍යාව 48 කි. සේවක සංඛ්‍යාව පහත සේවා ගණයන්ගෙන් සමන්විත විය.

1. ජ්‍යෝෂ්ඨ කළමනාකාර සේවා ගණය
2. කළමනාකාර සේවා ගණය
3. කනිෂ්ඨ කළමනාකාර සේවා ගණය
4. ආශ්‍රිත නිලධාරී සේවා ගණය
5. කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය
6. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන ) සේවා ගණය
7. ප්‍රාථමික ශිල්පීය සේවා ගණය
8. ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය
9. ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය

2012 වර්ෂයේ අධිකාරියේ ජ්‍යෝෂ්ඨ කළමනාකරණ සේවා ගණයට අයත් කාර්යය මණ්ඩලය පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත විය.

1. එන්.එන්.සී.කේ.බණ්ඩාර මහත්මිය - අධ්‍යක්ෂ ජනරාල්
2. ඒ.ටී.රණසිංහ මහතා - ඉංජිනේරු
3. එස්.එස්.පුරසිංහ මහත්මිය - අධ්‍යක්ෂිකා (තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ)
4. ආර්.ජේ.ඒ.ෆොන්සේකා මහතා - අධ්‍යක්ෂ (අලෙවි සංවර්ධන හා පර්යේෂණ)
5. එස්.එස්.රාජකරුණා මහත්මිය - අධ්‍යක්ෂිකා (පරිපාලන)/අධ්‍යක්ෂ මණ්ඩලීය ලේකම්
6. එම්.පී.සන්ධ්‍යා කාන්ති මහත්මිය - අධ්‍යක්ෂිකා (මුදල්)
7. ඩබ්.එල්.එස්.ඩබ්.කේ.ලියනගේ මහතා- වැ.බ.අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන)
8. එන්.එම්.ආරියදාස මහතා - අභ්‍යන්තර විගණක

## 4.2 මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

මානව සම්පත අධිකාරියේ මෙහෙවර හා අරමුණු ලඟා කර ගැනීම සඳහා වඩා ඵලදායිව හා සඵලදායීව යොදා ගැනීමට හැකිවන පරිදි සංවර්ධනය කිරීම 2012 වර්ෂය තුළදී ද පාලන අංශයෙන් සිදුවිය.

මෙම වසර තුළ අධිකාරියේ සේවක මහත්ම මහත්මීන් පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් ආවරණය වූ පාඨමාලා හා සම්මන්ත්‍රණ / වැඩමුළු සඳහා සහභාගී කරවීමට ද කටයුතු යොදා ඇත.

### 4.2.1 පුහුණු පාඨමාලා / වැඩමුළු / සම්මන්ත්‍රණ

- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් මෙහෙයවනු ලබන Statistical Process Control (SPC), Sampling Techniques and Inspection for ISO 9001 Quality Management System පුහුණු වැඩමුලුව
- කොලඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධනායතනයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලා අංශය විසින් ඉන්දියාවේ හර්යානා ප්‍රාන්තයේ ගුර්ගවර්න් හි පිහිටි ITM විශ්ව විද්‍යාලය සංවිධානය කරන ලද මානව සම්පත් කළමනාකරණය පිළිබඳ අන්තර්ජාතික වැඩමුලුව සඳහා සහභාගී කරවීමට අවශ්‍ය මූල්‍ය දායකත්වය සැපයීම.
- නිපුණතා සංවර්ධන අරමුදල මඟින් මෙහෙයවනු ලබන Financial Reporting in Compliance with Accounting Standards සම්මන්ත්‍රණය සඳහා සහභාගී කරවීම.
- Techno Instruments (Pvt.) Ltd මඟින් සංවිධානය කරන ලද Agilent Spectroscopy සම්මන්ත්‍රණය සඳහා සහභාගී කරවීම.
- සේවක ඵලදායීතාව ඉහළ නැංවීමේ අරමුණින් රාජ්‍ය සේවා පුහුණු ආයතනය ලවා සංවිධානය කරගනු ලැබූ සේවක ආකල්ප ප්‍රවර්ධනය සහ මහජන සම්බන්ධතා සහ ලිපිගොනුකරණය සහ ලිපිලිවීමේ නිපුණතාවය ප්‍රවර්ධනය කිරීමේ එක්දින වැඩමුළුවක් සඳහා ආයතනයේ සියලුම සේවක මහත්ම මහත්මීන් සහභාගී කරවීම
- ශ්‍රී ලංකා පදනම් ආයතනය මඟින් මෙහෙයවනු ලබන ප්‍රසම්පාදන ක්‍රියාවලියේ වැදගත් අංග හඳුන්වාදීම පිළිබඳ නේවාසික වැඩමුළුව සඳහා සහභාගී කරවීම.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් මෙහෙයවනු ලබන තත්ත්ව කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන විද්‍යාගාර තාක්ෂණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව
- Prag Institute විසින් මෙහෙයවනු ලබන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති පිළිබඳ සම්මන්ත්‍රණය
- ශ්‍රී ලංකා පදනම් ආයතනය මඟින් මෙහෙයවනු ලබන වෘත්තීය ක්ලමථ කළමනාකරණය පිළිබඳ වැඩමුලුව

## 4.3 සුභ සාධන වැඩ කටයුතු

අධිකාරියේ සේවකයින් සඳහා පසුගිය වර්ෂවලදී ලබා දුන් පහත සඳහන් සුභ සාධන පහසුකම් සහ මූලාධාර 2012 වර්ෂය තුළදී ද ලබා දීමට කටයුතු කර ගෙන යන ලදී.

- ණය පහසුකම්, දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර හා සියලුම සේවකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආවරණය වන ලෙස වෛද්‍ය රක්ෂණ ක්‍රමය

- කාර්යාල පරිශ්‍රයෙන් බැහැර රාජකාරි කටයුතුවල නිරතව සිටින සියලුම සේවකයන් සඳහා පුද්ගල හදිසි අනතුරු රක්ෂණය සහ අනෙකුත් සේවකයන් සඳහා කම්කරු වන්දි රක්ෂණ ඔප්පු ආවරණය

- වැඩ කරන දිනවල සේවකයන්ට තේපැන් සැපයීම

- සුභ සාධන සමිතිය විසින් සංවිධානය කරනු ලබන වාර්ෂික අධ්‍යාපන චාරිකා සහ ක්‍රීඩා කටයුතු

- සේවකයන්ට සාධාරණ මිල ගණන් යටතේ පාරිභෝගික භාණ්ඩ ලබා ගැනීමට හැකිවන ලෙස සුභ සාධන සමිතිය මඟින් සිල්ලර අළෙවිසැලක් පවත්වා ගෙන යාම

- වැඩ කරන දිනවල කොළඹ කොටුව / මරදාන සහ වැල්ලවත්ත දුම්රිය ස්ථානවල සිට සහ කොහුවල මංසන්ධියේ සිට නාරාහේන්පිට කාර්යාලය වෙත පැමිණීමට සහ කාර්යාලයේ සිට ආපසු යාමට ප්‍රවාහන පහසුකම් සලසා දීම

- දුම්රිය වාර්ෂික අනුග්‍රහ බලපත්‍ර ලබා දීමට කටයුතු සලස්වා දීම

- කාර්යය මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාසල් යන දරුවන් සඳහා පාසල් පොත් ලබා ගැනීමට තිළිණපත් ලබා දීම

- සිංහල අළුත් අවුරුදු සඳහා තෑගි වවුචර්පත් ලබා දීම

# 5. මුදල් අංශය

පොල් සංවර්ධන අධිකාරියේ මුදල් අංශය මගින් විවිධ අංශ වලට අවශය මූල්‍ය පහසුකම් සැලයීමේ වගකීම දරයි. ඒ අනුව අයවැය සහ මූල්‍ය කාර්යය සැලසුම් වලට අනුකූලවූ අනුමත වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් සැලසීම සම්බන්ධයෙන් මුදල් අංශය වගකීම දරයි. වරින් වර මූල්‍ය වාර්තා සහ ප්‍රගති වාර්තා සැලයීම ඇතුළුව මූල්‍ය වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධයෙන්ද මුදල් අංශය වගකීම උසුලයි. පොල් සංවර්ධන අධිකාරියේ ආයෝජන කළමනාකරණය ඇතුළුව එහි අරමුදල් භාරව කටයුතු කරන්නේද මුදල් අංශයයි.

2012 වර්ෂයේ රජයේ ප්‍රදාන ලෙස ලැබී ඇති රු. මිලියන 77.11ක් ඇතුළුව මුළු ආදායම රු. මිලියන 229.17ක් සහ රු. මිලියන 966ක මුළු වත්කම් සම්න්ධයෙන් වාර්තා තබා ගැනීම හා පාලනය කිරීම මදුල් අංශය මගින් සිදුකර ඇත. ආයතනයේ සියළුම අංශවල කාර්යය සාධනය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු වලදී මූල්‍ය පහසුකම් සැපයීමද මුදල් අංශය මගින් සිදුකෙරේ.

## 5.1 සාමාන්‍ය මණ්ඩල මෙහෙයුම් කටයුතු

- සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සඳහා පුනරාවර්තන වියදම රු. මිලියන 113.94ක් සහ ප්‍රාග්ධන වියදම් රු. මිලියන 91.5ක් ලෙස වියදම් දරා ඇත.
- කළමනාකරණ අවශ්‍යතා සඳහා විවිධ මූල්‍ය වාර්තා සහ මාසික, ත්‍රෛමාසික, අර්ධ වාර්ෂික සහ වාර්ෂික වාර්තා පිළියෙල කිරීමද සිදුකෙරේ.

## 5.2 ප්‍රාග්ධන සංවර්ධන වැඩසටහන

පොල් සංවර්ධන අධිකාරියේ ඍජු ආදායමක් ලෙස පැවති සෙස් බදු ආදායම අංක එෆ්පී/06/77/07/04 දරණ 2007 අප්‍රේල් 24 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය මගින් 2007.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි රජයේ ආදායමක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

2012 වර්ෂයේ ප්‍රාග්ධන සංවර්ධන / ප්‍රාග්ධන වැඩසටහන
රජයේ මුළු ප්‍රදානය / ආදායම - රු. මිලියන 100.5

2012 වර්ෂයේදීද පහත සඳහන් කටයුතු නිම කිරීමට මුදල් අංශයට හැකිවිය.

- අරමුදල් කළමනාකරණය සහ සංවර්ධන හා පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ මූල්‍ය වාර්තා සැපයීම.
- මෝල් සංවර්ධන අරමුදලේ දිසිඳි පොල් මෝල් හිමියන් වෙනුවෙන් පවත්වාගෙන යන ආරක්ෂිත ඇප තැන්පත් කේවල ගිණුම් සඳහා මාසිකව සෙස් ලැබීම් බැර කිරීම.
- පොල් කර්මාන්තයේ නියුතු ව්‍යවසායකයින් සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට මහජන බැංකුව එක්ව කප්රුක නිපැයුම් දිරිය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සහය වීම.

- පොල් සංවර්ධන අධිකාරියේ සේවක අර්ථසාධක අරමුදලේ මුදල් නිසි පරිදි කළමනාකරණය කිරීම, සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ට ණය මුද්ල ගෙවීම් කටයුතු කිරීම හා අවුරුදු 55 ඉක්මවූ සේවකයින්ගේ ඉල්ලීම මත 75% සීමාවට යටත්ව සාමාජික මුදල් නිදහස් කිරීම.

- මනා කළමණාකාරිත්වයකින් යුතුව අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල සහ බැඳුම්කරවල ආයෝජනය කර ඇත. මෝල් සංවර්ධන අරමුදලෙහි ඇති මුදල් එකිනෙක මෝල් හිමියන්ගේ නම් වලින් ජාතික ඉතිරිකිරීමේ ගිණුම් මනා කළමණාකාරිත්වයකින් යුතුව පවත්වාගෙන යනු ඇත.

වර්ෂය අවසානයේදී මෙම අරමුදල් ශේෂය පහත සඳහන් පරිදි වේ. (දළ වශයෙන්)

| | | | |
|---|---|---|---|
| අ) | ප්‍රාග්ධන සංවර්ධන අරමුදල | - | 8.4 |
| ආ) | මොල් සංවර්ධන අරමුදල | - | 73.5 |
| ඇ) | පොල්තෙල් මිල ස්ථායිකරණ අරමුදල | - | 216.0 |
| ඈ) | සාමාන්‍ය මෙහෙයුම් කටයුතු | - | 29.1 |
| ඉ) | එන්.ආර්.අයි. අරමුදල | - | 0.1 |
| | | | **327.1** |
| ඊ) | සේවක අර්ථසාධක අරමුදල | - | 30.5 |

(මෙය පෞද්ගලික අර්ථසාධක අරමුදලක් වන
බැවින් සේවක අර්ථසාධක අරමුදල් ගිණුම වෙනම පවත්වාගෙන යනු ලැබේ.)

මුදල් අංශය විසින් වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ගිණුම් සහ අනෙකුත් සංඛ්‍යාලේඛන තොරතුරු සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලය, අමාත්‍යාංශය, භාණ්ඩාගාරය, රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාළ ආයතන වෙත නියමිත කාලසීමාවන් තල ඉදිරිපත් කිරීමෙන් එහි වගකීම ඉටුකර ඇත. සෙස් බදු අරමුදල / ප්‍රාග්ධන සංවර්ධන වැඩසටහන සම්බන්ධයෙන් ලිපි ලේඛන සකස් කිරීමද එහි වගකීම් වලට අයත්වේ.

## 2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ ව්‍යවස්ථාපිත වාර්තාව සහ වාර්ෂික ගිණුම්

1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනත ප්‍රකාරව එම පනතෙහි සංශෝධන වශයෙන් ඉන් අනතුරුව ගෙනෙන ලද රෙගුලාසි ද ඇතුළත් කරමින් පිහිටුවන ලද පොල් සංවර්ධන අධිකාරිය විසින් පහත සඳහන් ආකාරයෙන් එහි මූල්‍ය ප්‍රකාශ සහ වාර්ෂික ගිණුම් සකස් කිරීම අවශ්‍යවේ. එකී පනතෙහි 41 වන වගන්තිය ප්‍රකාරව, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන කිසියම් ආකාරයකට හා කිසියම් තොරතුරු අනතර්ගත කරමින්, එක් එක් මූල්‍ය වර්ෂය සම්බන්ධයෙන් මණ්ඩලය හා අධිකාරිය මඟින් පිළිවෙළින්, ඔවුන්ගේ නිසි ආදායම් හා වියදම් ගිණුම් හා ඔවුන් විසින් තබා ගත යුතු අනෙකුත් සියලු ගනුදෙනු ගිණුම් ගත කළ යුතු අතර ඔවුන්ගේ ක්‍රියාකාරකම්වලට අදාළ වාර්ෂික ගිණුම් ප්‍රකාශ හා සංඛ්‍යා ලේඛන සකස් කළ යුතුවේ.

පනතෙහි 41 වන වගන්තිය මඟින් සකසන ලද විධිවිධානවලට අමතරව, 1971 අංක 38 දරණ මුදල් පනතෙහි විධිවිධාන ප්‍රකාරව මෙන්ම මහා භාණ්ඩාගාරය මඟින් නිකුත් කරන ලද නියෝගවලට අනුකූලවද අධිකාරියේ වාර්ෂික ගිණුම් ප්‍රකාශ සකස් කර ඉදිරිපත් කිරිම අවශ්‍ය වේ.

මහා භාණ්ඩාගාරයේ අංක පීඑෆ් /පීජී /21 හා 2002/05/24 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය හා ඉන් අනතුරුව නිකුත් කරන ලද නියෝග ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් දින 60 ක් ඇතුළත වාර්ෂික අවසන් ගිණුම් ප්‍රකාශ කෙටුම්පත සකස් කර ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා වන වාර්ෂික ගිණුම් 2012 පෙබරවාරි මස හෝ ඊට පෙරාතුව සකස් කර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතුවේ.

ඒ අනුව අධිකාරියේ ප්‍රාග්ධන සංවර්ධන අරමුදලේ,පොල්තෙල් අරමුදල සඳහා වන මිල ස්ථායීකරණ යෝජනා ක්‍රමයේ, මෝල් සංවර්ධන අරමුදලේ හා ජා.ප.ආ. ව්‍යාපෘති අරමුදලේ වාර්ෂික ගිණුම් හා මූල්‍ය ප්‍රකාශ සකස් කර 2013.03.31 වන දින ඉදිරිපත් කරන ලදී. (කෙටුම්පත් වාර්තාව 2013.02.28 දින ඉදිරිපත් කර ඇත)

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි 2012 වර්ෂය සඳහා වන වත්කම් හා වගකීම් මෙන්ම ආදායම් හා වියදම් සම්බන්ධයෙන් අවශ්‍ය අනාවරණය කිරීම් සිදු කර ඇත. ගිණුම්වල සඳහන් ඉතා වැදගත් කරුණු යෝග්‍ය හා අවශ්‍ය අවස්ථාවන්හිදී සටහන්වල දක්වා ඇත.

2012 වර්ෂය සඳහා වන මෙම ගිණුම් ප්‍රකාශ,ගිණුම් ප්‍රකාශන සැකසීමේ දී අනුගමනය කරනු ලබන පොදු සම්මත ගිණුම්කරණ මූලධර්ම, ප්‍රතිපත්ති, පරිචයන්, උපකල්පන සහ අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇත.වෙන් වෙන් සටහන් මඟින් තහවුරු කරන ලද යම් යම් වෙනස්කම් කිහිපයක් හැරුණු කොට, ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා ගණනය කිරීමේ ක්‍රම පෙර මූල්‍ය වර්ෂයෙහි අනුගමනය කරන ලද ඒවා සමඟ සැසඳේ. අනාවරණය කිරීම් අවශ්‍ය වන ශේෂ පත්‍ර දිනෙන් පසු සිදුවීම් කිසිවක් අඩංගු නොවේ.

මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය හා අධිකාරිය සතුවේ.

...............................................

**සභාපති - පොල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.**
**පොල් සංවර්ධන අධිකාරිය**
**2013.03.31**

# පොල් සංවර්ධන අධිකාරිය
## 2012.12.31වන දිනට ශේෂ පත්‍රය

| | සටහන් අංක | 2012.12.31වන දිනට | 2011.12.31වන දිනට |
|---|---|---|---|
| | | රු. | රු. |
| **ස්ථාවර වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | **1** | 658,684,103 | 495,047,542 |
| අඩු කළාः සමුච්චිත ක්ෂය | | (137,496,750) | (116,465,644) |
| එකතු කළාः නොනිම් වැඩ | | - | - |
| | | **521,187,353** | **378,581,898** |
| **ජංගම වත්කම්** | | | |
| ***ඉන්වෙන්ට්‍රි භාණ්ඩ / බඩු තොග*** | | | |
| බඩු තොග | **2** | 6,841,903 | 6,597,350 |
| | | **6,841,903** | **6,597,350** |
| **වෙළඳ හා වෙනත් ලැබිය යුතු දේ** | | | |
| ලාහෝර් කාන්තා ණය අරමුදල | **3** | 1,601,595 | 1,557,288 |
| විවිධ ණයගැතියන් | **4** | 34,631,540 | 35,491,613 |
| අඩමාණ ණයගැතියන් සඳහා වෙන්කිරීම් | | (20,058,045) | (16,046,436) |
| කාර්ය මණ්ඩල ණයගැතියෝ | **5** | - | 14,406,879 |
| කොළඹ නගර සභාවට කරන ලද අත්තිකාරම් ගෙවීම් | | 4,750,000 | 2,000,000 |
| ස්ථාවර වත්කම්වලට එරෙහි අත්තිකාරම් | | - | 6,960 |
| ණය | **6** | 59,715,037 | 59,715,037 |
| ප්‍රදානය කරන ලද ණය - කප්රුක නිපැයුම් දිරිය | **7** | 2,490,000 | - |
| විවිධ අත්තිකාරම් | **8** | 25,135 | 31,000 |
| විවිධ තැන්පතු | **9** | 653,853 | 653,052 |
| බැංකු තැන්පතු | | 109,360,838 | 67,330,550 |
| භාණ්ඩාගාර බිල්පත් | **10** | 218,164,276 | 294,566,474 |
| | | **411,334,230** | **459,712,418** |
| ***කලින් කරන ලද ගෙවීම්*** | **11** | **2,649,772** | **2,633,563** |
| ***මුදල් හා මුදල් සාමානයන්*** | | | |
| මුදල් තැන්පතු - දුන්කන්නාව | | 35,399 | 1,000 |
| බැංකු මුදල් | | 11,071,632 | 11,493,939 |
| මුද්දර ගාස්තු අග්‍රිම | | 407 | 407 |
| මුද්දර ප්‍රාංකන යන්ත්‍රය | | 32,594 | 42,548 |
| | | **11,140,032** | **11,537,894** |
| අන්තර් බැංකු ගිණුම් ශේෂය | | 1,732,122 | **4,279,731** |
| | | **954,885,412** | **863,342,854** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | | **(26,982,471)** | **(31,686,130)** |
| **ජංගම වගකීම්** | | | |
| ***ගෙවිය යුතු දෑ*** | | | |
| විවිධ ණයහිමියෝ | **12** | (10,251,528) | (5,945,583) |
| ආපසු ගෙවනු ලබන තැන්පතු | **13** | (1,817,601) | (1,032,805) |
| කලින් ලද මුදල් | **14** | (7,093,218) | (7,908) |
| | | **(19,162,347)** | **(6,986,295)** |
| උපචිත වියදම් | **15** | (1,733,216) | **(1,757,274)** |
| අන්තර් බැංකු ගිණුම් ශේෂය | | (1,732,122) | **(4,279,731)** |
| | | **905,275,256** | **818,633,423** |
| **මූල්‍යකරණය කරන ලද්දේ** | | | |
| ප්‍රාග්ධන සංචිත | | 6,970,409 | 6,970,409 |
| විදේශ ආධාර | | 4,102,257 | 4,102,257 |
| ඉඩම් ප්‍රත්‍යාගණනය | **16** | 23,891,309 | 156,702,909 |
| ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය | **17** | 164,965,219 | 87,081,311 |
| මෝටර් රථ වාහන ප්‍රත්‍යාගණනය | **18** | 46,049,983 | 46,049,983 |
| | | **245,979,177** | **300,906,868** |
| ප්‍රදාන හා දායක මුදල් | **19** | 77,870,555 | 77,870,555 |
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන | **20** | 82,672,635 | 64,825,802 |
| | | **160,543,190** | **142,696,357** |
| ප්‍රාග්ධන සංවරධන අරමුදලෙන් ලද ප්‍රදාන | **21** | **77,652,767** | **75,192,353** |
| සමුච්චිත අරමුදල | | **395,831,200** | **441,300,177** |
| සමුච්චිත අතිරික්තය | **22** | **(164,648,229)** | **(141,462,332)** |
| | | **715,358,106** | **818,633,424** |

----------------------------------
**අධ්‍යක්ෂ (මුදල්)**
**පොල් සංවර්ධන අධිකාරිය**

----------------------------------
**සභාපති**
**පොල් සංවර්ධන අධිකාරිය**

# පොල් සංවර්ධන අධිකාරිය
## 2012.12.31වන දිනට (අරමුදල් අනුව විශ්ලේෂිත) ශේෂ පත්‍රය

| | සටහන් අංකය | සාමාන්‍ය මණ්ඩල මෙහෙයුම් රු. | ප්‍රාග්ධන සංවර්ධන අරමුදල රු. | පොල් තෙල් අරමුදල සඳහා P.S.S. රු. | මෝල් සංවර්ධන අරමුදල රු. | NRI අරමුදල රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|
| **ස්ථාවර වත්කම්** | | | | | | | |
| විවිධ ස්ථාවර වත්කම් | *1* | 603,202,666 | 55,460,249 | 21,188 | - | - | 658,684,103 |
| අඩු කළා ඃ සමුච්ඡිත ක්ෂය කිරීම් | | (130,009,373) | (7,466,200) | (21,178) | - | - | (137,496,750) |
| | | | | | | | - |
| | | **473,193,294** | **47,994,049** | **10** | **-** | **-** | **521,187,353** |
| **ජංගම වත්කම්** | | | | | | | |
| ***ඉන්වෙන්ට්‍රි භාණ්ඩ / බඩු තොග*** | | | | | | | |
| බඩු තොග | *2* | 5,728,609 | 1,113,294 | - | - | - | 6,841,903 |
| | | 5,728,609 | 1,113,294 | - | - | - | **6,841,903** |
| ***වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ*** | | | | | | | |
| ලෝහර් කාන්තා ණය අරමුදල | *3* | 1,601,595 | | | | | 1,601,595 |
| විවිධ ණයගැතියෝ | *4* | 6,123,028 | 748,760 | 26,089,858 | 1,664,769 | 5,124 | 34,631,540 |
| අඩමාණ ණයගැතියන් සඳහා වෙන්කිරීම් | | - | | (20,058,045) | | | (20,058,045) |
| කාර්ය මණ්ඩල ණයගැතියෝ | *5* | - | | | | | - |
| කොළඹ නගර සභාවට කරන ලද අත්තිකාරම් ගෙවීම් | | 4,750,000 | | | | | 4,750,000 |
| ස්ථාවර වත්කම්වලට එරෙහි අත්තිකාරම් | | - | | | | | - |
| ණය | *6* | - | 33,000,000 | 26,715,037 | | | 59,715,037 |
| ප්‍රදානය කරන ලද ණය - කප්රුක නිපැයුම් දිරිය | *7* | | | 2,490,000 | | | 2,490,000 |
| විවිධ අත්තිකාරම් | *8* | 25,135 | - | | | | 25,135 |
| විවිධ තැන්පතු | *9* | 653,853 | | | | | 653,853 |
| බැංකු තැන්පතු | | 11,653,720 | | 24,180,262 | 73,526,856 | | 109,360,838 |
| භාණ්ඩාගාර බිල්පත් | *10* | 17,577,545 | 8,438,886 | 192,016,418 | - | 131,428 | 218,164,276 |
| | | **42,384,877** | **42,187,646** | **251,433,530** | **75,191,625** | **136,552** | **411,334,230** |
| ***කලින් කරන ලද ගෙවීම්*** | *11* | 2,649,772 | | | | | **2,649,772** |
| ***මුදල් හා මුදල් සාම්‍යයන්*** | | | | | | | |
| මුදල් තැන්පතු - දුන්කන්නාව | | - | 35,399 | | | | 35,399 |
| බැංකු මුදල් | | 4,878,035 | 6,193,597 | | | | 11,071,632 |
| සුළු මුදල් | | 407 | - | | | | 407 |
| මුද්දර ගාස්තු අග්‍රිම | | 32,594 | - | | | | 32,594 |
| මුද්දර ප්‍රාංකන යන්ත්‍රය | | | | | | | - |
| **මුළු ජංගම වත්කම්** | | **4,911,036** | **6,228,996** | **-** | **-** | **-** | **11,140,032** |
| අන්තර් බැංකු ගිණුම් ශේෂය | | - | 769,716 | | 962,406 | | 1,732,122 |
| | | **528,867,588** | **98,293,701** | **251,433,540** | **76,154,031** | **136,552** | **954,885,412** |
| **ජංගම නොවන වගකීම්** | | | | | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | | (26,982,471) | | - | - | - | **(26,982,471)** |
| **ජංගම වගකීම්** | | | | | | | |
| ***ගෙවිය යුතු දෑ*** | | | | | | | |
| විවිධ ණයහිමියෝ | *12* | (4,918,617) | (5,332,911) | - | - | - | (10,251,528) |
| ආපසු ගෙවනු ලබන තැන්පතු | *13* | (1,817,601) | | - | - | - | (1,817,601) |
| කලින් ලද මුදල් | *14* | (7,093,218) | | - | - | - | (7,093,218) |
| | | | | | | | **(19,162,347)** |
| උපචිත වියදම් | *15* | (1,733,216) | | - | - | - | (1,733,216) |
| අන්තර් බැංකු ගිණුම් ශේෂය | | (769,716) | (962,406) | - | - | - | (1,732,122) |
| | | **485,552,749** | **91,998,386** | **251,433,540** | **76,154,031** | **136,552** | **905,275,256** |
| **මූල්‍යකරණය කරන ලද්දේ** | | | | | | | |
| ප්‍රාග්ධන සංචිත | | 6,970,409 | | | | - | 6,970,409 |
| විදේශ ආධාර | | 4,102,257 | | | | - | 4,102,257 |
| ඉඩම් ප්‍රත්‍යාගණනය | *16* | - | 23,891,309 | | | - | 23,891,309 |
| ගොඩනැඟිලි ප්‍රත්‍යාගණනය | *17* | 164,965,219 | | | | - | 164,965,219 |
| මෝටර් රථ වාහන ප්‍රත්‍යාගණනය | *18* | 46,049,983 | | | | - | 46,049,983 |
| | | | | | | | **245,979,177** |
| ප්‍රදාන හා දායක මුදල් | *19* | 77,870,555 | | | | - | 77,870,555 |
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන | *20* | 82,672,636 | | | | - | 82,672,635 |
| | | | | | | | **160,543,190** |
| ප්‍රාග්ධන සංවරධන අරමුදලෙන් ලද ප්‍රදාන | *21* | 77,652,767 | | | | - | 77,652,767 |
| සමුච්චිත අරමුදල | *22* | - | 68,107,077 | 251,433,540 | 76,154,031 | 136,552 | 395,831,200 |
| සමුච්චිත අතිරික්තය | *22* | (164,648,229) | | | | - | (164,648,229) |
| | | **295,635,598** | **91,998,386** | **251,433,540** | **76,154,031** | **136,552** | **715,358,106** |

----------------------------------- ----------------------------------

**අධ්‍යක්ෂ (මුදල්)**
**පොල් සංවර්ධන අධිකාරිය**

**සභාපති**
**පොල් සංවර්ධන අධිකාරිය**

## පොල් සංවර්ධන අධිකාරිය
## 2012 දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ප්‍රකාශය

| | සටහන් අංකය | 2012.12.31 දිනෙන් අවසන් වර්ෂය<br>රු. | 2011.12.31 දිනෙන් අවසන් වර්ෂය<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| රාජ්‍ය ප්‍රදාන (පුනරාවර්තන) | | 77,113,333 | 73,273,000 |
| රාජ්‍ය ප්‍රදාන (ප්‍රාග්ධන) | | 82,653,166 | 47,260,197 |
| **වෙනත් ආදායම්** | | - | - |
| සෙස් අරමුදලෙන් ලද ප්‍රදාන දිසිදි පොල් නියැදිකරණ හා පර්යේෂණ ගාස්තු | | 17,500,000 | 16,500,000 |
| පොළී ආදායම | *1* | 27,631,055 | 29,485,099 |
| කුලී ආදායම | *2* | 8,339,651 | 1,450,400 |
| ලියාපදිංචි ගාස්තු | *3* | 2,694,328 | 3,929,912 |
| කැබලි ගාස්තු | *4* | 4,573,263 | 2,925,873 |
| පර්යේෂණාගාර ආදායම | *5* | 4,191,880 | 3,083,523 |
| විවිධ ආදායම | *6* | 1,774,677 | 2,048,451 |
| බී. සී. සී. ණය මත පොළී | | 4,011,609 | 4,011,609 |
| ස්ථාවර වත්කම් හා ඉන්වෙන්ට්‍රි අයිතම විකුණුම් | | 33,194 | 63,806 |
| මුළු වෙනත් ආදායම් | | 70,749,657 | 63,498,673 |
| **මුළු ආදායම්** | | 230,516,156 | 184,031,870 |
| අඩු කළා ඃ- බදු (අගය එකතු කළ බදු, ජාතික පිරිවැටුම් බදු හා ආර්ථික සේවා ගාස්තු) | | (1,347,727) | (950,248) |
| **මුළු ශුද්ධ ආදායම** | | **229,168,429** | **183,081,623** |
| **වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | | (63,480,215) | (59,227,473) |
| ගමනාගමන වියදම් | | (3,751,461) | (2,806,744) |
| සැපයුම් හා අවශ්‍යතා | | (18,170,905) | (13,381,720) |
| අළුත්වැඩියා හා නඩත්තු | | (9,682,158) | (7,544,424) |
| කොන්ත්‍රාත්තුගත සේවා හා වෙනත් | | (18,815,036) | (16,488,839) |
| මූල්‍ය ගාස්තු | | (35,113) | (36,810) |
| APCCදායක මුදල් | | (4,225,614) | (3,472,430) |
| අලෙවි සංවර්ධනය - ප්‍රාග්ධන සංවර්ධන වැඩසටහන | *7* | (13,794,015) | (12,162,403) |
| සැකසුම් සංවර්ධනය - ප්‍රාග්ධන සංවර්ධන වැඩසටහන | *8* | (52,796,640) | (18,848,354) |
| තත්ත්ව පාලනය හා තත්ත්ව ආරක්ෂණය - ප්‍රාග්ධන සංවර්ධන වැඩසටහන | *9* | (671,638) | (753,382) |
| දිසිදි පොල් නියැදිකරණ හා පර්යේෂණ ගාස්තු | | (17,500,000) | (16,500,000) |
| ඩියුක් වීදියේ ගොඩනැගිල්ල වෙන් කිරීම් හා වෙනත් වියදම් | | (2,460,414) | (14,268,507) |
| | | **(205,383,210)** | **(165,491,085)** |
| **අතිරික්තය / (හිඟය)** | | **23,785,220** | **17,590,538** |
| ක්ෂය කිරීම් | | (24,134,471) | (22,608,908) |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම්වල හිඟය | | (5,311,646) | (4,820,550) |
| බී.සී.සී. සමාගමේ අඩමාන ණය මත පොළී වෙන්කිරීම් | | (4,011,609) | (4,011,609) |
| | | **(9,672,506)** | **(13,850,530)** |

# පොල් සංවර්ධන අධිකාරිය

## 2012 දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වර්ෂය සඳහා (අරමුදල් අනුව විශ්ලේෂිත) ආදායම් හා වියදම් ප්‍රකාශය

| | සටහන් අංකය | සාමාන්‍ය මණ්ඩල මෙහෙයුම් | ප්‍රාග්ධන සංවර්ධන අරමුදල | පොල් තෙල් අරමුදල සඳහා P.S.S. | NRI අරමුදල | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. |
| **ආදායම** | | - | | | | |
| රාජ්‍ය ප්‍රදාන (පුනරාවර්තන) | | 77,113,333 | | | | 77,113,333 |
| රාජ්‍ය ප්‍රදාන (ප්‍රාග්ධන) | | | 82,653,166 | | | 82,653,166 |
| **වෙනත් ආදායම්** | | - | | | | - |
| සෙස් අරමුදලෙන් ලද ප්‍රදාන දිසිදි පොල් නියැදිකරණ හා පර්යේෂණ ගාස්තු | | 17,500,000 | | | | 17,500,000 |
| පොළී ආදායම | 1 | 3,112,615 | 1,212,294 | 23,294,251 | 11,895 | 27,631,055 |
| කුලී ආදායම | 2 | 8,256,667 | 82,984 | | | 8,339,651 |
| ලියාපදිංචි ගාස්තු | 3 | 2,694,328 | | | | 2,694,328 |
| කැබලි ගාස්තු | 4 | 4,573,263 | | | | 4,573,263 |
| පර්යේෂණාගාර ආදායම | 5 | 4,191,880 | | | | 4,191,880 |
| විවිධ ආදායම | 6 | 1,706,257 | 68,420 | | | 1,774,677 |
| බී. සී. සී. ණය මත පොළී | | - | | 4,011,609 | | 4,011,609 |
| ස්ථාවර වත්කම් හා ඉන්වෙන්ට්‍රි අයිතම විකුණුම් | | 33,194 | | | | 33,194 |
| මුළු වෙනත් ආදායම් | | 42,068,204 | 1,363,698 | 27,305,860 | 11,895 | 70,749,657 |
| **මුළු ආදායම්** | | 119,181,537 | 84,016,864 | 27,305,860 | 11,895 | 230,516,156 |
| අඩු කළා ඃ- බදු (අගය එකතු කළ බදු, ජාතික පිරිවැටුම් බදු හා ආර්ථික සේවා ගාස්තු) | | (1,347,727) | | | | (1,347,727) |
| **මුළු ශුද්ධ ආදායම** | | **117,833,810** | **84,016,864** | **27,305,860** | **11,895** | **229,168,429** |
| **වියදම්** | | | | | | |
| පුද්ගල පඩිනඩි | | (63,480,215) | | | | (63,480,215) |
| ගමනාගමන වියදම් | | (3,751,461) | | | | (3,751,461) |
| සැපයුම් හා අවශ්‍යතා | | (18,170,905) | | | | (18,170,905) |
| අළුත්වැඩියා හා නඩත්තු | | (9,682,158) | | | | (9,682,158) |
| කොන්ත්‍රාත්තුගත සේවා හා වෙනත් | | (18,815,036) | | | | (18,815,036) |
| මූල්‍ය ගාස්තු | | (35,113) | (8,650) | | | (43,763) |
| APCC දායක මුදල් | | | (4,225,614) | | | (4,225,614) |
| අලෙවි සංවර්ධනය - ප්‍රාග්ධන සංවර්ධන වැඩසටහන | 7 | | (13,794,015) | | | (13,794,015) |
| සැකසුම් සංවර්ධනය - ප්‍රාග්ධන සංවර්ධන වැඩසටහන | 8 | | (52,796,640) | | | (52,796,640) |
| තත්ත්ව පාලනය හා තත්ත්ව ආරක්ෂණය - ප්‍රාග්ධන සංවර්ධන වැඩසටහන | 9 | | (671,638) | | | (671,638) |
| දිසිදි පොල් නියැදිකරණ හා පර්යේෂණ ගාස්තු | | | (17,500,000) | | | (17,500,000) |
| ඩියුක් වීදියේ ගොඩනැගිල්ල වෙන් කිරීම් හා වෙනත් වියදම් | | | (2,460,414) | | | (2,460,414) |
| | | **(113,934,889)** | **(91,456,971)** | **-** | **-** | **(205,391,860)** |
| මෙහෙයුම් ලාභය | | **3,898,921** | **(7,440,106)** | **27,305,860** | **11,895** | **23,776,570** |
| ක්ෂය කිරීම් | | (21,773,173) | (2,361,298) | | | (24,134,471) |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම්වල හිඟය | | (5,311,646) | | - | | (5,311,646) |
| බී.සී.සී. සමාගමේ අඩමාන ණය මත පොළී වෙන්කිරීම් | | - | - | (4,011,609) | | (4,011,609) |
| | | **(23,185,897)** | **(9,801,404)** | **23,294,251** | **11,895** | **(9,681,156)** |

# පොල් සංවර්ධන අධිකාරිය

## 2012 දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2011 | | 2012 | |
|---|---|---|---|
| | **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය වීම්** | | |
| (13,850,529) | සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ලද අතිරික්තය / (හිඟය) | | **(9,681,156)** |
| | ***මූල්‍ය නොවන සංචලන*** | | |
| 22,608,909 | ක්ෂය සඳහා වෙන් කිරීම් | 24,134,471 | |
| 4,820,550 | පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 5,311,646 | |
| (2,729,214) | පාරිතෝෂික ගෙවීම් | (10,015,305) | |
| (63,806) | ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය | (33,194) | |
| (29,485,100) | ආයෝජන මත පොළී | (27,631,055) | (8,233,437) |
| 18,178,469 | **ක්‍රියාකාරී ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය / අලාභය** | | (17,914,593) |
| **(520,721)** | | | |
| | **ක්‍රියාකාරී ප්‍රාග්ධන වෙනස්වීම්** | | |
| 1,071,544 | බඩු තොග ඉහළ යාම | (244,553) | |
| (43,986) | ලාභෝර් කාන්තා ණය මුදල ඉහළ යාම | (44,307) | |
| (9,020,936) | විවිධ ණයගැතියන් පහළ යාම | 4,871,682 | |
| 1,241,003 | කාර්ය මණ්ඩල ණයගැතියන් පහළ යාම | 1,512,429 | |
| (2,019,760) | අත්තිකාරම් ඉහළ යාම | (2,737,175) | |
| (758) | විවිධ තැන්පතු ඉහළ යාම | (801) | |
| | ප්‍රදානය කරන ලද ණය ඉහළ යාම | (2,490,000) | |
| 185,407 | පූර්ව ගෙවීම් ඉහළ යාම | (16,209) | |
| 6,176,885 | බැංකු තැන්පතු ඉහළ යාම | (42,030,288) | |
| (28,880,817) | භාණ්ඩාගාර බිල්පත් පහළ යාම | 76,402,197 | |
| (2,816,063) | විවිධ ණයහිමියන් පහළ යාම | 4,305,945 | |
| 849,481 | ආපසු ගෙවනු ලබන තැන්පතු ඉහළ යාම | 784,796 | |
| (1,062,492) | ලැබුණු අත්තිකාරම් පහළ යාම | 7,085,310 | |
| 45,905 | උපචිත වියදම් ඉහළ යාම | (24,058) | |
| | **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහ** | | 47,374,970 |
| **(34,795,308)** | | | |
| | **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මූල්‍ය ප්‍රවාහ** | | |
| (46,954,552) | ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (19,010,850) | |
| | ස්ථාවර වත්කම් විකිණීම | 188,027 | |
| 28,981,551 | නොනිම් ප්‍රාග්ධන වැඩ | - | |
| 29,485,100 | ආයෝජන මත පොළී | 27,631,055 | |
| | **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහ** | | 8,808,232 |
| (23,283,209) | **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මූල්‍ය ප්‍රවාහ** | | |
| - | ප්‍රාග්ධන සංචිත | - | |
| 2,164,802 | ප්‍රාග්ධන සඳහා භාණ්ඩාගාර ප්‍රදාන | 17,846,834.34 | |
| 14,917,771 | ප්‍රාග්ධන සඳහා සෙස් ප්‍රදාන | 2,460,414 | |
| 12,146,911 | මෝල් සංවර්ධන අරමුදල | 11,423,207 | |
| - | ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලද පීඑස්එස් තෙල් අරමුදල | (70,000,000) | |
| | පීඑස්එස් තෙල් අරමුදල | (396,926) | |
| 64,755 | ස්ථාවර වත්කම් අපහරණය කිරීම් | - | |
| **29,294,239** | **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහ** | | **(38,666,471)** |
| **6,011,030** | **මුදල් හා මුදල් සාම්‍යයන්ගේ ශුද්ධ වැඩි වීම් / අඩු වීම්** | | (397,862) |
| 5,526,864 | **කාල පරිච්ඡේදය ආරම්භයේ පැවති මුදල් හා මුදල් සාම්‍යයන්** | | **11,537,894** |
| **11,537,894** | **කාල පරිච්ඡේදය අවසානයේ ඇති මුදල් හා මුදල් සාම්‍යයන්** | | **11,140,032** |

**මුදල් හා මුදල් සාම්‍යයන්**

| | 01.01.2012 දිනට | 31.12.2012 දිනට |
|---|---|---|
| මුදල් තැන්පතු - දුන්කන්නාව | 1,000 | 35,399 |
| බැංකුවේ ඇති මුදල් | 11,493,939 | 11,071,632 |
| මුද්දර ගාස්තු අග්‍රිමය | 407 | 407 |
| මුද්දර ප්‍රාන්කන යන්ත්‍රය | 42,548 | 32,594 |
| | **11,537,894** | **11,140,032** |

## පොල් සංවර්ධන අධිකාරිය

## 2012 දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| | ප්‍රදාන හා දායක මුදල් රු. | රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන රු. | ප්‍රාග්ධන සංවර්ධන අරමුදලෙන් ලද ප්‍රදාන රු. | ප්‍රාග්ධන සංචිත රු. | විදේශ ආධාර රු. | ප්‍රත්‍යාගණන අතිරික්තය රු. | සමුච්චිත අරමුදල රු. | සමුච්චිත අතිරික්තය / හිඟය රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2012.01.01 දිනට ශේෂය | 77,870,555 | 64,825,802 | 75,192,353 | 6,970,409 | 4,102,257 | 289,834,203 | 441,300,177 | (141,462,332) | 818,633,424 |
| භාණ්ඩාගාරයෙන් ලද අරමුදල් | - | 17,846,834 | 2,460,414 | - | - | 147,883,908 | | | 168,191,156 |
| ව්‍යාපෘති දායක මුදල් | - | - | - | - | - | - | - | - | - |
| ආදායම හා වියදම | (1,683,424) | (235,918) | - | - | - | - | (45,233,059) | (21,502,473) | (68,654,874) |
| **එකතුව** | **76,187,131** | **82,436,718** | **77,652,767** | **6,970,409** | **4,102,257** | **437,718,111** | **396,067,118** | **(162,964,805)** | **918,169,706** |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

**(1) ගිණුම්කරණ සංකල්ප**

සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්ම හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය සංකල්පය පදනම් කර ගෙන මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශවලට බලපානු ලබන උද්ධමනමය සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නොමැත.

**(2) සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති**

i. මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී මෙතෙක් අනුගමනය කරනු ලබන සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්ම හා ප්‍රතිපත්ති, පරිචයන් හා ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් සකස් කර ඇත.

ii. වෙන් වෙන් සටහන් මගින් තහවුරු කරන ලද වෙනස්කම් කිහිපයක් හැරුණු කොට ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගණනය කිරීමේ ක්‍රම පසුගිය මූල්‍ය වර්ෂය තුළ අනුගමනය කළ ඒවා හා අනුගත වේ. ශේෂ පත්‍ර දිනෙන් පසු අනාවරණය කිරීමක් අවශ්‍ය වන කිසිදු සිදුවීමක් සිදු වී නොමැත.

**(3) වත්කම් තක්සේරුකරණය**

දේපළ, පිරියත හා උපකරණ ශේෂ පත්‍රයෙහි දක්වා ඇත්තේ සමුච්චිත ක්ෂය කිරීම් අඩු කළ පිරිවැයට වේ. පහත සඳහන් වාර්ෂික අනුපාතයන්ට සරල රේඛීය ක්‍රමයට අනුව ක්ෂය කිරීම් කරනු ලැබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 2 $^1/_2$ % |
| රථ වාහන | 20 % |
| ලී බඩු හා උපකරණ | 10 % |
| පොත් හා වාර සඟරා | 10 % |
| පරිගණක | 20 % |

මිලදී ගන්නා වර්ෂයේදී සම්පූර්ණ වාර්ෂික ක්ෂය කිරීම වෙනස් වේ.

**<u>ඩියුක් වීදියේ ඉඩම සහ ගොඩනැගිල්ල ප්‍රත්‍යාගණනය කිරීම</u>**

2012.05.24 වන දින මිනින්දෝරු දෙපාර්තමේන්තු විසින් දෙන ලද තක්සේරුවට හා 2012.12.21 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය (504/එස්පී/එෆ්/02) ප්‍රකාරව, ඩියුක් වීදියේ ඉඩම හා ගොඩනැගිල්ල පිළිවෙළින් රු.70,000,000/- ට හා රු.80,000,000/-ට ප්‍රත්‍යාගණනය කරන ලදී.

**3.1 ආයෝජන**

අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය ප්‍රකාරව, පොල් සෙස් අරමුදලේ හා පොල් තෙල් අරමුදල සඳහා වන මිල ස්ථායිකරණ යෝජනා ක්‍රමයේ සියලුම ආයෝජන ලංකා බැංකුවේ භාණ්ඩාගාර අංශය හරහි භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ආකාරයෙන් තැන්පත් කර ඇත.

**3.2 ණයගැතියෝ**

ණය ගැතියන් සඳහන් කර ඇත්තේ ඔවුන් උපලබ්ධි වීමට නියමිත අගයට වේ. සියලුම අඩමාණ ණය සඳහා වෙන් කිරීම් කර ඇත.

**3.3 බඩු තොග**

බඩු තොග අගය කර ඇත්තේ පෙර ලැබීම් පෙර නිකුතු පදනම (FIFO) මත වේ.

**(4) විශ්‍රාමික ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම්**

1983 අංක 12 දරන පාරිතෝෂික පනත ප්‍රකාරව කාර්ය මණ්ඩලය සඳහා විශ්‍රාමික පාරිතෝෂික වෙනුවෙන් ගිණුම්වල වෙන් කිරීම් කර ඇත.

සටහන 1

## 2012.12.31 වන දිනට මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

## 2012.12.31 වන දිනට ස්ථාවර වත්කම් - ප්‍රධාන කාර්යාලය

| අයිතමය | 2012.01.01 දිනට පිරිවැය | එකතු කිරීම්/ ප්‍රත්‍යාගණනය | බැහැර කිරීම් | 2012.12.31 වන දිනට පිරිවැය | 2012.01.01 වන දිනට සමුච්චිත ක්ෂය කිරීම් | බැහැර කිරීම් | ක්ෂය කිරීම් 2012 | 2012.12.31 වන දිනට සමුච්චිත ක්ෂය කිරීම් | 2012.12.31 වන දිනට W.D. අගය |
|---|---|---|---|---|---|---|---|---|---|
| ඉඩම් | 134,855,770.00 | 70,000,000.00 | - | 204,855,770.00 | - | - | - | - | 204,855,770.00 |
| ගොඩනැගිලි | 156,912,116.58 | 85,564,933.33 | - | 242,477,049.91 | 14,340,209.58 | 1,088,089.11 | 6,593,477.22 | 19,845,597.69 | 222,631,452.22 |
| පර්යේෂණාගාර සිවිකිරීම් හා උපකරණ | 59,792,231.64 | 5,912,730.00 | 786,212.00 | 64,918,749.64 | 35,307,264.69 | 786,206.00 | 3,250,858.82 | 37,771,917.51 | 27,146,832.13 |
| කාර්යාල ලී බඩු හා උපකරණ | 18,891,614.56 | 3,088,526.05 | 1,383,897.32 | 20,596,243.29 | 11,928,785.66 | 1,229,069.92 | 1,575,479.87 | 12,275,195.61 | 8,321,047.68 |
| යන්ත්‍රෝපකරණ හා මෙවලම් | 3,363,900.00 | - | - | 3,363,900.00 | 1,744,235.28 | - | 336,390.00 | 2,080,625.28 | 1,283,274.72 |
| පොත් හා වාර සඟරා | 762,013.65 | - | - | 762,013.65 | 680,920.35 | - | 14,405.48 | 695,325.83 | 66,687.82 |
| මෝටර් රථවාහන | 66,228,940.00 | - | - | 66,228,940.00 | 47,338,148.87 | - | 10,002,561.77 | 57,340,710.64 | 8,888,229.36 |
| **එකතුව** | **440,806,586.43** | **164,566,189.38** | **2,170,109.32** | **603,202,666.49** | **111,339,564.43** | **3,103,365.03** | **21,773,173.16** | **130,009,372.56** | **473,193,293.93** |

## 2012.12.31 වන දිනට ස්ථාවර වත්කම් - දුන්කන්නාව කොහු පර්යේෂණ හා සංවර්ධන ආයතනය

| අයිතමය | 2012.01.01 දිනට පිරිවැය | එකතු කිරීම් | 2012.12.31 වන දිනට පිරිවැය | 2012.01.01 වන දිනට සමුච්චිත ක්ෂය කිරීම් | ක්ෂය කිරීම් 2012 | 2012.12.31 වන දිනට සමුච්චිත ක්ෂය කිරීම් | 2012.12.31 වන දිනට W.D. අගය |
|---|---|---|---|---|---|---|---|
| දුන්කන්නාව - ඉඩම | 21,449,599.25 | | 21,449,599.25 | - | - | - | 21,449,599.25 |
| දුන්කන්නාව ආදර්ශ මෝල් ගොඩනැගිල්ල | 25,285,853.40 | - | 25,285,853.40 | 1,973,105.67 | 632,146.34 | 2,605,252.01 | 22,680,601.40 |
| ආදර්ශ මෝල යන්ත්‍රෝපකරණ | 7,448,015.70 | 1,001,600.00 | 8,449,615.70 | 3,128,166.59 | 1,689,923.14 | 4,818,089.73 | 3,631,525.97 |
| ආදර්ශ මෝල පර්ගණක උපාංග | - | 117,100.00 | 117,100.00 | - | 23,420.00 | 23,420.00 | 93,680.00 |
| කාර්යාල යන්ත්‍රෝපකරණ හා උපකරණ | 36,300.00 | 121,780.40 | 158,080.40 | 3,630.00 | 15,808.04 | 19,438.04 | 138,642.36 |
| **එකතුව** | **54,219,768.35** | **1,240,480.40** | **55,460,248.75** | **5,104,902.26** | **2,361,297.52** | **7,466,199.78** | **47,994,048.98** |

# පොල් සංවර්ධන අධිකාරිය

## 2012.12.31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ සටහන්

*අංකය*

**2** <u>බඩු තොග</u>

| | | රු. |
|---|---|---|
| සාමාන්‍ය මණ්ඩල මෙහෙයුම් | | 5,728,609.33 |
| ප්‍රාග්ධන සංවර්ධන අරමුදල | | 1,113,294.00 |
| | | **6,841,903.33** |

**3** <u>ලෝහර් කාන්තා ණය අරමුදල</u>

| | | |
|---|---|---|
| මූලික තැන්පතුව හා සමුච්චිත පොළිය (කාර්ය මණ්ඩලය වෙත දෙන ලද ණය මත 4%) මෙම ගිණුමේ දක්වා ඇත. | | **1,601,594.73** |

**4** <u>විවිධ ණයගැතියෝ</u>

| | | |
|---|---|---|
| සාමාන්‍ය මණ්ඩල මෙහෙයුම් | 6,123,028.38 | |
| ප්‍රාග්ධන සංවර්ධන අරමුදල | 748,759.92 | |
| මිල ස්ථායිකරණ යෝජනා ක්‍රම තෙල් අරමුදල | 26,089,858.03 | |
| මෝල් සංවර්ධන අරමුදල | 1,664,769.10 | |
| ජා.ප.ආ. අරමුදල | 5,124.43 | **34,631,539.86** |

**5** <u>කාර්ය මණ්ඩල ණයගැතියෝ</u>

| | | |
|---|---|---|
| ආපදා ණය | 11,212,066.87 | |
| උත්සව අත්තිකාරම් | 139,500.00 | |
| යතුරු පැදි ණය | 931,753.00 | |
| පාපැදි ණය | 16,800.00 | |
| විශේෂ වැටුප් අත්තිකාරම් (1) | 594,330.00 | **12,894,449.87** |

**6** <u>ණය</u>

**ප්‍රාග්ධන සංවර්ධන අරමුදල**

**<u>බී.සී.සී. ලංකා සමාගම</u>**

| | |
|---|---|
| මාස 6ක සහන කාලසීමාවක් සහිතව මසකට රු. මිලියන 2ක අනුපාතයකට නැවත ගෙවිය යුතු ණයක් වශයෙන් 2002 මාර්තු 07වන දින සෙස් කමිටුව විසින් රු 25000ක මුදලක් අනුමත කර ඇති අතර 2002 මාර්තු 14වන දින මුදා හරින ලදී. ආපසු ගෙවීම් වශයෙන් 2003 වර්ෂය අවසන් වන විට ලැබී ඇත්තේ රු. 50,000ක මුදලක් පමණි. | 25,000,000.00 |
| | 50,000.00 |
| | 24,950,000.00 |
| ගිවිසුමක් මත පදනම්ව 2004 ඔක්තෝබර් මස 20වන දින වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ උපදෙස් මත රු. 6,600,000/- ක මුදලක් මුදා හැර ඇත. | 6,600,000.00 |
| මෙම කිසිදු ණයක් බීසීසී ආයතනය විසින් මෙතෙක් නිරවුල් කර නොමැති අතර එබැවින්, බීසීසී ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම සලකා බලන අවස්ථාවේදී පළමු පෙලේ හිමිකමක් වශයෙන් පොල් සංවර්ධන අධිකාරියේ ණය මුදල් නිරවුල් කරන ලෙස ඉල්ලමින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හරහා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම වෙත පැමිණිලි කර ඇත. | 31,550,000.00 |

**<u>හිරියාල ගොවිජන සමාගම ණය</u>**

| | |
|---|---|
| පොල් මිලදී ගැනීම සඳහා 2006-07-11 වන දින හිරියාල ගොවිජන සමාගම වෙත දෙන ලද ණය | 2,000,000.00 |
| 2006 වසර තුළ නිරවුල් කරන ලද ප්‍රමාණය | (500,000.00) |
| 2008 වසර තුළ නිරවුල් කරන ලද ප්‍රමාණය | (50,000.00) |
| | 1,450,000.00 |

**මිල ස්ථායිකරණ යෝජනා ක්‍රම තෙල් අරමුදල**

| | |
|---|---|
| බීසීසී ලංකා වෙත දෙන ලද ණය | 26,715,037.00 |
| | **59,715,037.00** |

**7** <u>කප්රුක නිපැයුම් දිරිය ණය යෝජනා ක්‍රමය</u> **2,490,000.00**

**8**

| | | |
|---|---|---|
| **විවිධ අත්තිකාරම්** | 21,535.00 | |
| **ඉන්ධන අත්තිකාරම්** | 3,600.00 | **25,135.00** |

**9** <u>විවිධ තැන්පතු</u> **653,853.34**

**10** <u>භාණ්ඩාගාර බිල්පත්</u>

| | |
|---|---|
| **සාමාන්‍ය මණ්ඩල මෙහෙයුම්** | 17,577,545.18 |
| **ප්‍රාග්ධන සංවර්ධන අරමුදල** | 8,438,885.65 |
| **මිල ස්ථායිකරණ යෝජනා ක්‍රම තෙල් අරමුදල** | 192,016,417.64 |
| **<u>NRI අරමුදල</u>** | 131,427.84 |
| | **218,164,276.31** |

| | | | |
|---|---|---|---|
| ***11*** | ***කලින් කරන ලද ගෙවීම්*** | | |
| | **සාමාන්‍ය මණ්ඩල මෙහෙයුම්** | | |
| | මෝටර් රථ වාහන රක්ෂණය | 7,537.99 | |
| | මුදල් රක්ෂණයේ මාර්ගස්ථ මුදල් | 3,627.08 | |
| | කාර්යාලීය උපකරණ මත සේවා ගාස්තු | 460,147.38 | |
| | ජාතික රක්ෂණ ඔප්පුව අළුත් කිරීම | 2,032,476.02 | |
| | ගිනි රක්ෂණය | 106,153.66 | |
| | සන්නිවේදන | 39,830.00 | **2,649,772.13** |
| ***12*** | **විවිධ ණයහිමියන්** | | |
| | **සාමාන්‍ය මණ්ඩල මෙහෙයුම්** | | 4,587,625.25 |
| | **2012.12.31වන දිනට මිලදී ගැනුම් ණයහිමියන්** | | 330,992.05 |
| | | | 4,918,617.30 |
| | **ප්‍රාග්ධන සංවර්ධන අරමුදල** | | 5,332,910.63 |
| | | | **10,251,527.93** |
| ***13*** | **ආපසු ගෙවිය යුතු තැන්පතු** | | |
| | ඇප තැන්පතු | | 16,425.84 |
| | ටෙන්ඩර් තැන්පතු | | 194,000.00 |
| | තත්ත්ව සහතික | | 32,174.83 |
| | **ආපසු ගෙවිය යුතු තැන්පතු - ඩියුක් වීදිය** | | |
| | රාජ්‍ය වැවිලි සමාගම | 360,000.00 | |
| | හලාවත වැවිලි සමාගම | 390,000.00 | 1,575,000.00 |
| | කුරුණෑගල වැවිලි සමාගම | | **1,817,600.67** |
| ***14*** | **කලින් ලද ලැබීම්** | | |
| | සාමාන්‍ය මණ්ඩල මෙහෙයුම් | | |
| | තෙල් මෝල්කරුවන් ලියාපදිංචි කිරීම | 1,650.00 | |
| | වෙන්දේසිකරුවන්/තැරැව්කරුවන් ලියාපදිංචි කිරීම | 4,000.00 | |
| | කොප්පරා වෙළෙඳුන් ලියාපදිංචි කිරීම | 3,350.00 | |
| | ප්‍රධාන පොල් මද නිෂ්පාදන ලියාපදිංචි කිරීම | 178,000.00 | |
| | සුළු පොල් මද නිෂ්පාදන ලියාපදිංචි කිරීම | 106,000.00 | |
| | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 243,500.00 | |
| | පොල් වතු ලියාපදිංචි කිරීම | 14,500.00 | |
| | අපනයනකරුවන් කෙඳි හා කෙඳි නිෂ්පාදන | 464,546.80 | |
| | ප්‍රාග්ධන සංවර්ධන අරමුදල | 6,077,671.22 | **7,093,218.02** |
| ***15*** | **සමුච්චිත වියදම්** | | |
| | **සාමාන්‍ය මණ්ඩල මෙහෙයුම්** | | **1,733,216.03** |
| ***16*** | **ඉඩම ප්‍රත්‍යාගණනය** | | |
| | 2012.01.01 දිනට ශේෂය | 132,811,600.00 | |
| | ඩියුක් වීදියේ ඉඩම ප්‍රත්‍යාගණනය කිරීම | 70,000,000.00 | 202,811,600.00 |
| | දුන්කන්නාව ඉඩම හා ගොඩනැගිල්ල | | 23,891,309.00 |
| | | | **226,702,909.00** |
| ***17*** | **ගොඩනැගිල්ල ප්‍රත්‍යාගණනය කිරීම** | | |
| | සාමාන්‍ය මණ්ඩල මෙහෙයුම් | | |
| | 2012.01.01 දිනට ශේෂය | 87,081,311.00 | |
| | ඩියුක් වීදියේ ඉඩම ප්‍රත්‍යාගණනය කිරීම | 77,883,908.33 | **164,965,219.33** |
| ***18*** | **මෝටර් රථ ප්‍රත්‍යාගණනය කිරීම** | | **46,049,983.00** |
| ***19*** | **රාජ්‍ය ප්‍රදාන හා දායක මුදල්** | | |
| | 2012.12.31 දිනට ශේෂය | | **77,870,555.00** |
| ***20*** | **රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන** | | |
| | 2012.01.01 දිනට ශේෂය | | 64,825,802.09 |
| | එකතු කළා: 2012 වර්ෂය සඳහා ලද භාණ්ඩාගාර ප්‍රදාන | | 17,846,834.34 |
| | 2012.12.31 දිනට ශේෂය | | **82,672,636.43** |

**21** **ප්‍රාග්ධන සංවර්ධන ප්‍රදාන රු.77,652,767.37**

| | |
|---|---|
| 2012.01.01 දිනට ශේෂය | 75,192,353.43 |
| එකතු කළා: 2012 තුළ සෙස් ප්‍රදාන | 2,460,413.94 |
| 2012.12.31 දිනට ශේෂය | **77,652,767.37** |

**22** **වියදමට වැඩි සමුච්ඡිත ආදායම**

**සමාන්‍ය මණ්ඩල මෙහෙයුම්**

| | |
|---|---|
| 2012.01.01 දිනට ශේෂය | (141,462,332.00) |
| (හිඟය) අතිරික්තය | (23,185,897.40) |
| 2012.12.31 දිනට ශේෂය | **(164,648,229.40)** |

**ප්‍රාග්ධන සංවර්ධන අරමුදල**

| | |
|---|---|
| 2012.01.01 දිනට ශේෂය | 77,908,481.28 |
| (හිඟය) අතිරික්තය | (9,801,403.95) |
| 2012.12.31 දිනට ශේෂය | **68,107,077.33** |

**මිල ස්ථායිකරණ අරමුදල**

| | |
|---|---|
| 2012.01.01 දිනට ශේෂය | 298,536,215.01 |
| (හිඟය) අතිරික්තය | (46,705,749.38) |
| 2011 ගණනයට පොළිය | (396,925.70) |
| 2012.12.31 දිනට ශේෂය | **251,433,539.93** |

**NRI අරමුදල**

| | |
|---|---|
| 2012.01.01 දිනට ශේෂය | 124,657.22 |
| (හිඟය) අතිරික්තය | 11,895.05 |
| 2012.12.31 දිනට ශේෂය | **136,552.27** |

## පොල් සංවර්ධන අධිකාරිය

## 2012.12.31වන දිනෙන් අවසන් වර්ෂය සඳහා සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය සඳහා සටහන්

| | | | |
|---|---|---|---|
| 1 | **පොළී ආදායම** | | |
| | සාමාන්‍ය මණ්ඩල මෙහෙයුම් | | |
| | කාර්ය මණ්ඩල ණය මත පොළී | 603,156.06 | |
| | ලෝහර් කාන්තා ණය අරමුදල පොළී | 44,306.28 | |
| | ආයෝජන මත පොළී (භාණ්ඩාගාර බිල්පත්) | 1,523,240.76 | |
| | ස්ථාවර තැන්පතු මත පොළී | 941,911.83 | 3,112,614.93 |
| | **ප්‍රාග්ධන සංවර්ධන අරමුදල** | | |
| | භාණ්ඩාගාර බිල්පත් මත පොළී | 1,048,938.00 | |
| | ස්ථාවර තැන්පතු මත පොළී | 163,356.14 | 1,212,294.14 |
| | **මිල ස්ථායිකරණ යෝජනා ක්‍රම තෙල් අරමුදල** | | |
| | භාණ්ඩාගාර බිල්පත් මත පොළී | 9,032,537.91 | |
| | S.I.T.S. අරමුදල මත පොළී | 12,591,451.00 | |
| | ස්ථාවර තැන්පතු මත පොළී | 1,585,899.04 | |
| | ඉතිරිකිරීමේ ගිණුම මත පොළී | 84,362.70 | 23,294,250.65 |
| | NRI අරමුදල - භාණ්ඩාගාර බිල්පත් මත පොළී | | 11,895.05 |
| | | | **27,631,054.77** |
| 2 | **කුලී ආදායම** | | |
| | **සාමාන්‍ය මණ්ඩල මෙහෙයුම්** | | |
| | රාජ්‍ය වැවිලි සමාගම | 3,456,667.00 | |
| | හලාවත වැවිලි සමාගම | 3,240,000.00 | |
| | කුරුණෑගල වැවිලි සමාගම | 1,560,000.00 | 8,256,667.00 |
| | **ප්‍රාග්ධන සංවර්ධන අරමුදල** | | |
| | දුන්කන්නාව වත්ත | | 82,984.11 |
| | | | **8,339,651.11** |
| 3 | **Registration Fees** | | |
| | **සාමාන්‍ය මණ්ඩල මෙහෙයුම්** | | |
| | ප්‍රධාන පොල් මද නිෂ්පාදන අපනයනකරුවන් | 463,145.60 | |
| | සුළු පොල් මද නිෂ්පාදන අපනයනකරුවන් | 369,250.00 | |
| | කෙඳි හා කෙඳි නිෂ්පාදන අපනයනකරුවන් | 938,477.20 | |
| | කොප්පරා වෙළෙඳුන් ලියාපදිංචි කිරීම | 22,462.00 | |
| | වෙන්දේසිකරුවන්/තැරැව්කරුවන් ලියාපදිංචි කිරීම | 40,000.00 | |
| | පොල් වතු හිමියන් ලියාපදිංචි කිරීම | 57,705.76 | |
| | දිසිදි පොල් මෝල්කරුවන් ලියාපදිංචි කිරීම | 255,000.00 | |
| | පොල් තෙල් මෝල්කරුවන් ලියාපදිංචි කිරීම | 94,398.80 | |
| | කොහු කෙඳි මෝල්කරුවන් ලියාපදිංචි කිරීම | 162,579.08 | |
| | කොප්පරා නිෂ්පාදකයින් ලියාපදිංචි කිරීම | 34,550.00 | |
| | අඟුරු නිෂ්පාදකයින් ලියාපදිංචි කිරීම | 3,000.00 | |
| | මේදය තරමක් ඉවත් කළ පොල් නිෂ්පාදනය හා අපනයනය | 18,500.00 | |
| | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 184,000.00 | |
| | සක්‍රීය කාබන් මෝල්කරුවන් ලියාපදංචි කිරීම | 18,000.00 | |
| | පොල් කටු නිෂ්පාදන හා නිමි භාණ්ඩ ලියාපදිංචි කිරීම | 33,260.00 | **2,694,328.44** |
| 4 | **කැබලි ගාස්තු ආදායම - කොප්පරා සහ ගෙඩි පොල්** | | **4,573,262.96** |
| 5 | **පර්යේෂණාගාර ආදායම** | | |
| | තත්ත්ව සහතික | 2,957,211.87 | |
| | දිසිදි පොල් නියැදි විකිණීම | 101,532.09 | |
| | කොහු කෙඳි කුඩු විශ්ලේෂණ ගාස්තු | 229,830.00 | |
| | ජල නියැදිකරණ ගාස්තු | 903,305.70 | **4,191,879.66** |

**6 විවිධ ආදායම්**

| | | | |
|---|---|---|---|
| **සාමාන්‍ය මණ්ඩල මෙහෙයුම්** | | | |
| ටෙන්ඩර් තැන්පතු | | 51,500.00 | |
| පුවත් සඟරා විකිණුම් | | 123,679.70 | |
| විවිධ ආදායම් | | 326,760.02 | |
| ලේබල් ගාස්තු | | 1,043,500.00 | |
| ඉවත ලන දෑ විකිණීම | | 55,851.02 | |
| අධිභාර | | 104,966.34 | 1,706,257.08 |
| **ප්‍රාග්ධන සංවර්ධන අරමුදල** | | | 68,420.16 |
| | | | **1,774,677.24** |

**7 අලෙවිකරණ සංවර්ධන හා පර්යේෂණ වැඩසටහන්**

| | | | |
|---|---|---|---|
| වෙළඳපොළ පහසුකරණ ප්‍රදර්ශන වියදම් හා විදේශ ගමන් | | (4,953,005.97) | |
| වෙළඳ දැන්වීම් සහ වෙළඳපොළ ප්‍රවර්ධන | | | |
| ක්ෂේත්‍ර නිලධාරීන්ගේ වැටුප් හා වියදම් | | | |
| ප්‍රදර්ශන වියදම් - දෑයට කිරුළ හා වෙනත් | | | |
| සමීක්ෂණ හා පර්යේෂණ වියදම් | | | |
| ශ්‍රී ලංකාව තුළ පොල් පාදක නිෂ්පාදන ප්‍රවර්ධනය | | (8,362,840.68) | (13,315,846.65) |
| තැඹිලි ප්‍රවර්ධන වැඩසටහන් වියදම් | | | |
| **කප්රුක ඉසුරුසල - නාරාහේන්පිට** | | | |
| විකුණුම් | | 2,094,700.00 | |
| **අඩු කළා:** 2012.01.01 දිනට බඩු තොග | 393,256.82 | | |
| මිලදී ගැනීම් | 2,295,816.94 | | |
| | 2,689,073.76 | | |
| **අඩු කළා:** 2012.12.31 දිනට බඩු තොග | (463,294.00) | 2,225,779.76 | |
| විකුණුම් පිරිවැය | | (131,079.76) | |
| දළ ලාභය / පාඩුව | | | |
| වියදම් | | (347,088.62) | |
| ශුද්ධ ලාභය /(පාඩුව) | | **(478,168.38)** | (478,168.38) |
| | | | **(13,794,015.03)** |

**8 සැකසුම් සංවර්ධන වැඩසටහන්**

| | | | |
|---|---|---|---|
| සංවර්ධන ව්‍යාපෘති / වැඩසටහන් | | (39,961,438.83) | |
| මෝල් සංවර්ධන අරමුදල් ගිණුමට අරමුදල් මාරු කිරීම | | (8,151,444.60) | (48,112,883.43) |
| කොහු පර්යේෂණ හා සංවර්ධන ආයතනය - දුන්කන්නාව | | | |
| විකුණුම් | | 940,415.11 | |
| මිලදී ගැනීම් - අමු ද්‍රව්‍ය | 1,203,840.00 | | |
| **අඩු කළා:** 2012.12.31 දිනට බඩු තොග | (650,000.00) | | |
| විකුණුම් පිරිවැය | | 553,840.00 | |
| දළ ලාභය | | 386,575.11 | |
| වැටුප් | (2,651,002.95) | | |
| සේඅඅ/සේභාඅ | (910,635.80) | | |
| විදුලිය | (325,982.15) | | |
| ආරක්ෂාව | (334,345.43) | | |
| රක්ෂණය | (172,953.39) | | |
| වෙනත් | (675,412.32) | (5,070,332.04) | |
| ශුද්ධ ලාභය /(පාඩුව) | | | **(4,683,756.93)** |
| | | | **(52,796,640.36)** |

**9** තත්ත්ව පාලනය හා තත්ත්ව ආරක්ෂණය

| | | | |
|---|---|---|---|
| පිළිගැනීමේ වැඩසටහන් හා වෙනත් වියදම් | | (671,637.67) | **(671,637.67)** |

# 6. විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

## 6.1 සංයුතිය සහ ගණපූර්ණය

විගණන හා කළමනාකරණ කමිටුව මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. සමාලෝචනයට බඳුන්වන වර්ෂයෙහිදී කමිටුවෙහි සාමාජිකයන් ලෙස පහත නම් සඳහන් අධ්‍යක්ෂවරුන් කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කරන ලදී.

1. එස්.එම්. රාජපක්ෂ මහත්මිය - සභාපති / භාණ්ඩාගාර නියෝජිත
2. ජානක ධර්මකීර්ති මහතා - සාමාජික / අමාත්‍යාංශ නියෝජිත
3. ඩී. එම්. එල්. බණ්ඩාරනායක මහතා - සාමාජික / අමාත්‍යාංශ නියෝජිත
4. එල්.පී.කේ.ඩබ්. වැලිවත්ත මහතා - සාමාජික
5. ආර්.එස්. වීරමන් මහතා - සාමාජික

විගණකාධිපතිවරයාගේ නියෝජිතයෙකු හා ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා රැස්වීම් සඳහා සහභාගී වූහ. කමිටුවෙහි කළමනාකරණය නියෝජනය කරන සාමාජිකයින් කිසිවෙකු නොමැත.අධ්‍යක්ෂ ජනරාල්වරයා ආරාධනයෙන් රැස්වීම් සඳහා සහභාගී වේ. කළමනාකරණයේ අනෙකුත් සාමාජිකයින් හා කාර්යය මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින්ගේ සහභාගීත්වය කමිටුවට අවශ්‍ය වූ විට රැස්වීම් සඳහා සහභාගී වීමට ආරාධනා කරනු ලබයි.කමිටුවෙහි ගණපූර්ණය සාමාජිකයින් 03 කි.

## 6.2 කමිටුවෙහි කාර්යය භාරය

- ආකෘති සහ අන්තර්ගතය සමාලෝචනය කිරීම සහ පොල් සංවර්ධන අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශ සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රමයෙහි විශ්වසනීයත්වය අධීක්ෂණයට ලක් කිරීම.
- බාහිර සහ අභ්‍යන්තර විගණන කාර්යයෙහි විෂය මූලිකත්වය හා සඵලදායිත්වය සහතික කිරීම සඳහා යොදා ඇති ක්‍රියා මාර්ග නියාමනය හා සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර පාලනයන්හි යෝග්‍යතාව සහ සාර්ථකත්වය සමාලෝචනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- අභ්‍යන්තර විගණන වාර්තා, බාහිර විගණන විමසුම් හා ඒ සඳහා ගන්නා ලද පියවර සමාලෝචනය කිරීම.
- නියාමන සහ මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා සමඟ අනුගතවීම සහ අදාළ නියාමන අධිකාරීන් සමඟ පවත්නා සම්බන්ධතා සහතික කිරීම සඳහා වන ආචාර ධර්මානුකූල ප්‍රමිතීන් හා ක්‍රියා පරිපාටින් පිළිබඳ සමාලෝචනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

## 6.3 රැස්වීම් සහ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුල කමිටුව අටවරක්(08) හමුවන ලදී. රැස්වීම් සඳහා කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පහත සඳහන් පරිදි වේ.

| අධ්‍යක්ෂවරයාගේ නම | සහභාගී වූ ගණන |
|---|---|
| එස්.එම්.රාජපක්ෂ මහත්මිය | 08 |
| ජානක ධර්මකීර්ති මහතා<br>ඩී.එම්.එල්.බණ්ඩාරනායක මහතා | 03<br>03 |
| එල්.පී.කේ.ඩබ්.වැලිවත්ත මහතා | 08 |
| ආර්.පී. වීරමන් මහතා | 08 |
| විගණන අධිකාරී (ආරාධිත) | 07 |

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවන ලදී.

### 6.3.1 අභ්‍යන්තර විගණනය

- 2012 වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙහි සඵලදායීත්වය අධීක්ෂණයට ලක් කරන ලදී.
- අනාගතයේදී නැවත සිදුවීම් වළක්වනු පිණිස කාලීන නිරවද්‍ය කිරීමේ පියවරයන් ගැනීමේ අරමුණින් යුතුව විශේෂ අභ්‍යන්තර විගණන සොයා ගැනීම් හා ඒවා සඳහා කළමනාකරණයේ ප්‍රතිචාර සමාලෝචනයට ලක් කරන ලදී.
- 2012 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනයට ලක් කරන ලදී.

### 6.3.2 බාහිර විගණනය

- 2012.12.31වන දිනෙන් අවසන් වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරිය සම්බන්ධයෙන් විගණකාධිපති විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව, කළමනාකරණ ලිපිය, එයට අදාලව කළමනාකරණය විසින් දක්වන ලද ප්‍රතිචාර, සමාලෝචනයට ලක් කරන ලද අතර විශේෂයෙන් පෙන්වා දෙන ලද ගැටළු නැවත ඇතිවීම වළක්වනු පිණිස කළමනාකරණය විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව පසු විපරම් කරන ලදී.

### 6.3.3 මූල්‍ය වාර්තාකරණ

- වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණ හා නියාමන අධිකාරීය විසින් නියම කරන ලද අවශ්‍යතාවන්ට හා අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති බවට සහතික කිරිමේදී මණ්ඩලයට සහාය වන ලදී.

#### 6.3.4 රැස්වීම් වාර්තා/ මණ්ඩලයට වාර්තා කිරීම්

- කමිටු පැවැත්වීම් පිළිබඳ යෝග්‍ය රැස්වීම් වාර්තා මණ්ඩලීය ලේකම් කාර්යාලයෙහි පවත්වාගෙන යනු ලැබේ. රැස්වීම්වල සියළුම වාර්තා සභාගත කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලීයරැස්වීම්වලදී සම්මත කරගන්නා ලදුව කමිටුව විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතිය ලබාගනු ලැබේ.ක්‍රමික පදනමක් මත කැපී පෙනෙන කරුණු සම්බන්ධයෙන් පසු පියවරයන් ගනු ලැබේ.

විගණන හා කළමනාකරණ කමිටුවෙහි අදහස වනුයේ, ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයන් සඵලදායි අන්දමින් ක්‍රියාත්මක කරනු ලබන බව හා වත්කම් ප්‍රමාණවත් අන්දමින් ආරක්ෂා කරන බවයි. තවද අධිකාරියෙහි අනුගත රාමුවට සහ යෝග්‍ය අවස්ථාවන්හිදී ගන්නා ලද නිවැරදි කිරීමේ සහ වළක්වාලීමේ පියවරයන් සම්බන්ධයෙන් කමිටුව තෘප්තිමත් වේ.

2013 අප්‍රේල් 04 වන දින මෙම වාර්තාව විගණන හා කළමනාකරණ කමිටුව විසින් අනුමත කරන ලදී.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / துலைவா / My No: වයිඑස්/එෆ්/සීඩීඒ/එෆ්ඒ/2012

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date: 2013 අගෝස්තු 29 දින

සභාපති,
පොල් සංවර්ධන අධිකාරිය.

**පොල් සංවර්ධන අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

පොල් සංවර්ධන අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 43 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2013 මැයි 10 දින නිකුත් කරන ලදී.

## 1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>.

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමණාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.


අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට පොල් සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

ගනුදෙනුවල නියැදි පරීක්ෂාවන්හිදී අනාවරණය වූ රු.642,561 ක ගිණුම්කරණ අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. ඒ අනුව ගිණුම්වල එම අඩුපාඩු සම්බන්ධයෙන් ගැලපීම් කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන නැවත ඉදිරිපත් කරන ලදී. එහෙයින් නියැදියට පරිබාහිරව තවදුරටත් ගිණුම්කරණ අඩුපාඩු නොතිබේය යන්න බැහැර කළ නොහැකි විණි.

2.2.2 ලැබිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). අධිකාරිය විසින් 2006 වර්ෂයේදී ගොවිජන සමාගමක් වෙත රු. 2,000,000 ක ණය මුදලක් ලබාදී තිබුණු අතර ගිවිසුම ප්‍රකාරව ණය ප්‍රදානය කළ දින සිට මාස 6 ක් ඇතුළත දී පොලී රහිතව සමාන වාරිකවලින් ගෙවා නිමකළ යුතු වුවත්, අවස්ථා දෙකකදී රු.550,000ක් පමණක් ලැබී තිබුණි.

(ආ). අධිකාරියේ නිලධාරියෙකු අයථා ලෙස පරිහරණය කරන ලද මුදලක් වෙනුවෙන් 1998 වර්ෂයේ සිට අයකරගත යුතුව පවතින පොලිය ඇතුළත් රු 1,664,769 ක් වූ මුදල අයකර ගැනීමට නොහැකිව දිගින් දිගටම ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ). සීමාසහිත සමාගමකින් 1985 වර්ෂයේ සිට ලැබිය යුතු රු 26,715,037 ක ණය මුදලෙන් 2008 සිට 2012 වර්ෂ සඳහා අයවිය යුතු රු.මිලියන 20 ක් වූ පොලී මුදල් අයකර ගැනීමට නොහැකිව පොල් තෙල් මිල ස්ථායිකරණ අරමුදලේ ගිණුම්වල පෙන්වා තිබුණි. ඊට අමතරව පොලී රහිත ණය වශයෙන් 2004 වර්ෂයේ දී රු. මිලියන 31.55ක මුදලක් එම සමාගමට ලබාදී තිබුණු අතර මෙම ණය මුදල්ද අධිකාරියට අය නොවී පැවතුණි.

(ඈ). දියිදි පොල් මෝල් හිමියන්ගෙන් අය විය යුතු ගාස්තු සහ නැවුම් පොල් හා කොප්පරා පොල් වෙන්දේසි කටයුතු වෙනුවෙන් අය විය යුතු බිම් කුලී වූ රු. 3,321,715 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ඉ). අධිකාරියට අයත් කොටුව ආදිපාද වීදියේ පිහිටි ගොඩනැගිල්ල කුලියට දීමෙන් 2012 වර්ෂය වෙනුවෙන් වැවිලි සංස්ථාවකින් හා වැවිලි සමාගමකින් අයවිය යුතු රු 1,086,667 ක කුලී මුදල 2012 දෙසැම්බර් 30 දින වන විටත් අය කර ගෙන නොතිබුණි.

(ඊ). ණය ගැති ශේෂය තුළ වසර තුනකට වඩා පැරණි රු 180,485 ක වටිනාකමට ණයගැති ශේෂ පැවතුණි.

3. මූල්‍ය සමාලෝචනය
---------------------

3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 9.68 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.මිලියන 13.85 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 4.17 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. වර්ෂයේ සමස්ථ වියදම රු.මිලියන 41.92 කින් වැඩි වී තිබුණත් භාණ්ඩාගාර ප්‍රදාන හා අනෙකුත් ආදායම් පිළිවෙලින් රු.මිලියන 39.23 කින් හා රු. මිලියන 6.86 කින් වැඩි වී තිබීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි බලපා තිබුණි.

3.2 <u>විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය</u>

(අ). අධිකාරියේ මුළු ආදායම්වලින් සියයට 69 ක් භාණ්ඩාගාර ප්‍රදාන වලින්ද, සියයට 12 ක් පොලී ආදායමින්ද, සියයට 16 ක් මෙහෙයුම් ආදායමින්ද, හා සියයට 3ක් විවිධ ආදායම් වලින්ද සමන්විත වී තිබුණි.

(ආ). පොල් තෙල් මිල ස්ථායිකරණ අරමුදලෙන් සමාගමක් වෙත ලබාදෙන ලද ණය මුදලට අදාල රු.මිලියන 4 ක් වූ සමාලෝචිත වර්ෂයේ සම්පූර්ණ පොලී ආදායම මෙම වසර තුළදීද බොල් ණය වශයෙන් ප්‍රතිපාදනය කර තිබුණි.

(ඇ). අධිකාරියේ මුළු විවිධ ණයගැතියන් වූ රු. මිලියන 35 න් රු.මිලියන 20 ක් එනම් සියයට 57 ක් බොල් ණය වශයෙන් ප්‍රතිපාදනය කර තිබුණි.

4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 <u>කාර්යසාධනය</u>

4.1.1 <u>භෞතික හා මූල්‍ය කාර්ය සාධනය</u>

(අ). අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය යටතේ ක්‍රියාත්මක කරන ලද "පෞද්ගලික අංශය හා එක්ව විදේශ වෙළඳපල ප්‍රශස්ථ සොයා බැලීම" ව්‍යාපෘතිය සඳහා රු මිලියන 1.6 ක මූල්‍ය ප්‍රතිපාදන වැය කර තිබූ නමුත් 2012 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්ය සාධනය අවම මට්ටමක පැවතුණි.

(ආ). සැකසුම් සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). ව්‍යාපෘති 4 කට අදාල කාර්යසාධනය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ii). ව්‍යාපෘති තුනකට අදාලව භෞතික කාර්යසාධනය ලෙස එකම කාර්යක් වූ "නිපයුම් මධ්‍යස්ථාන සඳහා පෙට්ටි කුට්ටම් පහක් ඇණවුම් කිරීම" යන්න සඳහන් කර තිබුණි.

(iii). "පොල්තෙල්, කොහු හා කොහු ආශ්‍රිත කර්මාන්ත නවීකරණය හා ප්‍රමිතකරණය කිරීම" ව්‍යාපෘතියට අදාලව මූල්‍ය ප්‍රගතියක් සඳහන් නොකර භෞතික කාර්යසාධනය සියයට 56 ක් ලෙස සඳහන් කර තිබුණි.

4.1.2. <u>පාඩු පිට පවත්නා ව්‍යාපෘති</u>

අධිකාරිය යටතේ ක්‍රියාත්මක කරනු ලබන දුන්කන්නාව කොහු පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතිය 2010 , 2011 හා 2012 යන වර්ෂවල පිළිවලින් රු 2,670,717 රු 1,365,368 හා රු 4,683,757 ක් වශයෙන් අලාභ ලබා තිබුණි.

4.1.3. <u>පොල් තෙල් කර්මාන්තකරුවන් ලියාපදිංචි කිරීම</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2007 වර්ෂයේ පොල් සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ලංකාව තුළ සිදු කල සමීක්ෂණයකට අනුව පොල්තෙල් නිෂ්පාදන කර්මාන්තයෙහි යෙදෙන පොල් තෙල් මෝල් සංඛ්‍යාව 589 ලෙස හඳුනා ගෙන තිබුණි. නමුත් 2012 වර්ෂය අවසන් වන විට පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂිකව ලියාපදිංචි වී ඇති කර්මාන්තකරුවන් සංඛ්‍යාව 42 ක් පමණක් වී තිබුණි.

(ආ). ඉහත පරිදි පොල් තෙල් නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන්නන් වාර්ෂිකව අධිකාරියේ ලියාපදිංචි වී, ඔවුන් නිෂ්පාදනය කරණු ලබන පොල්තෙල්වල ගුණාත්වය හා ප්‍රමිතිය පරීක්ෂා කිරීමක් සිදු නොකරන බැවින් හා ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන සියළුම පොල්තෙල්වල ගුණාත්වය හා ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා පොදු පිළිවෙතක් නොමැති බැවින් වෙළඳපොල තුළ ගුණාත්වයෙන් හා ප්‍රමිතියෙන් අඩු පොල්තෙල් පැවැතිමේ අවදානමක් තිබුණි.

## 4.2. අක්‍රීය අරමුදල්

අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන දිසිදි පොල් මෝල් සංවර්ධන අරමුදලේ ශේෂය 2011 වර්ෂයේ රු.මිලියන 60 සිට 2012 වර්ෂය අවසානය වන විට රු.මිලියන 73.5 දක්වා වර්ධනය වී තිබුණත්, අරමුදලෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා නිසි පරිදි මෙම මුදල් නොයෙදවීම නිසා අරමුදලේ මුදල් අක්‍රියව පැවතුණි.

## 4.3. අරමුණට පටහැනි වියදම්

පොල් සංවර්ධන අධිකාරියේ සැකසුම් සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වන දුන්කන්නාව කොහු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ "කොහු හා කොහු නිමි භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයන්හි බලශක්ති ඉතිරිකිරීම් ඒකක පිහිටුවීම" ව්‍යාපෘතිය සඳහා 2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් ප්‍රාග්ධන වියදම් යටතේ රු.මිලියන 5 ක මුදලක් වෙන් කර තිබුණි. නමුත් මෙම මුළු මුදලම ව්‍යාපෘතියේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් වැය කර තිබුණු බැවින් ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් අරමුණට පටහැනිව ඒවා වියදම් කර තිබුණු බව නිරීක්ෂණය විය.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

අධිකාරියේ කාර්ය මණ්ඩලය පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු ප්‍රමාණය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 7 | 6 | 1 |
| තෘතියික | 9 | 3 | 6 |
| ද්විතියික | 58 | 40 | 18 |
| ප්‍රාථමික | 96 | 72 | 24 |
| **එකතුව** | 170 | 121 | 49 |

මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාළ වන තනතුරු 49 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩුව පැවතුණි.

## 05 පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ). අරමුදල් උපයෝජනය

(ආ). ලැබිය යුතු ගිණුම්

(ඇ). මානව සම්පත් කළමනාකරණය

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති